# සී/ස හලාවත වැවිලි සමාගම
# சிலாபம் பெருந்தோட்ட நிறுவனம்
# Chilaw Plantations Limited








# වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# Annual Report 2013

පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය
தெங்கு அபிவிருத்தி மற்றும் மக்கள் தோட்ட அபிவிருத்தி அமைச்சு
Ministry of Coconut Development & Janatha Estate Development

## අපගේ

# දැක්ම

**වඩාත් විද්‍යානුකූලව හා ලාභදායීව පාලනය කරනු ලබන**
**ශ්‍රී ලංකාවේ හොඳම පොල් ආශ්‍රිත වැවිලි සමාගම බවට පත්වීම.**

## අපගේ

# මෙහෙවර

පොල් වගාවේ සම්පත් හා වත්කම්
**විද්‍යාත්මකව සහ වානිජ්‍යමය ලෙස සංවර්ධනයෙන්**
තිරසාරවූ ඉහළ ලාභයක් සමගම විභව ඵලදාවක් සහ ඵලදායීතාවයක් ලැබීමට
කැපවීමෙන් කටයුතු කරන අපේ ප්‍රවීන කාර්ය මන්ඩලය දිරිමත්ව බල ගැන්වීමෙන්
**වත්මන් මෙන්ම අනාගත සියලු කොටස්කරුවන්ට වාසි අත්වන අන්දමින්**
ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යක් බවට පත්කිරීමේ මහඟු ජාතික ක්‍රියාවලියට දායකවෙමු.

# ආයතනික විස්තර

| | |
|---|---|
| සමාගමේ නාමය | සීමාසහිත හලාවත වැවිලිසමාගම |
| ප්‍රධාන කාර්යාලය | "කප්රුකසෙවන", අංක 165, පුත්තලම පාර, හලාවත, 61000 |
| කොළඹ කාර්යාලය | බිම් මහල, CDA ගොඩනැගිල්ල, අංක 11, ඩියුක්පාර, කොළඹ 01. |
| සංස්ථාපනය කළ දිනය | 1992 ජූනි 11 වැනි දින |
| සමාගම් ලියාපදිංචි අංකය | PB 703 (නව අංකය 2007 අංක 07 දරන නව සමාගම් පනත) |
| නෛතික තත්වය | 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ විධිවිධාන වලට අනුකූලව, 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ 1992 ජූනි 18 දින ගැසට් අංක 719/15 මගින් ස්ථාපනය කරන ලද පූර්ණ රජයට අයිති සමාගමකි.<br>පසුව 2007 අංක 7 දරණ නව සමාගම් පනතට අනුව PB 703 අංකය යටතේ යලි ලියාපදිංචි කරන ලදි. ජනතා වතු සංවර්ධන මණ්ඩලය JEDB (IV) ට අයත්ව තිබූ, පුත්තලම දිස්ත්‍රික්කයේ සියලුම වැවිලි වත්කම්, ගැසට් පත්‍රයට අනුකූලව, හලාවත වැවිලි සමාගම වෙත පවරන ලද අතර, පසුව වසර 53 ක කාලයක් සඳහා කල්බදු ගිවිසුම්, ජනවසම විසින් හලාවත වැවිලි සමාගම සමග අත්සන් කරන ලදි. |
| කොටස් හිමිකම් | සමාගමේ සියලු කොටස්වල අයිතිය (100%) එහි ස්වර්ණමය කොටස් සමග හිමිකරුවන ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ශ්‍රී ලංකා ජනරජයේ මහා භාණ්ඩාගාර ලේකම් විසින් උසුලනු ලබයි. |
| කොටස් ප්‍රාග්ධනය | විශේෂ වරප්‍රසාද සහිත ස්වර්ණමය කොටසද ඇතුලත්ව රුපියල් දහයේ (රු. 10/-) කොටස් 20,000,001 ක් මහාභාණ්ඩාගාරය සතුය. |
| වත්මන් අධ්‍යක්‍ෂක මණ්ඩලය | පණ්ඩුක ජයසිංහ මහතා - සභාපති/ප්‍රධාන විධායක නිළධාරී සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික<br>ඒ.එම්. චන්ද්‍රපාල මහතා - විධායක අධ්‍යක්ෂ සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික<br>ඔ.පී.පී. පතිරණගේ මහතා - ක්‍රියාකාරී අධ්‍යක්ෂ සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික<br>ප්‍රියංගනි ලියනගේ මහත්මිය - අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජික සහ මහා භාණ්ඩාගාර නියෝජිතවරිය<br>එස්. චන්ද්‍රා එස්. ප්‍රනාන්දු මහතා - අධ්‍යක්ෂමණ්ඩල සාමාජික<br>කේ.බී. රත්නායක මහතා - අධ්‍යක්ෂමණ්ඩල සාමාජික<br>ආර්.ආර්.එම්. අමරතුංග මහතා - අධ්‍යක්ෂමණ්ඩල සාමාජික<br>අයි.එම්.ආර්. විදානගමගේ මහතා - අධ්‍යක්ෂමණ්ඩල සාමාජික |
| 2013 සැප්තැම්බර් දක්වා අධ්‍යක්‍ෂක මණ්ඩලය | ආචාර්ය සුනිල් ජයසේකර මහතා - සභාපති/ප්‍රධාන විධායක නිලධාරී සහ අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජික<br>ඒ.එම්. චන්ද්‍රපාල මහතා - විධායක අධ්‍යක්ෂ සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික<br>කේ.ඒ. ශාන්ත ආර් ඩයස් මහතා - ක්‍රියාකාරී අධ්‍යක්ෂ සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික<br>ප්‍රියංගනි ලියනගේ මහත්මිය - අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජික සහ මහා භාණ්ඩාගාර නියෝජිතවරිය<br>එස්. චන්ද්‍රා එස්. ප්‍රනාන්දු මහතා - අධ්‍යක්ෂමණ්ඩල සාමාජික<br>අයි. එම්. ආර්. විදානගමගේ මහතා - අධ්‍යක්‍ෂමණ්ඩල සාමාජික<br>ඩී. ඒ. ඩී. රුවන් දනන්සූරිය මහතා - අධ්‍යක්‍ෂමණ්ඩල සාමාජික<br>එම්. එස්. එම්. සකාවුල්ලා මහතා - අධ්‍යක්‍ෂමණ්ඩල සාමාජික |
| බාහිර විගණකවරුන් | අයියර් සහ සමාගම<br>වරලත් ගණකාධිකාරීවරුන්,<br>හැව්ලොක් සෙන්ට්‍රල් ගොඩනැගිල්ල, 104 - 4/1, හැව්ලොක්පාර, කොළඹ 05. |
| බැංකු කරුවන් | ලංකා බැංකුව |
| සමාගම් ලේකම්වරුන් | කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් පුද්ගලික සමාගම<br>අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07. |

# මූල්‍ය තොරතුරු විශේෂ අවස්ථා

(2013 දෙසැම්බර් මස 31 වන දිනට)

| සාරාංශ ප්‍රතිඵල | 2013 රු.'000 | 2012 රු.'000 | වෙනස % |
|---|---|---|---|
| පොල් නිෂ්පාදනය (ගෙඩි) | 9,595,315 | 15,807,770 | (39%) |
| ශුද්ධ අලෙවි සාමාන්‍ය (ගෙඩියකට රුපියල්) | 29.92 | 21.26 | 41% |
| | | | |
| ආදායම | 287,152 | 339,051 | (15%) |
| දළ ලාභය | 112,890 | 123,733 | (9%) |
| පොලිය සහ බදු පෙර ලාභය | 108,989 | 111,209 | (3%) |
| බදුපෙර ලාභය | 81,820 | 86,225 | (6%) |
| බදුපසු ලාභය | 72,919 | 77,975 | (6%) |
| රඳවාගත් ලාභය | 625,542 | 587,623 | 6 |
| ගෙවූ ලාභාංශ | 35,000 | 75,000 | (53%) |
| මුළු ලාභාංශ (1992 සිට 2012) | 376,650 | 341,650 | 10% |

## මූල්‍ය තත්ත්වය

| | | | |
|---|---|---|---|
| ජංගම නොවන වත්කම් | 737,497 | 602,610 | 22% |
| මේරූ/නොමේරූ වගා | 502,826 | 410,033 | 23% |
| ජංගම වත්කම් | 356,230 | 454,231 | (21%) |
| තොග | 71,398 | 82,606 | (13%) |
| මුළු වත්කම් | 1,093,728 | 1,056,841 | 3% |
| ජංගම වගකීම් | 45,452 | 60,149 | (24%) |
| දීර්ඝ කාලීනව ගකීම් | 222,734 | 209,070 | 7% |
| කොටස් ප්‍රාග්ධනය | 200,000 | 200,000 | 0 |
| කොටස් කරුවන්ගේ අරමුදල් | 825,542 | 787,623 | 5% |

## මූල්‍ය දර්ශක

| | | | |
|---|---|---|---|
| ජංගම අනුපාතය (වාර) | 7.83 | 7.55 | 4% |
| ක්ෂණික අනුපාතය (වාර) | 6.26 | 6.18 | 1% |
| දළ ලාභ අනුපාතය% | 39.31 | 36.49 | 3% |
| කොටසක ඉපයීම් රු. | 3.69 | 3.90 | (6%) |
| ස්කන්ධයට ආපසු ලැබීම් (ROE) - % | 8.8 | 9.92 | (1%) |
| ප්‍රාග්ධන යෙදවීමට ආපසු ලැබීම් (ROCE) - % | 10.31 | 11.16 | |
| ජංගම වත්කම් වලට ජංගම වගකීම | 0.04 | 0.06 | (33%) |
| පොලී ආවරණ (වාර) | 3.98 | 4.45 | (10%) |

# සභාපතිතුමා/ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ පණිවිඩය

හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන්, 2013 වසර සඳහා වාර්ෂික වාර්තාව සමග විගණිත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳව සතුටට පත් වෙමි.

අප සමාගමේ වතු කොට්ඨාශ 88ක් ඇතත් එමගින් වතු කොට්ඨාශ 15ක් පමණක් තෙත් කළාපයේ ව්‍යාප්ත වී ඇත. අනෙකුත් සියළුම වතු කොට්ඨාශ හරි අඩක් බැගින් වියලි හා අතර මැදි තෙත් කළාපයන්ට මැදිව පිහිටා ඇත. මෙම පාරිසරික කළාපයන්හි දේශගුණික තත්වය මීට දශකයකට පමණ ආසන්න කාලයකදී පැවැති දේශගුණික රටාව කාලයත් සමග වෙනස් වෙමින් ප්‍රධාන බෝගය ලෙස පොල් වගා කරනු ලබන අප වැනි සමාගමට එය ඉතාමත් අහිතකර ලෙස බලපෑමක් එල්ලකරමින් පවතී. 2010 වර්ෂයේ සිට ලැබෙන වාර්ෂික හා මාසික වර්ෂාපතනය අයහපත් ලෙස පැහැදිලි වෙනසකින් අඩු වීමේ ප්‍රතිඵලයක් ලෙස අප සමාගමේ සමස්ථ වතු වල ඵලදායි පොල් ගස් ප්‍රමාණය 340,586 සිට 313,048 දක්වා පොල් ගස් ප්‍රමාණයක අඩුවක් පෙන්නුම් කරමින් පවතී. 2012 වසර තුලදී පමණක් පැවති නියගය තුලින් සියළුම වතු වල ඵලදරන හා අඩු වයස් පොල් පැළ 38,140 ක් විනාශයට පත් වන ලදී. මෙලෙස ඵලදායි ගස් ප්‍රමාණය අඩු වීමත් සමග සමාගමේ සමස්ථ පොල් සනත්වය අඩු වූ අතර ලබා ගනිමින් හා ඉදිරියට ඵල දැරීමට පැවති ගස්හි ඵලදාව මෙම ව්‍යසනය තුලින් අප හට අහිමි වන ලදී. එපමනක් නොව අඩු ජල ධාරිතාවක අවශෝෂණ ප්‍රතිවිපාක තුලින් බැට්ටා වැටීමක් විශාල වශයෙන් වතු තුල එම කාලපරිච්ඡේදය තුල දක්නට ලැබුනු අතර එමගින් ඉදිරි පොල් අස්වැන්න අඩු වීමට හා මූලික ආදායම අඩුවීමට අහිතකර ලෙස බලපාන ලදී. මෙම ප්‍රතිවිපාකයන්හි අවසන් ප්‍රතිඵලය ලෙස 2010 වර්ෂය තුලදී ලබාගත් මිලියන 18.26 පොල් ගෙඩි සංඛ්‍යාවට ට සාපේක්ෂව 2013 වර්ෂය අවසන් වන විටදී ලබාගන්නා ලද පොල් ගෙඩි සංඛ්‍යාව මිලියන 9.60 ක් දක්වා අඩු වීමක් පෙන්නුම් කරන ලදී. මෙම පාරිසරික බලපෑම් කෙසේ වුවත් අපගේ කාර්යක්ෂම හා විද්‍යාත්මක ඵලදායි කෘෂිකාර්මික පිලිවෙත් ක්‍රියාවට නැංවීම මගින් හා වතු නිලධාරීන්ගේ මනා කැපවීම තුලින් පාරිසරික අහිතකර බලපෑම් සඳහා අභියෝග කරමින් එහි තීව්‍රතාවය අවමකොට එය සමාගමේ ඉදිරි අභිවෘධිය උදෙසා යොදාගනිමින් පවතී. වතු වල ජල සංරක්ෂනය සඳහා කුඩා වැව් හා පතස් නැවත හැරීම සහ අලුතින් පතස් ඉදිකිරීම තුලින් භූ ගත ජල මට්ටම ඉහල නැංවීම, පොල් ගස් සඳහා ඉතා හොඳින් වසුන් යොදා මතු පිට ජල වාෂ්පීකරණය අවම කිරීම, පොල් ඉඩම් තුල පොල් ලෙලි ඡම්බො කාණු ලෙස වැලලීම තුලින් උප පාංශු ස්ථරයෙහි ජල මට්ටම ඒකාකාරව පවත්වා ගැනීම, සාමෝධානික වල් මර්ධන වැඩපිළිවෙල තුලින් ජල සංරක්ෂනය කිරීම හා පාශු පෝෂක ආරක්ෂා කිරීම හා ආන්තරික පොල් පොහොර නිර්දේශය ක්‍රියාත්මක කිරීම තුලින් සමබර පොහොර ප්‍රමාණයක් ගස් සඳහා යෙදීම හා පොහොර නාස්තිය අවම කිරීම, වැනි දෑ යහපත් කෘෂිකාර්මික පිලිවෙත් ලෙස අප ක්‍රියාවට නංවා ඇත.

තවද වතු මායිම් වැටවල් නිසි ලෙස නඩත්තු කිරීම තුලින් හා එම වැටවල් වතු නිලධාරීන්ගේ මනා අධීක්ෂණය තුලින් බාහිරින් ඇති වනු ලබන සොර සතුරු උවදුරු අවම කොට ඇති අතර වතු තුල ඇති කරනු ලබන කඩාකප්පල්කාරී ක්‍රියාද සම්පූර්ණ වශයෙන් තුරන් කිරීම සඳහා අවශ්‍ය සෑම පියවරක්ම ගැනිමට කටයුතු කර ඇත. විශේෂයෙන්ම ජනපද නිවාස ආශ්‍රිත සොරකම් සිදුවිය හැකි ප්‍රදේශ කෙරේ අවධානය යොමු කරමින් මෙන්ම දෛනික වැටෙන පොල් ගෙඩි සමාගමේ ක්ෂේත්‍ර සේවකයින් සියළු දෙනාගේම කැපවූ හා කාර්යක්ෂම ක්‍රියාදාමය තුලින් එකතුකර ගැනීම හා වතු කළමනාකරණය අධීක්ෂණයට ලක් කිරීම වඩා විධිමත් කිරීම තුලින් වර්ෂ අවසානයේ එහි ප්‍රතිලාභ අත්කර ගැනිමට අප සමාගමට හැකිවූ බව දන්වමි.

### නිෂ්පාදන විවිධාංගීකරණය

හලාවත වැවිලි සමාගම දීර්ඝ කාලයක් මුළුල්ලේ සිටම පොල් විකිණීමට හා උසස් ගුණාත්මයෙන් යුතු කොප්පරා නිෂ්පාදනයන් තුළින් වෙළඳ පලට පිවිසී සිටි අතර ඒ සඳහා 2013 වසර තුලදී නව අලෙවි භාණ්ඩ විවිධාංගීකරණය හඳුන්වාදීම මගින් හලාවත වැවිලි සමාගමෙහි සාම්ප්‍රදායික ගමන් මග වෙනස් මාර්ගයකට යොමු කරන ලදී. සමාගමෙහි කොප්පරා නිෂ්පාදනය විශාල වශයෙන් සිදුකරනු ලැබූ පළුගස්වැව වත්ත තුල දෛනිකව පොල් තෙල් ලීටර් 1,500 ක් පමණ නිපදවිය හැකි පොල් තෙල් නිෂ්පාදනාගාරයක් වර්ෂ අවසානය තුලදී ස්ථාපිත කරන ලද අතර එමගින් උසස් ගුණාත්මයෙන් යුතු පිරිසිදු පොල් තෙල් වෙළඳ පොලට යොමු කරීමෙන් පොල් සඳහා වැඩි වටිනාකමක් ලබා ගැනීම මූලික අරමුණ පෙරටුකොට ගනිමින් ශ්‍රී ලාංකික පාරිභෝගිකයින් සඳහා පිරිසිදු පොල් තෙල් ලබා දීමේ සමාජ මෙහෙවරටද අප යොමු වී ඇති බව ඉතා අභිමානයෙන් සිහිපත් කරමි.

එමෙන්ම සාම්පදායික ලෙලි කජු අලෙවි කිරමේ ක්‍රියාදාමයට නව අරුතක් එක් කරමින් ලෙලි කජු අලෙවි කිරීම සීමා කරමින් කජු පිරිසැකසුම් මධ්‍යස්ථානයක් පුත්තලම තම්බපණ්නි වත්ත තුල වර්ෂ අවසානයේදී ස්ථාපිත කරන ලදී. එමගින් කජු සඳහා වටිනාකමක් එක් කිරීමට ප්‍රයත්නය දැරූ අතර දෙබාන්ඩයේම නිමි භාණ්ඩ/ද්‍රව්‍ය අලෙවිය සඳහා හලාවත වැවිලි සමාගමේ ප්‍රධාන කාර්යාලීය පරිශ්‍රය තුල අලෙවි මධ්‍යස්ථානයක්ද පිහිටුවන ලදී. ඉහත දෑ වලට අමතරව පළුගස්වැව පිරිසිදු මී කිරි හා යෝගට් අලෙවිය තුලින් හා පොල් සමග අතුරු බෝග ව්‍යාප්තිය තුලින් අමතර ආදායම්ද මූලික අදායමට එක් කරමින් නිෂ්පාදන විවිධාංගීකරණය හරහා මූල්‍ය විවිධාංගීකරණයටද අප සමාගම දායක වී ඇත.

### ලාභය/මූල්‍ය කාර්යසාධනය

කෘෂිකාර්මික හා කෘෂිකාර්මික නොවන වතු යටිතල පහසුකම් සඳහා සහ නව ආයෝජන ව්‍යාපෘතීන් සඳහා මුදල් යෙදවීමෙන් අනතුරුව 2013 වර්ෂ අවසානයේදී බදු පසු ලාභය රුපියල් මිලියන 72.92 ක් විය. එය 2012 වසර තුලදී රුපියල් මිලියන 77.9 ක් වන ලදී. දීර්ඝ කාලීනව පැවති නියගය හේතුකොටගෙන පොල් අස්වැන්න පහල අගයක් ලෙස වාර්ථාවීම හේතුවෙන් 2012 වසර තුලදී රුපියල් මිලියන 339 ක් ලෙස ලබාගත් වාර්ෂික අලෙවි පිරිවැටුම 2013 වසර තුලදී රුපියල් මිලියන 287 ක් ලෙස සාපේක්ෂව අඩු වූ අතර 2012 වසර තුලදී රුපියල් මිලියන 215 ක් ලෙස දරන ලද අලෙවි පිරිවැය 2013 වසර අවසානයේදී රුපියල් මිලියන 174 ක් ලෙස අඩුවන ලදී. මෙම විචලනයන්ට හේතු පාදක වූයේ 2013 වසර තුලදී අවම පොල් අස්වැන්නක් වාර්ථා වීම සහ අයහපත් දේශගුණික රටාව පොල් පොහොර යෙදීමට අහිතකර බලපෑම තුලින් පොහොර සඳහා යොදන වාර්ෂික පිරිවැයෙන් හරි අඩකට වඩා මූල්‍ය ඉතිරියක් ඉතිරි වීමක් සදු වූ අතර නිසියාකාරව දීර්ඝ කාලයක් මුළුල්ලේ පැළ සනත්වයක් නොපවත්වාගිය සියළුම යටි වගාවන්හි එම අඩු පැළ නැවත සිටුවීම හා පෙර වගා නොකර තිබූ අක්කර 400 ට ආසන්න භූමි ප්‍රමාණයක් වගාවට සුදුසු මට්ටමට පත් කිරීම වැනි කාර්යයන් සඳහා වැඩි මූල්‍ය ආයෝජනයක් පෙර වර්ෂයන්ට වඩා ආයතනයේ ඉදිරි අභිවෘධිය උදෙසා වැය කරන ලදී. මෙහිදී අගය කළ යුතු කළමනාකරණ උපායක් වන ආයෝජන වලින් ඉහල ප්‍රතිලාභ සමග හිතකර හා තීරණාත්මක කෘෂිකාර්මික ක්‍රමවේද කෙරේ ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන ලදී. උක්ත සඳහන් සාධනීය වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙන් පසුව වුවද රුපියල් මිලියන 128.9 ක භාණ්ඩාගාර බිල්පත් හා කෙටි කාලීන තැන්පතු තුලින් සක්‍රීය/කාර්යක්ෂම මූල්‍ය කළමනාකාරිත්වයක් විද්‍යාමාන කරමින්

# සභාපතිතුමා/ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ පණිවිඩය

පොල් වලට අදාළ ප්‍රධාන ව්‍යාපාර වලට අනුගත වෙමින්, වත්කම් සංවර්ධන ව්‍යාපෘති මත පදනම් වූ ආයෝජන වලින් ඉහළ ප්‍රතිලාභ ක්‍රියාවට නංවන අතරතුර උපායක්‍රමික ආයතනික සැලැස්මේ සඳහන් කෘෂිකාර්මික හා වටිනාකම් එකතු කිරීමේ ව්‍යාපෘතිවල ආයෝජනය කිරීමට අප සමාගමට හැකි විය. තවද රාජ්‍ය සමාගමක් ලෙස හලාවත වැවිලි සමාගම 2012 වසර වෙනුවෙන් 2013 වසර තුළදී ලාභාංශ ලෙස රුපියල් මිලියන 35 ක් අධ්‍යක්ෂක මණ්ඩලයේ හා පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ අනුමැතියට යටත්ව මහා භාණ්ඩාගාරය වෙත ප්‍රධානය කරන ලදී.

## ජයග්‍රහනයන් හා දායකත්වයන්

හලාවත වැවිලි සමාගම 2013 වසර තුළදී පලමු වතාවට ජාතික කෘෂි ව්‍යාපාර සමුළුවේදී විශාල පරිමානයේ වැවිලි සමාගම් අතරින් ලෝකඩ පදක්කම ලබා ගැනීමට අප සමාගමට හැකි වූ අතර එය මහත් ආඩම්බරයෙන් මතක් කරනු ලබන අතර එය සමාගමේ සමස්ථ සේවක හා නිළධාරීන් සියළු දෙනාගේ මනා කැපවීම තුලින් ලබා ගත්තකි.

සමාගම විසින් දීර්ඝ කාලීන ප්‍රතිලාභ අපේක්ෂාවෙන් උසස් ගුණාත්මයෙන් යුතු පොල් පැළ නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා පළුගස්වැව වත්ත තුල අත් පරාගන වැඩසටහනක් 2011 වසර තුල සිට මේ දක්වා ආරම්භ කරනු ලැබූ අතර එහි පළමු පොල් පැළ නිකුත් කිරීම 2013 වසර තුළදී කරනු ලැබීය. එමෙන්ම බිංගිරිය කිණියම වත්ත තුලද පොල් පර්යේෂණ ආයතනය සමග එක්ව අක්කර 100 ක වපසරියකින් යුක්ත පොල් යටි වගාවක් වෙනම ආරම්භ කරනු ලැබූ අතර එමගින් ඉදිරි වසර පහකින් පමණ කප්රුවන යන උසස් ගුණාත්මයෙන් යුතු වැඩි දියුණු කරන ලද බීජ පොල් රටෙහි ඉදිරි අනාගතය වෙනුවෙන් නිෂ්පාදනය වනු ඇත.

එමෙන්ම 2013 වර්ෂ අගභාගයේදී වෙළඳ පොළ වාර්ථා වූ වැඩි පොල් මිල තුලනය සඳහා අමාත්‍යාංශයේ මග පෙන්වීම යටතේ කොළඹ හා හලාවත සති පොළ සඳහා නගර සභාවෙහි අනුග්‍රහය ඇතිව අඩු මිලට පොල් අලෙවිය හරහා අප ආදායම් උපයන රාජ්‍ය සමාගමක් ලෙස රටේ පාරිභෝගිකයින්ගේ අවශ්‍යතාවයන් සඳහා සහ ජාතික කර්තව්‍යට අපගේ දායකත්වය මනා ලෙස ඉටුකිරීමට දායකවන ලදී.

## අමාත්‍යාංශයේ දායකත්වය


පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ ගරු අමාත්‍ය ජගත් පුෂ්පකුමාර මැතිතුමාගේ මනා මග පෙන්වීම තුලින් හා ලේකම්තමාගේ ඇතුළු අනෙකුත් සියළුම නිලධාරීන්ගේ මනා අධීක්ෂණය තුලින් හලාවත වැවිලි සමාගම 2013 වර්ෂ අවසානය වන විට විවිධ ආයෝජනයන් සඳහා සහ නව වගාවන් සඳහා යොමු වුනු අතර එහි ප්‍රතිඵල ඉදිරි කාලය තුලදී බුක්ති විඳීමට හැකිවනු ඇතැයි අප කාගෙත් විශ්වාසය වනු ඇත. පොල් පැළ වගාව සීඝ්‍රව ව්‍යාප්ත කිරීම, නව වගාවන් ආරම්භ කිරීම, පොල් පැළ තවාන් වැඩි කිරීම හා අලෙවිය පුළුල් කිරීම සඳහා ගරු අමාත්‍ය ජගත් පුෂ්පකුමාර මැතිතුමා විසින් ලබාදුන්නා වූ ප්‍රතිපත්තිමය සහයෝගය සිහිපත් කරනුයේ ඉතාමත් සතුටකිනි.

## කළමනාකාරිත්වය සහ මානව සම්පත්

මානව සම්පත අප හලාවත වැවිලි සමාගමෙහි වටිනාම සම්පතක් ලෙස ආයනය හඳුනාගනිමින් දිරි ගැන්වීම් කරනු ලබන අතර මෙහිදී වතු වල සේවක කාර්ය මණ්ඩලය වැදගත් වෙමින් වැවිලි වත්කම් වටිනාකම් එකතු කරමින් ඉහළ නිෂ්පාදිතය, ඵලදායිතාවය, ආදායම හා ලාභය අත්පත් කර ගනිමින් සමාගමේ කොටස්කරුවන් හා උනන්දුවක් දක්වන්නන්හට වාසි අත් කර දේ. පොල් පර්යේෂණ ආයතනය හා වෙනත් සංවිධාන මගින් පුහුණුවීම් සමග අදාළ මානව ප්‍රවර්ධන වැඩසටහන් සිදු කරන අතරතුර කාර්යසාධන ඇගයුම් ක්‍රමවේදයට අනුකූලව කාර්ය මණ්ඩල සේවා හා දායකත්ව පිළිගැනුම හා දිරි දීමනා වැඩසටහන් අඛණ්ඩව සිදු කිරීම කළමනාකාරිත්වය විසින් ක්‍රමවත්ව සිදු කරනු ලැබේ.

## තුති පිදුම

සමාලෝචිත වර්ෂ අවසානය තුලදී සමාගම ලබාගත් මූල්‍ය හා භෞතික ප්‍රගතිය අගය කරන අතර එය සාක්ෂාත් කර ගැනීම සඳහා අවංකත්වයෙන් තම සේවය ලබාදුන් සියළුම වතු අධිකාරීවරුන්ට, සහකාර වතු අධිකාරීවරුන්ට, කාර්යාලීය සියළුම සේවක නිලධාරීවරුන්ටද තම ශ්‍රමය මනා කැපවීම තුලින් ආයතනය වෙනුවෙන් ලබාදුන් සියළුම වතු සේවකයින්ටද, හලාවත වැවිලි සමාගම රාජ්‍ය සමාගමක් ලෙස නැවත ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ප්‍රතිපත්තිමය තීරණය ගනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමාටද, වර්ෂ ආරම්භයේ සිට අවසානය දක්වාම නිසි මගපෙන්වීම තුලින් අමාත්‍යාංශයේ කප්රුක නවෝදාව සඳහා හලාවත වැවිලි සමාගම අනුගත කරනු ලැබූ පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ ගරු අමාත්‍ය ජගත් පුෂ්පකුමාර මැතිතුමාටද, නිතර අප හා සම්බන්ධ වූ අමාත්‍යාංශ ලේකම්තුමා ඇතුළු සියලුම නිලධාරීන්ටද, අවසාන වශයෙන් සමාගමේ උපායශීලී ආයතනික සැලැස්මට අනුව අපගේ සියලු උනන්දුවක් දක්වන්නන් හට බලාපොරොත්තු වූ ප්‍රතිඵල සමාලෝචිත වසර තුලදී ලගාකර ගැනීමට මා අප සමාගමේ සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී ලෙස මගපෙන්වීම, කැපවීම හා එකගතාවයෙන් මනා දිරිගැන්වීමක් සිදුකල අධ්‍යක්ෂක මණ්ඩල සියළු සහෘදයන් වෙත මාගේ හදපිරි කෘතවේදීත්වය දැක්වීමට මා මෙය අවස්ථාවක් කර ගනිමි.



(පණ්ඩුක ජයසිංහ)

සභාපති/ප්‍රධාන විධායක නිලධාරී

හලාවත වැවිලි සමාගම

# 2013 වසරේ විශේෂ සිදුවීම්

### පසුබිම

සීමාසහිත හලාවත වැවිලි සමාගම රජයේ පූර්ණ හිමිකාරත්වය ඇති ප්‍රාදේශීය වැවිලි සමාගමක් වශයෙන් සිය ප්‍රතිලාභය සඳහා ලාභ ඉපැයීමට අමතරව රාජ්‍ය ආර්ථික ප්‍රතිපත්තිය අනුව යමින් රටේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා ප්‍රධාන මෙහෙවරක් ඉටු කරයි.

පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ දර්ශනය හා මඟපෙන්වීම අනුව එහි 2011 - 2016 ජාතික පොල් අංශය සංවර්ධන සැලසුම මගින් 2016 වසර අවසානය වන විට තිරසර පොල් නිෂ්පාදනය ගෙඩි මිලියන 3650ක් දක්වා වැඩි කර ගැනීමට අවශ්‍ය බහුවිධ මාන ප්‍රවේශයක් කෙරෙහි ඉලක්ක කර ඇති අතර දේශීය ආහාර භාවිතය සඳහාද කර්මාන්ත නිෂ්පාදන යෙදවුම සඳහා ඇති ඉල්ලුම සපුරාලීමට මෙය ප්‍රමාණවත් වනු ඇත.

### මෙහෙවර සහ කාර්යය

රටේ පොල් වගාව සහ පොල් කර්මාන්තය නැවත නඟා සිටුවීමට කැපවීමේ සිය අපේක්ෂාවන් පෙරදැරි කර ගත් විෂය භාර කැබිනට් අමාත්‍යවරයා වශයෙන් ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මැතිතුමා 2011 වසරේ සිට මේ දක්වා ජාතික පොල් අංශය සංවර්ධන සැලසුමේ ඉලක්ක අටක අත් කර ගෙන ඇති නියත ප්‍රතිඵල හේතුවෙන් ඉතා සුභවාදී ආකල්පයකින් කටයුතු කරයි. සීමාසහිත හලාවත වැවිලි සමාගම මෙතෙක් කල් අත් කර ගෙන ඇති ජයග්‍රහණ ද ඔහුගේ උත්සාහයේ ප්‍රතිඵලයන්හි කොටසකි.

ජාතික සැලැස්ම මත පාදක වූ සීමාසහිත හලාවත වැවිලි සමාගමේ 2013 - 2014 සංයුක්ත සැලැස්ම අදාළ කාලපරිච්ඡේදය ඇතුලත සමාගමේ මෙහෙවර හා කාර්යයන් විදහා දක්වයි. සංයුක්ත සැලැස්මෙන් උකහා ගත් 2013 ක්‍රමෝපායන සැලැසුම තුළින් එක් පොල් ගසකින් ලබා ගත හැකි ඉහළම අස්වැන්න ලබා ගැනීමට දිරිමත් කරයි.

සමාගමේ සංවර්ධන දර්ශනය පිළිබඳව සැලකීමේ දී 2013 ක්‍රියාකාරී සැලැස්ම අනුව අපේක්ෂිත ඉලක්ක අත්කර ගැනීම වෙනුවෙන් සැලසුම්, ඉලක්ක සහ ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපායන පිළිබඳ පැහැදිලි සැලැස්මක් විය.

2013 වර්ෂය දෙආකාර අභියෝග සමග ආරම්භ විය.

සංයුක්ත සැලැස්මේ නිශ්චිත සැලැස්මක් ලෙස දක්වා ඇති සංකල්පිත හා ප්‍රත්‍යක්ෂ වෙනස්කම් මගින් පැන නගින නව අපේක්ෂාවන්වලින් දක්වනු ලබන කාර්යය වැඩසටහන අත්කර ගැනීම එක් අභියෝගයක් විය. වර්ෂය පුරා අඛණ්ඩව පැවති කඩින් කඩ ඇති වන වර්ෂාවෙන් සහ දීර්ඝ කාලයක් පැවති නියගයෙන් උද්ගත වන තත්ත්වයන් මඟහරවා ගන්නේ කෙසේදැයි යන්න දෙවැනි බරපතල අවදානම විය.

කළමනාකරණ පද්ධතිය, වතු සංවර්ධන ක්‍රමෝපායන, වටිනාකම එකතු කළ නිපැයුම් නිෂ්පාදය යන ක්ෂේත්‍රවල සිදු වූ ප්‍රධාන සංකල්පනික වෙනස්කම් සහ ක්‍රියාකාරකම් සම්බන්ධව ගත් කළ අනුරූප කාලපරිච්ජේදය අතරතුර වූ ප්‍රධාන ඉලක්ක සහ ජයග්‍රහණ පහත දැක්වේ.

### I. සීමාසහිත හලාවත වැවිලි සමාගමේ කළමනාකරණ පද්ධතිය

සීමාසහිත හලාවත වැවිලි සමාගමේ අනුමත සේවක මණ්ඩලය බඳවා ගැනීම සඳහා නව තනතුරු, රැකියා විස්තර සහ ආයතනය තුළ සහ ආයතන පද්ධතිය තුළ ආයතනික සැලසුම් සඳහා ප්‍රතිව්‍යුහගත වෙනස්කම් සිදු කරන ලදී. ඒ අනුව අලෙවිකරණ සංවර්ධනය, සැලසුම්කරණය සහ පසුවපරීක්ෂණය, සැලසුම්කරණ හා අධීක්ෂණ කාර්යය සඳහා පොල් වැවිලි කළමනාකරණ ජාල අධීක්ෂණ පද්ධතිය සහ තර්ජන පිළිබඳ තීරණ ගැනීම සහ කළමනාකරණය ආදිය ප්‍රත්‍යක්ෂ නිමැවුම් සමග වර්ෂය පුරා හඳුන්වා දුන් සහ ඇති කරන ලද නව ක්ෂේත්‍ර විය. සමාගමේ ව්‍යාපාර පරිසරයේ වෙනස්වන තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් බඳවා ගැනීමේ වැඩසටහනෙහි විධිවිධාන යටතේ මෙය සිදු කරන ලදී. මේ අනුව කොළඹ නගර කාර්යාලයේ එක් එක් කළමනාකරුවන් දෙදෙනෙකුගේ අධීක්ෂණය යටතේ

1) අලෙවිකරණ සංවර්ධනය සහ ප්‍රවර්ධනය

2) සැලසුම්කරණය සහ අධීක්ෂණය

ලෙස අංශ දෙකක් පිහිටුවන ලදී.

මෙම අංශ දෙකේ කටයුතුවල සුමට ක්‍රියාකාරීත්වය සඳහා ඒවා හලාවත පිහිටි ප්‍රධාන කාර්යාලයේ සේවය කරන සේවක මණ්ඩලය සමග ඍජු සම්බන්ධතා ඇතිව අන්‍යොන්‍ය වශයෙන් කටයුතු කරයි.

# 2013 වසරේ විශේෂ සිදුවීම්

## II. අමු ද්‍රව්‍යවල සිට වටිනාකම එකතු කළ නිෂ්පාදන වෙත මාරුවීම

පශු සම්පත, අතුරුබෝග, වටිනා දැව සහ අනෙකුත් විවිධ නිෂ්පාදනවලට අමතරව පොල් සහ කජු සීමාසහිත හලාවත වැවිලි සමාගමේ ප්‍රධාන නිෂ්පාදන වේ. එම මූලික නිෂ්පාදන අතරමැදියන් හෝ නිෂ්පාදකයින් හරහා වෙළඳපොළේ ඇති මිල ගණන් අනුව විකිණීම සීමාසහිත හලාවත වැවිලි සමාගමේ ව්‍යාවහාරය විය.

අමු ද්‍රව්‍ය නිෂ්පාදනයේ සිට වටිනාකම එකතු කළ නිෂ්පාදන වෙත මාරුවීම දක්වා වූ නව ප්‍රතිපත්ති වෙනස්කමක් හඳුන්වා දීමට 2012 වර්ෂයේ දී දමන ලද අත්තිවාරම අඛණ්ඩව ඉදිරියට ගෙන යමින් එම ආර්ථික ව්‍යාපාර සඳහා පහසුකම් සැලසීමට වර්ෂය තුළ දී යටිතලපහසුකම් සම්පූර්ණ කරන ලදී.

ඒ අනුව සීමාසහිත හලාවත වැවිලි සමාගමට වසර අවසානයේ දී පොල් තෙල් මෝලක් සහ කජු පිරිසැකසුම් මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමේ කාර්යය සඳහා ගොඩනැගිලි ඉදිකිරීමට, යන්ත්‍රසූත්‍ර මිල දී ගැනීමට සහ කාර්ය මණ්ඩලය පුහුණු කිරීමට හැකිවිය.

එහි ප්‍රධාන නිෂ්පාදන සඳහා තරඟකාරී වෙළඳපොළක් තුළ ඉහළම මට්ටමේ ආදායමක් අපේක්ෂා කරන අතරතුර

- පලුගස්වැව ප්‍රදේශයේ වතු යායේ පිහිටි පොල් තෙල් මෝල ආරම්භ කිරීම
- තම්බපන්නි ප්‍රදේශයේ වතු යායේ පිහිටි කජු පිරිසැකසුම් මධ්‍යස්ථානය ආරම්භ කිරීම
- සීමාසහිත හලාවත වැවිලි සමාගමේ නිෂ්පාදන අලෙවි කිරීම සඳහා අලෙවිසැලක් (සල් පිල) විවෘත කිරීම

මෙම ආයතන ගරු ජගත් පුෂ්පකුමාර අමාත්‍යතුමාගේත් ගරු ඇන්තනී වික්ටර් පෙරේරා නියෝජ්‍ය අමාත්‍යතුමාගේත් එම ප්‍රදේශයේ අනෙකුත් අමාත්‍යවරු, නියෝජ්‍ය අමාත්‍යවරු සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ සහභාගීත්වයෙන් 2013 දෙසැම්බර් මස 19 වැනි දින විවෘත කරන ලදී.

## III. වෙළදෙපොළට නව වෙළඳ නාම හඳුන්වාදීම




සීමාසහිත හලාවත වැවිලි සමාගම පොල් තෙල් මෝලක් සහ කජු පිරිසැකසුම් මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමෙන් පසුව "කප්රුක පොල් තෙල්" සහ "තම්බපණ්ණි පිරිසැකසුම් කළ කජු" යන නාම යටතේ වෙළඳ නාම දෙකක් සහ සමාගම් නිෂ්පාදන දෙකක් තරඟකාරී මිලකින් සහ ගුණාත්මකභාවයකින් වෙළඳපොළට හඳුන්වා දෙන ලදී.

හලාවත විවෘත කළ "සල්පිල" නව වෙළඳසැල පාරිභෝගිකයින්ගේ ප්‍රතිලාභය සඳහා සීමාසහිත හලාවත වැවිලි සමාගමේ නිෂ්පාදන අලෙවි කිරීමේ කටයුතු සඳහා පමණක් ක්‍රියාත්මක වේ.

## IV. තිරසර නිෂ්පාදනයක් පවත්වා ගෙන යාම සඳහා වැවිලි පුනරුත්ථාපනය

සීමාසහිත හලාවත වැවිලි සමාගමට අයත් සමස්ථ පොල් ගස්වලින් තුනෙන් එකකටත් වැඩි ප්‍රමාණයක් වසර හැටකට වඩා වයස ගස් බවටත් පොහොර සහ අස්වැන්න අඩු මට්ටමක හෝ කිසිදු අස්වැන්නක් නොමැති බවට ඇස්තමේන්තු කර ඇත. රජය මඟින් සමාගම යළි පවරා ගැනීමට පෙර පෞද්ගලික හිමිකාරත්වය යටතේ යටි වගාවට සහ නව වගාවට කිසිදු කැපී පෙනෙන උත්සාහයක් ගෙන නොතිබුනු බවට පෙනී ගියේය. රජයේ හිමිකාරත්වය යටතේ සමස්තයක් වශයෙන් හෙක්ටෙයාර 920ක් (යටි වගාව සහ නව වගාව) එකතු කරන ලදී.

පොල් ගස්වලින් යම් කාල පරතරයක් ඇතිව අස්වැන්න ලබා ගත හැකි බැවින් සහ තවත් කාලයක් යන තුරු ගෙඩි එල දරන බැවින් එම ගස් වයස්ගත වූව ද කෙටි කාලීන වගාවක් මෙන් ගලවා ඉවත් කළ නොහැකිය. එබැවින් ආදායමට සිදු වන ක්ෂණික අලාභයකින් තොරව මෙම කටයුත්ත සැලසුම් කළ වැඩසටහනක් හරහා සිදු කළ යුතුය.

විවිධ හේතු පාදකව සමස්ත පොල් වගාවෙන් අහිමි වන ගස් සංඛ්‍යාව දිනෙන් දින ඉහළයාමේ නැඹුරුවක් ඇති බවට පෙනී ගොස් ඇත. සෑම විටම මේ තත්ත්වය සිදු වන්නේ ගස් වයස්ගත වීම සහ ස්වභාවික කරුණු මුල් කර ගෙනය. අලුත් පොල් ගසක ගෙඩි දැරීමට අවම වශයෙන් වසර දහයක් වත් ගත වන බැවින් අහිමි වන පොල් ගස් නැවත ලබා ගැනීමට සහ යම් කාලපරිච්ඡේදයක් තුළ වගාවේ තිරසර පැවැත්ම පවත්වා ගෙන යාමට උපකාරී වන සැලසුම්සහගත ආදේශන සැලැස්මක් සහ නව වගා කිරීමේ වැඩසටහනක් මඟින් මෙම තත්ත්වය අවම කිරීමට පසු

# 2013 වසරේ විශේෂ සිදුවීම්

ගිය කාලය තුළ උත්සාහයක් ගෙන නැත.

පසු ගිය කාලය තුළ ප්‍රදේශය තුළ අඛණ්ඩව පැවති අහිතකර කාලගුණය මෙම තත්ත්වය තවදුරටත් උග්‍ර කර ඇත.

සැලසුම්ගත ආකාරයෙන් පුනරුත්ථාපනය අවශ්‍ය වගාවන් සම්බන්ධව නැවත වගාව සහ නව වැවිලි සඳහා මූලාරම්භක පියවර ගැනීම මගින් මෙම තත්ත්වය නිවැරදි කර ගැනීමට 2013 වසර තුළ දී වැඩි අවධානයක් යොමු කර ඇත.

මෙම මෙහෙයුම ක්‍රියාත්මක වන අතර සංයුක්ත සැලැස්ම සහ ඉන්පසු සකස් කළ ක්‍රියාකාරී සැලැස්ම තුළ දාම කටයුත්තක් ලෙස අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ඇත.

## V. ශ්‍රම හිඟකමට එරෙහිව යාන්ත්‍රීකරණය

සමාජය තුළ මෑත කාලීනව සිදු වූ සමාජ-ආර්ථික වෙනස්කම්වල බලපෑම නව පරපුර වැවිලි කර්මාන්තය තුළ සාම්ප්‍රදායක වැඩ පරිසරයෙන් දුරස් කර ඇත. දිනෙන් දින ඉහළ යන නිෂ්පාදන පිරිවැය සහ හීන වන ලාභය හේතුවෙන් මෙම කර්මාන්තය නවීකරණය සහ යාන්ත්‍රීකරණය සඳහා යම් තාක් දුරට හෝ තරුණ පරපුරේ ආකර්ෂණය ඇති කර ගැනීමට වැය කළ යුතු ඉහළ පිරිවැය ආයෝජනය ආයෝජකයින් අධෛර්යමත් කරයි.

සීමාසහිත හලාවත වැවිලි සමාගම වඩාත් මධ්‍යස්ථ විසඳුමක් අනුගමනය කළ අතර රැකියා නියුක්තිය අවසන් කිරීමට හේතු නොවන මට්ටමක් තෙක් පමණක් යන්ත්‍ර සූත්‍ර සඳහා ආයෝජනය කරන ලදී. ශ්‍රමය පිටින් ලබා ගැනීම වෙනුවට අහිමි වූ කම්කරුවන්ගේ ශ්‍රමයට හිලව් වන පරිදි භූමිය සකස් කිරීමේ, බර ඇදීමේ සහ ප්‍රවාහනයේ කාර්යයන් සඳහා ට්‍රැක්ටර් රථ පහක් සහ ඒවායේ උපාංග මිල දී ගැනීමට කළමනාකාරීත්වය තීරණය කරන ලදී.

සීමාසහිත හලාවත වැවිලි සමාගම (1) ආයතනය වඩාත් කාර්යක්ෂම කරවීම සහ (2) නිෂ්පාදන පිරිවැය අඩු කිරීමට යන කරුණු දෙක සඳහා මෙම පරිවර්තනය අඛණ්ඩව සිදු කර ගෙන යාමට අපේක්ෂා කරයි.

## VI. පොල් වැවිලි කළමනාකරණය සහ අධීක්ෂණ පද්ධතිය

අමාත්‍යාංශය මගින් එම වැවිලි අංශයේ දත්ත අන්තර්ජාලය ඔස්සේ එක්රැස් කිරීම සඳහා පළමු වරට හඳුන්වා දුන් පොල් වැවිලි කළමනාකරණ අධීක්ෂණ පද්ධතිය විවිධ මූලාශ්‍රවලින් දත්ත එක්රැස් කරන විට සිදු වන විෂමතාවන් නැති කිරීමට යොදා ගන්නා නව යාන්ත්‍රණයක් වේ.

අනුරූප වර්ෂය තුළ සීමාසහිත හලාවත වැවිලි සමාගම අන්තර්ජාලය ඔස්සේ දත්ත එවේලෙහිම සහ එතැනදීම එක්රැස් කිරීමට පමණක් නොව වැටෙන ගෙඩි සොරකම් කිරීම මෙන්ම දෛනික පැමිණීම් අයුතු ප්‍රයෝජනයට ගැනීම අවම කිරීමට ද මෙම පහසුකම යොදා ගන්නා ලදී.

දෛනිකව සේවයේ යොදවන සේවකයින් සංඛ්‍යාව සටහන් කර අන්තර්ජාල අධීක්ෂණ පද්ධතිය හරහා වාර්තා කිරීම තුළින් ශ්‍රම උපයෝජනය සහ ඔවුන්ගේ දෛනික කාර්යසාධනය අධීක්ෂණය කිරීමට ඉතා කාර්යක්ෂම ආකාරයකින් දායක වී ඇත.

අධීක්ෂණ පද්ධතිය හරහා මතුවන තොරතුරුවල ප්‍රතිඵලයක් ලෙස ඇතැම් වතුවල සිදු වන සොරකම් වැනි අවස්ථා වාර්තා කර ඒවාට පිළියම් යෙදීමට හැකි වී ඇත.

## VII. දුරස්ථ පාර්ශවකරුවන් හමුවීමට වීඩියෝ සම්මන්ත්‍රණ ක්‍රමය යොදා ගැනීම

ප්‍රවාහන පිරිවැය, සේවා ස්ථානයෙන් තාවකාලිකව බැහැරගොස් සිටීම සහ ගමන් කිරීමට කාලය නාස්ති කිරීම ආදිය අඩු කර ගැනීම සඳහා දුර බැහැර ප්‍රදේශවල සිටි පාකශවකරුවන් සමඟ සාකච්ඡා පැවැත්වීම සඳහා පොල් වැවිලි කළමනාකරණ පද්ධතියේ කොටසක් ලෙස වීඩියෝ සම්මන්ත්‍රණය හඳුන්වා දෙන ලදී.

සීමාසහිත හලාවත වැවිලි සමාගම ආයතනයේ ප්‍රතිලාභය සඳහා සහ ප්‍රධාන කාර්යාලයේ කාර්ය මණ්ඩලය සමඟ නිරන්තර සාකච්ඡා පැවැත්වීමට භාවිතා කිරීම සඳහා ද සාකච්ඡා

වලදී මෙන්ම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී ද අදාළ නිලධාරීන්ගෙන් යම් යම් කරුණු පැහැදිලි කර ගැනීමට සහ විචාරණ ලබා ගැනීමට ද මෙම පහසුකම භාවිතා කළ රේඛීය අමාත්‍යාංශය යටතේ පිහිටි පොකුරු ආයතනවලින් එකක් විය.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා මෙම භාවිතය තුළින් දිනකට රු. 13,000/-ක මූල්‍ය ඉතිරියක් කර ගත හැකි වන බවට ඇස්තමේන්තු කර ඇත.

# 2013 වසරේ විශේෂ සිදුවීම්

## VIII. පශු සම්පත් සංවර්ධනය

2012 වසරේ දී පලුගස්වැව පශු සම්පත් කොට්ඨාශයට හඳුන්වා දුන් වෙනස්කම් අඛණ්ඩව ඉදිරියට ගෙන යමින් 2013 වසරේ දී නිෂ්පාදනය සහ ඵලදායීත්වය වැඩිදියුණු කිරීම උදෙසා එම කොට්ඨාශයේ සිටින මුරා මී ගවයින් රංචුව වැඩි කර ගැනීමට නව සංවර්ධන වැඩසටහනක් හඳුන්වා දෙන ලදී.

පිරිමි සතුන් රංචුවෙන් ඈත කර තැබීම හා ගොවිපොලට අලුතින් හඳුන්වා දුන් පට්ටි හරක් තෝරා ගත් එළදෙනුන් සමග මුහු කිරීම සහ පේරාදෙණිය පශු වෛද්‍ය සේවා දෙපාර්තමේන්තුව සමග එක්ව පැවැත්වූ කෘතීම සිංචන වැඩසටහන මෙම වෙනස්කමේ ප්‍රධාන ලක්ෂණ විය.

සතුන්ගේ ඵලදායීත්වය වර්ධනය කිරීම, තරුණ සතුන් දෙමුහුන් කිරීම වැඩි කිරීම සහ කිරි නිෂ්පාදය ඉහළ නැංවීම මෙම වැඩසටහන යටතේ විශේෂ සැලකිල්ලක් යොමු කළ කරුණු විය.

වර්ෂය තුළ සිදු වන ගර්භණී අනුපාතිකය වැඩිවීම, අලුත් සතුන් බිහිවීම ඉහළයාම සහ කිරි නිෂ්පාදනය වැඩිවීම යන ප්‍රතිඵල මෙම වැඩසටහනේ සාර්ථකත්වයක් වේ.

මෙම යෙදවුම් 2013 වර්ෂය තුළ පශු සම්පත් ව්‍යාපෘතියේ ලාභය 2012 වසරේ දී එම අගය වූ රු. 40,754 සිට රු. 5,223,294ක් දක්වා ඉහළ නංවා ඇත.

කෙසේවුව ද වසර තුළ පැවති අනපේක්ෂිත නියගය නොතිබුනේ නම් සීමාසහිත හලාවත වැවිලි සමාගමට සැලසුම් කළ පරිදි වඩාත් වැඩි ප්‍රතිලාභ අත්කර ගැනීමට හැකියාවක් විය.

### ජෛව- වායුව නිෂ්පාදනය

ජෛව-වායුව පලුගස්වැව ප්‍රදේශයේ වතුයායේ ගව පට්ටියේ අතුරු නිෂ්පාදනයක් වේ. නිෂ්පාදනය කළ සමස්ත වායු ප්‍රමාණය මුදවාපු කිරි සහ යෝගට් සකස් කිරීමට අවශ්‍ය කිරි රත් කිරීම සඳහා අවශ්‍ය ඉන්ධනයක් ලෙස භාවිතා කරන ලදී.

පොල් තෙල් මෝල තාපය උත්පාදනය සඳහා වායුව භාවිතා කරන බැවින් වාණිජ වායුව වෙනුවට මෙම වායුව භාවිතා කිරීම තුළින් නිෂ්පාදන පිරිවැය අඩු කිරීමට තෙල් මොලේ අවශ්‍යතාව සඳහා කිරි පට්ටියේ තිබෙන වායු කම්හල් පහසුකම වෙනස් කර ඇත.

### පුන්නක්කු නිෂ්පාදනය

පුන්නක්කු පොල් තෙල් මොලේ පොල් තෙල් නිෂපාදනය අවසානයේ ලැබෙන අවශේෂ කොටසක් වන අතර විශේෂයෙන්ම කිරි දෙන එළදෙනුන්ගේ කිරි නිෂ්පාදනය වැඩි කිරීම සඳහා ගව ආහාරයක් ලෙස භාවිතා කරයි. පොල් තෙල් මෝල ආරම්භ කරන තෙක් පලුගස්වැව කිරි පට්ටිය මෙම අවශ්‍යතාව විවෘත වෙළඳපොලෙන් මිල දී ගෙන තිබුනි. 2013 දෙසැම්බර් මස වන අවසන් වූ මෝලේ පරීක්ෂා කිරීමේ කාල පරිච්ඡේදය තෙක් වතුයායට තෙල් මෝලේ පුන්නක්කු භාවිතා කිරීම තුළින් රු. 241,220.00ක මුදලක් ඉතිරි කර ගැනීමට හැකිවී ඇත.

## IX. මානව සම්පත් සංවර්ධනය

කණිෂ්ඨ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම්වල ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයේ ප්‍රතිලාභය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ මාර්ගෝපදේශ අනුව සකස් කළ සේවාස්ථ පුහුණු වැඩසටහන්වලට අමතරව ක්ෂේත්‍ර අධීක්ෂකයින් හත් දෙනෙක්ගේ හැකියාවන් වැඩිදියුණු කිරීමෙන් ඔවුන් ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්ගේ අධීක්ෂණය යටතේ න්‍යායාත්මක මෙන්ම විද්‍යාත්මක දැනුම සහ අවස්ථානුගත ප්‍රායෝගික භාවිතයන් සමග වැඩබලන නිලධාරී තනතුරුවලට උසස් කිරීම වෙනුවෙන් මාස හයක කාලසීමාවක් සඳහා වූ ගෘහස්ථ සහ එළිමහන් පුහුණු වැඩසටහනක් සකස් කරන ලදී.

## X. සම්මාන

සීමාසහිත හලාවත වැවිලි සමාගම 2013 වසරේ විශාල නිෂ්පාදන වැවිලි සඳහා වූ "ජාතික කෘෂි-ව්‍යාපාර සම්මානය - 2013 -ලෝකඩ" සම්මානයෙන් පිදුම් ලැබීය.

දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනයේ දී පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රදර්ශන කුටිය හොඳම ප්‍රදර්ශන කුටි තරගයෙන් පළමු ස්ථානය දිනා ගැනීමත් සමග සීමාසහිත හලාවත වැවිලි සමාගම ද එම ජයග්‍රහණයේ එක් පාර්ශ්වයක් බවට

# අධ්‍යක්ෂ මණ්ඩලය (2013)

01. පණ්ඩුක ජයසිංහ මහතා — සභාපති/ප්‍රධාන විධායක නිලධාරි සහ අධ්‍යක්ෂමණ්ඩල සාමාජික
නො. 27, 1 වනපටුමග, කොටුබැම්මපාර, ඇතුල්කොට්ටේ. 071 6884082

02. ඒ. එම්. චන්ද්‍රපාල මහතා — අධ්‍යක්ෂමණ්ඩල සාමාජික සහ විධායක අධ්‍යක්ෂ
පළාත්සභා, පළාත්පාලන අමාත්‍යාංශයේ හිටපුලේකම්, විශ්‍රාමලත් SLAS විශේෂ පංති නිලධාරි
165/1A, දුටුගැමුණුවීදිය, කොහුවල. 077 3321551

03. ඔ.පි.පි. පතිරණගේමහතා — අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සහ ක්‍රියාකාරි අධ්‍යක්ෂ
වලාකඩවත්ත, උල්විටිකේ, ගාල්ල 077 7903922

04. ප්‍රියංගනි ලියනගේමහත්මිය — අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සහ මහාභාණ්ඩාගාර නියෝජිතවරිය
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිණී PED,මහාභාණ්ඩාගාරය 0777 898 8411

05. චන්ද්‍රා ප්‍රනාන්දු මහතා — අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
විශ්‍රාමලත් පොලිස්පති (IGP), අතිගරු ජනාධිපතිතුමාගේ ජ්‍යෙෂ්ඨ උපදේශක
අංක 3, ෂර්බර් උද්‍යානය, කොළඹ 04. 011 2580561 / 011 2553321

06. අයි.එම්.ආර්. විදානගමගේ මහතා — අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
'තරිඳු', බුද්ධියගම, වීරකැටිය. 077 3088478

07. කේ.බි. රත්නායක මහතා — අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
නො. 22, දික්යාය, බුත්තල. 072 2229160

08. ආර්.ආර්.එම්. අමරතුංග මහතා — අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
නො.7/44, පාසැල්මාවත, ගංගොඩවිල, නුගේගොඩ. 077 7751443

## අධ්‍යක්ෂමණ්ඩලය (2013/09/24 දක්වා)

1. ආචාර්ය සුනිල් ජයසේකර මහතා — සභාපති/ප්‍රධාන විධායක නිලධාරි සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
B.Sc (Chemistry Hons, Peradeniya), Ph.D (Queensland, Australia), C.Chem.
61 / 12B, මානෙල්මාවත, පරණ කැස්බෑව පාර, නුගේගොඩ. 071 4439944

2. ඒ.එම්. චන්ද්‍රපාල මහතා — අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සහ විධායක අධ්‍යක්ෂ
පළාත්සභා, පළාත්පාලන අමාත්‍යාංශයේ හිටපුලේකම්, විශ්‍රාමලත් SLAS විශේෂ පංති නිලධාරි
165/1A, දුටුගැමුණු වීදිය, කොහුවල. 077 3321551

3. කේ.ඒ. ශාන්ත ආර් ඩයස් මහතා — අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සහ ක්‍රියාකාරි අධ්‍යක්ෂ
3/65, කොටවෙහෙර, පරගහකැලේ, අම්පාර 077 8462505

4. ප්‍රියංගනි ලියනගේ මහත්මිය — අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සහ මහාභාණ්ඩාගාර නියෝජිතවරිය
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිණී PED, මහාභාණ්ඩාගාරය 0777 898841

5. චන්ද්‍රා ප්‍රනාන්දු මහතා — අධ්‍යක්ෂමණ්ඩල සාමාජික
විශ්‍රාමලත් පොලිස්පති (IGP), අතිගරු ජනාධිපතිතුමාගේ ජ්‍යෙෂ්ඨ උපදේශක
අංක 3, ෂර්බර් උද්‍යානය, කොළඹ 04. 011 2580561 / 011 255332

6. අයි.එම්.ආර්. විදානගමගේ මහතා — අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
'තරිඳු', බුද්ධියගම, වීරකැටිය. 077 3088478

7. ඩී.ඒ.ඩී. රුවන් දනන්සූරිය මහතා — අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
විශ්‍රාමලත් නියෝජ්‍ය අධ්‍යක්ෂ - ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
26/4, ඇල්ල වත්ත, කටුවාවල මාවත, බොරලැස්ගමුව. 0777 593422 / 011 2516885

8. එම්.එස්.එම්. සකාවුල්ලා මහතා — අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
54/2, මඩම්පැල්ල පාර, කොච්චිකඩේ. 0777 555884

# ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය

| | | |
|---|---|---|
| 01. | පණ්ඩුකජයසිංහමහතා<br>සභාපති / ප්‍රධාන විධායක නිලධාරි | 071 6884082 |
| 02. | ඒ. එම්චන්ද්‍රපාල මහතා<br>විධායක අධ්‍යක්ෂ | 077 3321551 |
| 03. | ඔ.පි.පි. පතිරණගේ මහතා<br>අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සහ ක්‍රියාකාරි අධ්‍යක්ෂ | 077 7903922 |
| 04. | පුරප්පාඩු වී ඇත<br>සාමාන්‍යාධිකාරි | |
| 05. | ඩී. ජී. ඒ. ආර්. ද සිල්වාමහතා<br>සහකාර සාමාන්‍යාධිකාරි (වැවිලි) | 071 4173203 |
| 06. | ආර්. එම්. ආර්. බී. රත්නායක මහතා<br>ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී | 071 8478569 |
| 07. | ඩබ්ලිව්. එල්. ඩී. ප්‍රනාන්දු මහතා<br>සහකාර සාමාන්‍යාධිකාරි (වැවිලිඉන්ජිනේරු) | 077 7364907 |
| 08. | එච්. පී.එම්. ඩබ්ලිව්. හේමචන්ද්‍ර මහතා<br>ප්‍රධාන අභ්‍යන්තරවිගණක | 071 8441536 |
| 09. | එම්.එම්. මර්ලි මහතා<br>වතු කළමනාකාර (i) | 077 6746458 |
| 10. | ඒ.ඒ. අශෝක ආනන්ද මහතා<br>වතු කළමනාකාර (ii) | 071 5285866 |
| 11. | ඩබ්. කැලුම් ප්‍රදිප් මහතා<br>කළමනාකාර (තාක්‍ෂණසහ සංවර්ධන) | 071 8351431 |
| 12. | බී. හෙට්ටිආරච්චි මහතා<br>වතු අධිකාරි, තම්බපණ්ණි පළාත් වතුයාය | 071 8413943 |
| 13. | ඩී.එම්.පී.එ. දිසනායක මහතා<br>වතු අධිකාරි, බිංගිරිය පළාත් වතුයාය | 077 2249046 |
| 14. | ජේ. එච්. ප්‍රනාන්දු මහතා<br>වතු අධිකාරි, පලුගස්වැව පළාත් වතුයාය | 071 4244248 |
| 15. | සී.ඩයස් මහතා<br>වතු අධිකාරි, දිවුලපිටිය පළාත් වතුයාය | 077 3586974 |
| 16. | බී. එම්. යූ. බී. බස්නායක මහතා<br>වතු අධිකාරි, මාදම්පේ පළාත් වතුයාය | 077 3156774 |
| 17. | පී. එම්. ඒ. කරුණාතිලක මහතා<br>වතු අධිකාරි, හලාවත පළාත් වතුයාය | 071 8363615 |

# කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණය

සීමාසහිත හලාවත වැවිලි සමාගම පුත්තලම සිට කටුනායක දක්වා වෙරළ තීරයේ ද නිකවැරටිය සිට දිවුලපිටිය දක්වා අභ්‍යන්තර භූමි තීරයේ ද දිවෙන හෙක්ටයාර 5,729.03 ක මුළු වපසරියක් කළමනාකරණය කරයි. ඉන් පුත්තලම වතුයාය වියළි කලාපයේ පිහිටා ඇති අතර පලුගස්වැව වතුයාය, හලාවත වතුයාය , බිංගිරිය වතුයාය , මාදම්පේ වතුයාය යන වතුයායවල් අතරමැදි කලාපයේ ද දිවුලපිටිය වතුයාය තෙත් කලාපයේ ද ලෙස ප්‍රධාන දේශගුණික තත්ත්වයන් යටතේ පාලනය කරයි.

හෙක්ටයාර 4,501.16 ක් පමණ ප්‍රධාන බෝගය වන පොල් ද හෙක්ටයාර 812 ක් කජු ද වගා කර ඇත. ඉතිරි භූමි ප්‍රමාණය අන්තර්බෝග, පශු සම්පත්, වටිනා දැව, ගොඩනැගිලි, මංමාවත් හා වගාවට නුසුදුසු ඉඩම් කීපයකින් යුක්ත වේ.


## පොල් නිෂ්පාදනය

පොල් නිෂ්පාදනය සහ අස්වැන්න ප්‍රදේශයෙන් ප්‍රදේශයට, කලාපයෙන් කලාපයට වෙනස් වන අතර වියළි කලාපය තුළ අඩු අස්වැන්නක් ද අනෙක් කලාපවල වැඩි අස්වැන්නක් ද වාර්තා වේ. පොල් නිෂ්පාදනයේ සාමාන්‍ය අගය එක් ගසකට ගෙඩි 50 යන අගයේ ඇත.

කෙසේවුවද 2012 වර්ෂය තුළ දීර්ඝ කාලයක් තිස්සේ පැවති දරුණු නියගය හේතුවෙන් 19,239 කට වැඩි හොඳින් වර්ධනය වූ හා ඉතා හොඳින් එලදැරූ ගස් හානියට පත් වූ අතර තවත් ගස් 20,000 ක් පමණ අස්වැන්න රහිත බවට පත් වූ බැවින් 2013 වර්ෂය තුළ අස්වැන්න ලබා දුන් ගස් සංඛ්‍යාව 313,048 කට හා පොල් නිෂ්පාදනය ගෙඩි මිලියන 9.5 දක්වා අඩු වූ අතර මේ හේතුව නිසා පහත දක්වා ඇති පරිදි පොල් නිෂ්පාදනය සමාලෝචිත 2013 වර්ෂය තුළ දී එක් ගසකට ගෙඩි 31කට අඩු විය.

| වර්ෂය | පොල් එලදාව (ගෙඩි) | විචලනය % | එල දරන පොල් ගස් | විචලනය % | එක් ගසකට ගෙඩි නිෂ්පාදනය | ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය | විචලනය % |
|---|---|---|---|---|---|---|---|
| 1992 | 20,782,648 | - | 421,875 | -3% | 49 | 2,296 | 0 |
| 1993 | 19,145,214 | -8% | 407,512 | -5% | 47 | 2,164 | -6% |
| 1994 | 21,382,314 | 12% | 426,722 | 3% | 50 | 2,622 | 21% |
| 1995 | 22,603,156 | 6% | 441,379 | 4% | 51 | 2,755 | 5% |
| 1996 | 19,336,658 | -14% | 421,716 | -4% | 46 | 2,546 | -8% |
| 1997 | 19,235,974 | -1% | 412,006 | -2% | 47 | 2,630 | 3% |
| 1998 | 18,921,808 | -2% | 415,718 | 1% | 46 | 2,522 | -4% |
| 1999 | 21,348,626 | 13% | 393,360 | -5% | 54 | 2,828 | 12% |
| 2000 | 23,216,882 | 9% | 399,454 | 2% | 58 | 2,396 | 9% |
| 2001 | 21,829,630 | -6% | 395,435 | -1% | 55 | 2,769 | -11% |
| 2002 | 15,031,795 | -31% | 413,465 | 5% | 36 | 2,392 | -14% |
| 2003 | 17,585,652 | 17% | 402,937 | -3% | 44 | 2,562 | 11% |
| 2004 | 18,354,614 | 4% | 401,602 | 0% | 46 | 2,591 | 1% |
| 2005 | 14,391,265 | -22% | 408,006 | 2% | 35 | 2,515 | -3% |
| 2006 | 17,070,324 | 19% | 411,968 | 1% | 41 | 2,785 | 11% |
| 2007 | 17,815,317 | 4% | 395,762 | -4% | 45 | 2,869 | 3% |
| 2008 | 16,280,051 | -9% | 378,333 | -4% | 43 | 2,908 | 1% |
| 2009 | 18,632,247 | 14% | 380,000 | 0% | 49 | 2,762 | -5% |
| 2010 | 18,256,007 | -2% | 340,586 | -10% | 54 | 2,317 | -16% |
| 2011 | 14,527,770 | -20% | 353,113 | 4% | 41 | 2,808 | 9% |
| 2012 | 15,807,753 | 9% | 312,456 | -12% | 51 | 2,940 | 5% |
| 2013 | 09,595,275 | -39% | 313,048 | 01% | 31 | | |

# කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණය




2011 වර්ෂයේ දී 353,113ක් වූ එලදාව දෙන ගස් මුළු සංඛ්‍යාව 2013 වර්ෂයේ දී 313,048 ක් දක්වා සහ 2012 වර්ෂයේ දී මිලියන 15.8 ක් වූ අස්වැන්න 2013 වර්ෂයේ දී මිලියන 9.5 ක් දක්වා අඩු වීමෙන් එක් ගසකට පොල් ගෙඩි නිෂ්පාදනය 31 ක් දක්වා අඩු වුව ද නිෂ්පාදනය එක් ගසකට ගෙඩි 50 බැගින් වැඩි වීමක් අපේක්ෂා කරයි. එල දරන ගස් නියගය හේතුවෙන් අහිමි වීම මෙම තත්ත්වයට මගපෑදූ පැහැදිලි සාධකය විය.


## 2012 වර්ෂය තුළ එල දැරූ මැරුනු පොල් ගස්

| වතුයාය | එල දැරූ මැරුනු පොල් ගස් |
|---|---|
| තම්බපන්නී | 10,898 |
| බිංගිරිය | 5,821 |
| පලුගස්වැව | 2,111 |
| හලාවත | 409 |
| එකතුව | 19,239 |

# කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණය

පොල් වගා කළ මුළු වතු ප්‍රමාණය (හෙක්ටයාර) -2013 වසරේ දෙසැම්බර් මස 31 වැනි දිනට

| ප්‍රදේශය | පලුගස්වැව | දිවුලපිටිය | බිංගිරිය | හලාවත | මාදම්පේ | තම්බපන්නි | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| ඵල දරන පොල් | 469.66 | 303.64 | 594.61 | 387.01 | 509.48 | 1,268.72 | 3,533.12 |
| ඵල නොදරන පොල් | 145.50 | 100.00 | 425.3 | 98.35 | 94.17 | 104.72 | 968.04 |
| වගා කළ මුළු පොල් (හෙක්.) | 615.16 | 403.64 | 1019.91 | 485.36 | 603.65 | 1,373.44 | 4,501.16 |






## හලාවත වැවිලි සමාගමේ පොල් ගස්වල වයස් විශ්ලේෂණය 2013

2013 දෙසැම්බර් මස 31වැනි දින අවසන් වන විට

| වයස් කාණ්ඩය වසර | 50 ට වැඩි | 20 – 49 | 10 – 19 | 5 – 9 | 0 - 4 | එකතුව |
|---|---|---|---|---|---|---|
| පොල් ගස් සංඛ්‍යාව | 162,185 | 219,222 | 26,142 | 38,555 | 108,611 | **554,715** |
| ප්‍රතිශතය % | 29% | 40% | 5% | 7% | 20% | |

# කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණය




## වර්ෂා දින සහ වර්ෂාපතනය

වර්ෂය තුළ සාමාන්‍ය වර්ෂාපතනය මිලිමීටර 1215 ක් වු අතර සමාලෝචිත වර්ෂය පුරා ලැබූ වර්ෂාපතනය වගාවට හිතකර නොවීය. වසරේ මුල් කොටසේ පමණක් අඛණ්ඩ වර්ෂාවක් ලැබූ අතර දීර්ඝ කාලයක් පැවති නියගය ඇතුළු වසරේ ඉතිරි කාලය තුළ අතරමැදි වැහි හෝ නොලැබුනු බැවින් දිනකට ලීටර 40ක් පමණ අවශ්‍ය වන පොල් වගාව සඳහා වසර පුරාම වර්ෂාව නොලැබීම නිසා පොල් ගස්වල ඵලදායීත්වය දුර්වල කිරීමට හේතුවක් විය.

# කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණය

## 2011 සහ 2012 වසර වල වර්ෂාපතනය සැසඳීම

### 2011 වසරේ වර්ෂාපතනය පිළිබඳ විස්තර

| වතුයාය | ජනවාරි | | පොබරවාරි | | මාර්තු | | අප්‍රේල් | | මැයි | | ජූනි | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මිලිමිටර | වර්ෂා සහිත දින | මිලිමිටර | වර්ෂා සහිත දින | මිලිමිටර | වර්ෂා සහිත දින | මිලිමිටර | වර්ෂා සහිත දින | මිලිමිටර | වර්ෂා සහිත දින | මිලිමිටර | වර්ෂා සහිත දින |
| බිංගිරිය | 86.40 | 11 | 124.00 | 7 | | | 404.80 | 18 | 292.80 | 8 | 0 | 6 |
| හලාවත | 83.52 | 12 | 79.44 | 8 | - | - | 291.00 | 14 | 75.00 | 9 | 30.00 | 9 |
| දිවුලපිටිය | 65.50 | 4 | 15.50 | 3 | 50.50 | 4 | 142.50 | 15 | 150.50 | 10 | 57.50 | 8 |
| මාදම්පේ | 56.00 | 5 | 37.00 | 4 | | - | 339.00 | 13 | 131.00 | | 32.00 | 2 |
| පලුගස්වැව | 59.30 | 9 | 82.30 | 10 | 76.60 | 5 | 280.80 | 13 | 46.50 | 6 | 23.00 | 4 |
| තම්බපන්නී | 174.00 | 8 | 136.00 | 9 | 10.00 | | 233.00 | 12 | 6.00 | | 13.00 | |

| වතුයාය | ජූලි | | අගෝස්තු | | සැප්තැම්බර් | | ඔක්තොම්බර් | | නොවැම්බර් | | දෙසැම්බර් | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මිලිමිටර | වර්ෂා සහිත දින | මිලිමිටර | වර්ෂා සහිත දින | මිලිමිටර | වර්ෂා සහිත දින | මිලිමිටර | වර්ෂා සහිත දින | මිලිමිටර | වර්ෂා සහිත දින | මිලිමිටර | වර්ෂා සහිත දින |
| බිංගිරිය | 16.91 | 2 | 8.00 | 2 | 87.30 | 9 | 319.70 | 9 | 160.00 | 14 | 40.90 | 5 |
| හලාවත | 18.00 | 2 | 18.00 | 6 | 32.00 | 5 | 239.00 | 10 | 199.00 | 14 | 45.00 | 4 |
| දිවුලපිටිය | 14.00 | 4 | 88.00 | 11 | 82.10 | 8 | 257.00 | 11 | 81.00 | 8 | 11.50 | 1 |
| මාදම්පේ | - | - | 51.00 | 4 | 70.00 | 4 | 305.00 | 10 | 98.00 | 9 | 58.00 | 2 |
| පලුගස්වැව | 12.00 | 2 | 15.50 | 2 | 29.50 | 5 | 220.00 | 13 | 155.50 | 16 | 44.00 | 6 |
| තම්බපන්නී | 5.00 | 1 | - | - | - | - | 146.00 | 10 | 211.00 | 13 | 82.00 | 6 |

### 2012 වසරේ වර්ෂාපතනය පිළිබඳ විස්තර

| වතුයාය | ජනවාරි | | පොබරවාරි | | මාර්තු | | අප්‍රේල් | | මැයි | | ජූනි | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මිලිමිටර | වර්ෂා සහිත දින | මිලිමිටර | වර්ෂා සහිත දින | මිලිමිටර | වර්ෂා සහිත දින | මිලිමිටර | වර්ෂා සහිත දින | මිලිමිටර | වර්ෂා සහිත දින | මිලිමිටර | වර්ෂා සහිත දින |
| බිංගිරිය | 4.70 | 2 | 108.30 | 7 | 117.00 | 7 | 194.30 | 13 | - | - | 64.40 | 13 |
| හලාවත | 39.00 | 1 | 88.00 | 7 | 34.00 | 4 | 198.00 | 11 | 1.00 | 1 | 65.00 | 10 |
| දිවුලපිටිය | 31.00 | 2 | 129.00 | 5 | 15.50 | 2 | 159.40 | 10 | 16.50 | 2 | 140.90 | 14 |
| මාදම්පේ | - | - | 263.00 | 9 | 46.00 | 4 | 196.00 | 7 | - | - | 112.00 | 10 |
| පලුගස්වැව | 26.30 | 3 | 137.50 | 8 | 17.70 | 5 | 232.70 | 13 | 0.80 | 1 | 68.20 | 9 |
| තම්බපන්නී | 19.00 | 2 | 51.00 | 4 | 87.00 | 5 | 120.00 | 7 | - | - | 6.00 | 1 |

| වතුයාය | ජූලි | | අගෝස්තු | | සැප්තැම්බර් | | ඔක්තොම්බර් | | නොවැම්බර් | | දෙසැම්බර් | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මිලිමිටර | වර්ෂා සහිත දින | මිලිමිටර | වර්ෂා සහිත දින | මිලිමිටර | වර්ෂා සහිත දින | මිලිමිටර | වර්ෂා සහිත දින | මිලිමිටර | වර්ෂා සහිත දින | මිලිමිටර | වර්ෂා සහිත දින |
| බිංගිරිය | 21.80 | 2 | 57.90 | 9 | 21.90 | 4 | 454.50 | 14 | 336.40 | 11 | 308.10 | 11 |
| හලාවත | 12.00 | 3 | 36.00 | 4 | 37.00 | 5 | 416.00 | 18 | 202.00 | 8 | 325.00 | 10 |
| දිවුලපිටිය | 51.50 | 6 | 143.00 | 14 | 64.90 | 9 | 409.40 | 19 | 227.60 | 13 | 98.00 | 4 |
| මාදම්පේ | - | - | 51.70 | 5 | 43.00 | 3 | 406.20 | 13 | 191.90 | 8 | 214.00 | 5 |
| පලුගස්වැව | 17.50 | 3 | 53.60 | 8 | 37.10 | 8 | 505.20 | 17 | 319.00 | 10 | 454.00 | 13 |
| තම්බපන්නී | - | 1 | 20.00 | 2 | 50.00 | 2 | 401.00 | 12 | 231.00 | 10 | 374.00 | 15 |

| වතුයාය | 2013 ජන-දෙසැ වර්ෂාපතනය (මිලි) | 2013 ජන-දෙසැ වර්ෂාව සහිත දින | 2013 ජන-දෙසැ වර්ෂාපතනය (මිලි) | 2013 ජන-දෙසැ වර්ෂාව සහිත දින |
|---|---|---|---|---|
| **බිංගිරිය** | 1209 | 69 | 58 | 04 |
| **හලාවත** | 1055 | 58 | 78 | 03 |
| **දිවුලපිටිය** | 1668 | 99 | 08 | 01 |
| **මාදම්පේ** | 1385 | 68 | 62 | 03 |
| **පලුගස්වැව** | 1099 | 73 | 81 | 05 |
| **තම්බපන්නී** | 878 | 48 | 30 | 03 |
| **සාමාන්‍ය** | **1215** | **69** | **53** | **03** |

# කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණය

## මානව සම්පත් කළමනාකරණය

විශේෂ පුහුණුව සඳහා සහ වර්තමාන කළමනාකරණ පද්ධති පිලිබඳ දැනුම තිබීමේ අවශ්‍යතාවය හඳුනා ගනිමින් කාර්ය භාර නිලධාරීන් සහ තනතුරු පුරප්පාඩු පිරවීමට තෝරා ගත් අභ්‍යාසලාභීන් සඳහා විශේෂ පුහුණු වැඩටහනක් පවත්වන ලදී. සාර්ථක අපේක්ෂකයින් වතුවල වැඩිදුර පුහුණුව සඳහා එම වතුවලට පත් කළහ. වතු අධිකාරීන් සහ සහකාර වතු අධිකාරීන් සඳහා සම්මන්ත්‍රණයක් පවත්වන ලදී. මෙයට අමතරව කාර්ය භාර නිලධාරීන් ඇගයීම සඳහා එක් දින වැඩමුළුවක් සාර්ථකව පවත්වන ලද අතර එයින් පසුව ඇගයීම් සහ කාර්යසාධනය අනුව කාර්ය භාර නිලධාරීන් ඇගයීම සිදු කරන ලදී.



2012 ජාතික කෘෂි-ව්‍යාපාර සම්මානය - 2013 - 08- 25 වැනි දින ලෝකඩ සම්මානය දිනා ගන්නා ලදී.



ගරු ජගත් කුමාර මැතිතුමා 2013 - 12- 19 වැනි දින හලාවත, ෆා ඉන් බීච් හෝටලයේ දී පවත්වන ලද සේවක කාර්යසාධන ඇගයීමේ උලළෙහි පැමිණ සිටි පිරිස අමතමින්.

# ආයෝජනා වලිය

## නව වගා සහ යටි වගා වැඩසටහන



### පොල් යටි වගාව

හලාවත වැවිලි සමාගම සිය නිෂ්පාදනය හා ඵලදායීත්වය වර්ධනය කර ගැනීම කෙරෙහි අවධානය යොමු කළ අතර යටි වගා සහ නව වගා විශාල පරිමාණයෙන් වැවීමට විශේෂ වැඩසටහනක් ආරම්භ කරන ලදී. මෙයට පෙර අත්හැර තිබූ හෝ වෙනත් ආකාරයෙන් නොසලකා තිබූ විශාල ඉඩම් ප්‍රමාණයක් මෙම ව්‍යාප්ත කිරීමේ වැඩසටහන සඳහා යොදාගන්නා ලද අතර මෙහි ප්‍රතිඵලයක් ලෙස 2008 සිට 2013 වසර වන විට හෙක්ටයාර 818ක පොල් නව/යටි වගාවක් ඇති කර ගැනීමට හැකි විය.


අනෙක් අතට ගත් කළ පොල් ගස් 161,000ක ට වැඩි සංඛ්‍යාවක් වසර 50ක ට වැඩි ඒවා වන බැවින් හලාවත වැවිලි සමාගමේ අනාගතය ශක්තිමත් කිරීම සඳහා පොල් වගාකිරීමට ඇති සියලුම ඉඩම් උපයෝජනය කර ගනු ලැබේ. මේ අනුව යමින් ඌන-උපයෝජන තත්ත්වයේ තිබූ විශාල ඉඩම් ප්‍රමාණයක් එම තත්ත්වයෙන් මුදා ගන්නා ලද අතර නව වගා, යටි වගා සිදු කිරීමත් නොමේරූ වගා කළමනාකරණයත් සඳහා 2013 වසර තුළ හෙක්ටයාර 917ක් සඳහා රු. මිලියන 90කට වැඩි මුදලක් ආයෝජනය කරන ලදී.

වර්තමානය වන විට අපට 108,611 ක පොල් පැල සංඛ්‍යාවක් ( වසර 0 සිට වසර 4ක් දක්වා වයස) වගාකර ඇති අතර අවශ්‍යතාව අනුව හා ප්‍රතිපත්තිමය තීරණයක් ලෙස, ප්‍රධාන වශයෙන් සෑම වසරකම අහිමිවන පොල් ගස් වෙනුවට හිලව් කිරීම සඳහා නව/යටි වගා වැඩසහනක් ඉදිරි වසර පහක කාලපරිච්ඡේදය සඳහා ද ක්‍රියාත්මක කරනු ඇත. පොල් ගස් ස්වභාව යෙන්ම මියායම, වැටීම, දිරායාම සහ ඵලනොදැරීම යන කරුණු මත අහිමිව යාම සිදු වේ. එබැවින් මෙම වැඩසටහන ඉතා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වී ඇත.

### පොල් යටි වගාවන් හා නව වගාවන්

| වර්ෂය | වගා ප්‍රදේශය (හෙක්) | බීජ පැළ සංඛ්‍යාව |
|---|---|---|
| 2000 | 36.52 | 5773 |
| 2002 | 36.81 | 4878 |
| 2003 | 20 | 2766 |
| 2004 | 28.9 | 4569 |
| 2005 | 54.35 | 8592 |
| 2006 | 44.5 | 7035 |
| 2007 | 00 | 00 |
| 2008 | 33.94 | 6946 |
| 2009 | 101.10 | 15982 |
| 2010 | 107.93 | 17694 |
| 2011 | 128.17 | 20261 |
| 2012 | 246.59 | 38976 |
| 2013 | 200.51 | 31680 |
| **Total** | **1039.32** | **165,152** |

# ආයෝජනා වලිය




## අත් පරාගනය කිරීම

පොල් කර්මාන්තයට නිරෝගි හා ඉහළ ඵලදාවක් ඇති පොල් ගස් අවශ්‍යතාව සහ වැදගත්කම අවබෝධ කර ගනිමින් වැඩි නිෂ්පාදනයක් සහ වැඩි ලාභයක් සඳහා ඉහළ ගුණාත්මක තත්ත්වයෙන් යුතු බීජ හා පැළ අවශ්‍යතාවය මූලිකම අවශ්‍යතාවක් ලෙස හඳුනා ගන්නා ලදී. ඒ අනුව මෙහි ප්‍රතිඵලයක් ලෙස නිරෝගි, වැඩි ඵලදාවක් සහ නියඟයට ඔරොත්තු දෙන බීජ පැළ බිහි කර ගැනීම සඳහා අත් පරාගනය කිරීමේ කටයුතු දියත් කරන ලදී.

තෝරා ගත් මව් ශාක සහ සැන් රාමන් පොල් ගස් අතින් පරාගනය කරමින් ප්‍රධාන වශයෙන් දෙමුහුන් බීජ පැළ නිෂ්පාදනය කර ගැනීම සඳහා වූ එවැනි පළමු බීජ පැළ තවාන පලුගස්වැව වතුයායේ දී පිහිටුවන ලද අතර දැනටමත් 20,000 කට වැඩි දෙමුහුන් බීජ පැළ නිෂ්පාදනය කර ගැනීමට සමත් වී ඇත. ඒ අනුව පලුගස්වැව වතුයායේ මෙම බීජ වගා කිරීම සඳහා සූදානම් කරන ලදී.




අතින් පරාගමනය මඟින් ජානමය වශයෙන් ඉහළ තත්ත්වයෙන් යුත් බීජ පැළ නිෂ්පාදනය කිරීම

| වර්ෂය | සැන් රාමන් මල් | බීජ පැළ අස්වැන්න බීජ | තවානේ දැමූ බීජ |
|---|---|---|---|
| 2012 | 2,556 | 4,847 | - |
| 2013 | 4,098 | 16,121 | 20,968 |
| එකතුව | 6,654 | 20,968 | 20,968 |

# ආයෝජනා වලිය

## බීජ උද්‍යානය

පොල් බීජ දෙමුහුන් 'කප්රුවන' රෝපණ නිෂ්පාදනය
(අතින් රෝපණය කළ ජානමය වශයෙන් පරීක්ෂා කළ/තෝරා ගත් කොළ කුරු+සන් රමොන්)
කිනියම වතුයායේ පිහිටි බීජ උද්‍යානය
CRI-CPL අනුබද්ධ ව්‍යාපෘතිය
(2012 දී ආරම්භ කරන ලදී)

| විස්තරය | 2012 | 2013 | එකතුව |
|---|---|---|---|
| ඉලක්ක | හෙක්ටයාර 40<br>බීජ පැළ 6,525 | හෙක්ටයාර 18<br>බීජ පැළ 2,700 | හෙක්ටයාර 58<br>බීජ පැළ 9,225 |
| අත් කර ගත් බීජපැළ | 4,371 | 2,016 | 6,387 |
| % අත් කර ගත් | 67% | 75% | 69% |

## අතුරුබෝග වගාව සහ පශු සම්පත
## මී ගව ව්‍යාපෘතිය

මෙම මී හරක් ව්‍යාපෘතිය 1992 සිට පලුගස්වැව වතු යාය තුල පවත්වා ගෙන එනු ලබයි.

### ගව පට්ටිය පිළිබඳ විස්තර

| | |
|---|---|
| පට්ටි ගොනුන් | 04 |
| කිරි එළදෙනුන් | 184 |
| වැස්සියන් | 124 |
| පිරිමි සතුන් | 83 |
| එකතුව | 395 |

### කිරි දොවන සතුන්ගේ විස්තර

| | |
|---|---|
| කිරි ගන්නා සතුන් | 54 |
| කිරි වැරූ සතුන් | 94 |
| මුළු කිරි නිෂ්පාදනය | 34,948 (ලීටර්) |

2013 වර්ෂයේ දී නිෂ්පාදිත මුළු කිරි නිෂ්පාදනය වූ ලීටර 34,948 මගින් මුදවපු කිරි හට්ටි 31,078 ක් සහ මිලි ලීටර 100ක යෝගට් කෝප්ප 44,283 ක් නිෂ්පාදනය කරන ලදී. 2012 වසරේ දී 63 ක් වූ උපත් සංඛ්‍යාව සැලකීමේ දී 2013 වසරේ එම අගය 87ක් වූ බැවින් අභිජනන අනුපාතිකය ඉතා සුභවාදී ලෙස පෙනේ.

නෙදර්ලන්තයේ නිලධාරීන්ගේ සංචාරයෙන් පසුව මී හරක් රංචුවේ සහ කිරි පට්ටියේ ගුණාත්මක තත්ත්වය වැඩිදියුණු කිරීම සිදු කරමින් ඇත.

පිටතින් ලබා ගන්නා පට්ටි ගොනුන් මගින් අභිජනන කටයුතු ඉදිරියට සිදු කර ගෙන යනු ලබයි.

මෙම ව්‍යාපෘතිය නිසා වත්තේ වල් මර්ධනය පහසු වන අතර ගොම, පොල් පැල වලට කාබනික පොහොර ලෙස භාවිතයට ගනී. මෙම ව්‍යාපෘතිය මගින් අතිරේක ආදායමක් ද ලබා ගත හැකිය.

## බැටළු ව්‍යාපෘතිය

බිංගිරිය ප්‍රදේශයේ වතුයායේ බැටළු ව්‍යාපෘතියේ බැටළුවන් 800ක් පමණ සිටී. සතුන් අලෙවි කිරීම මගින් ආදායම ලබන අතර බැටළු ගොම යටි වගාවේ කුඩා බීජ පැළ පෝෂණය කිරීම සඳහා කාබනික පොහොරක් ලෙස යොදා ගනී. බිංගිරියේ බීජ පැළ 5000ක ඉඩමක් සහ පලුගස්වැව වතුයායේ බීජ පැළ 25,000ක ඉඩමක් දැනටමත් කාබනික යටි වගාවක් ලෙස වෙන් කර ඇත.

පිටතින් ලබා ගන්නා බැටළුවන් මගින් අභිජනන කටයුතු ඉදිරියට සිදු කර ගෙන යනු ලබයි.

මෙම ව්‍යාපෘතිය නිසා වත්තේ වල් මර්ධනය කිරීමට පහසු වන අතර ගොම පොල් පැල වලට කාබනික පොහොර ලෙස භාවිතයට ගනී. මෙම ව්‍යාපෘතිය මගින් අතිරේක ආදායමක් ද ලබා ගත හැකිය.

# ආයෝජනා වලිය

## කුරුඳු ව්‍යාපෘතිය

හෙක්ටයාර 10 ක කුරුඳු වගාව පහත විස්තර කර ඇති පරිදි වගා කර නඩත්තු කරනු ලැබේ:

| වතුයාය | වගා කළ වර්ෂය | පැළ සංඛ්‍යාව |
|---|---|---|
| බිංගිරිය | 2011 | 7200 |
| දිවුලපිටිය | 2011/2012 | 33295 |
| මාදම්පේ | 2011 | 3212 |
| එකතුව | | **43707** |

නෙමේරූ පැළ අස්වැන්න නෙළීමේ අදියරට ආසන්න වන අතර එක් එක් වතුවල අස්වැන්න නෙළීමට සහ කම්කරුවන් පුහුණු කිරීමට පුහුණු කම්කරුවන් යෙදවීමට කටයුතු සිදු කරමින් පවතී.

## ඩ්‍රැගන් ෆෘට් ව්‍යාපෘතිය

2008 වසරේ දී රෝපිත බිංගිරිය ඩ්‍රැගන් ෆෘට් ව්‍යාපෘතිය තුළින් ස්ථාවර ආදායමක් ලැබෙන අතර එයින් ලැබූ ලාභය ඒ සඳහා වැය කළ මුළු ආයෝජනය ඉක්මවා ඇති අතර පහත විස්තර කර ඇති පරිදි නව වගාවන් රැසක් සිදු කරමින් ඇත. එයින් ලබා ගත් ලාභය රු. ලක්ෂ 06 ක් පමණ වේ. බිංගිරිය හා දිවුලපිටිය වතු කළාපයන් හි වගා කර ඇති මෙම ව්‍යාපෘතිය හෙක්ටයාර 50.69 ක භූමි ප්‍රදේශයක පවතී. තව දුරටත් නව වගාවන් සිදු කරමින් පවතී. මෙම වගාව අවුරුදු 3කින් ඵල දරන අතර තුන්වන අවුරුද්ද තුල වගාවට කල වියදම් සම්පූර්ණයෙන් පියවා ආදායම් ලබා ගත හැකිය. පැල 400 කින් වර්ෂයකට රුපියල් ලක්ෂ 5 කට වැඩි ආදායමක් ලබා ගත හැකිය.



බිංගිරිය ප්‍රදේශයේ වතුයායවල ඇති ඩ්‍රැගන් ෆෘට් ව්‍යාපෘතිය

## ගම්මිරිස් ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය දිවුලපිටිය වතු කළාපයේ හෙක්ටයාර 4.40 ක භූමි ප්‍රදේශයක් තුල ව්‍යාප්තව පවතී. මෙම ව්‍යාපෘතිය මගින් ස්ථාවර වාර්ෂික ආදායමක් හිමි වන අතර වාර්ෂික ලාභය ආසන්න වශයෙන් රු. 124,000 පමණ වේ.

## ගිනිසීරියා රෝපණය

සත්ව ආහාරයක් සහ පොල් වගාවට කාබනික පොහොරක් ලෙස රෝපණය කර වවනු ලැබේ. ගිනිසීරියා භාවිතා කර තම්බපන්නී දෙන්ඩ්‍රෝ ව්‍යාපෘතිය කර ගෙන යාමට සැලසුම් කර ඇත.

## රඹුටන් ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය දිවුලපිටියවතු කළාපය තුල හෙක්ටයාර 5 ක භූමි ප්‍රදේශයක් තුල වගා කර ඇත. මෙමගින් ලබා ගන්නා වාර්ෂික ලාභය රු. 135,000 ක් වේ.

## තේක්ක ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය බිංගිරිය, හලාවත, දිවුලපිටිය, මාදම්පේ සහ තම්බපණ්නි යන වතු කළාපයන් තුල හෙක්ටයාර 20 ක භූමි ප්‍රදේශයක් තුල වගා කර ඇත. 2013 වර්ෂයේ මෙමගින් ලබා ගන්නා ලද ශුද්ධ ලාභය රු. මිලියන 18.5 ක් පමණ වේ.

# ආයෝජනා වලිය

## පිරිසැකසුම, වැඩිදුර පිරිසැකසුම සහ වටිනාකම් එකතු කළ නිෂ්පාදන හා අලෙවිකරණය

**ආයෝජනය - පොල් තෙල් මෝල පලුගස්වැව වතුයාය**

මිල පහළ ගොස් අලෙවිය අස්ථාවර වී වතුවල පොල් ගෙඩි විශාල ප්‍රමාණයක් කුණුවීමට දමා ඉතිරිය කොප්පරා බවට පත් කළ අවස්ථා රැසක් විය. පසු කාලීනව හා දීර්ඝ සාකච්ඡාවලින් පසු එවැනි අසීරු තත්ත්වයන් සහිත සිදුවීම් නැවත සිදු නොවිය යුතු බවට තීරණය කරන ලද අතර එයට විකල්පයක් ලෙස සහ අතිරේක ලාභයක් අත්කර ගැනීම සඳහා හලාවත වැවිලි සමාගම සඳහා තෙල් මෝලක් ඉදිකිරීමට තීරණය කරන ලදී.

ගොඩනැගිල්ල සඳහා රු. 1,842,384ක ද යන්ත්‍රසූත්‍ර සඳහා රු. 6,141,285ක ද පිරිවැයක් ඇතිව සමස්තයක් ලෙස රු. 7,983,669ක ආයෝජනයක් සමඟ අවශ්‍ය සියලු යන්ත්‍රසූත්‍ර ඇතිව එම තෙල් මෝල පිහිට වූ අතර 2013/12/19 වැනි දින ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර අමාත්‍යතුමාගේ සුරතින් එම ව්‍යාපෘතිය විවෘත කරන ලදී.

යන්ත්‍රසූත්‍ර පරීක්ෂා කිරීමේ සහ අත්හදා බැලීමේ කාලපරිච්ඡේදය තුළ අංක 1 සුදු කොප්පරාවලින් සුදු පොල් තෙල් කිලෝ ග්‍රෑම් 10,384ක ප්‍රමාණයක් නිෂ්පාදනය කරන ලද අතර එහි අතුරු නිෂ්පාදනයක් ලෙස පුණ්ණක්කු කිලෝග්‍රෑම් 6,030ක් ද නිපදවූ අතර එයින් ලද ආදායම රු. මිලියන 2.4ක් විය.

මෙම ව්‍යාපෘතිය හරහා පාරිභෝගිකයින් ඉලක්ක කර ගත් ඉතා අනර්ඝ තත්ත්වයේ සුදු පොල් තෙල් නිෂ්පාදනය කරනු ලබන අතර අතුරු නිෂ්පාදනයක් වන පුණ්ණක්කු මී ගව ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය සත්ව ආහාර ලෙස ලබා දෙන ලදී. මෙම වයාපෘතියෙන් ඉතා හොඳ ආදායමක් ලැබීමට අපේක්ෂා කරනු ලබන අතර එහි නිෂ්පාදන හලාවත පිහිටි අපගේ ප්‍රධාන කාර්යාලයේ අපගේ අලෙවිසැල හරහා අලෙවි කරනු ලැබේ. මෙම පොල් තෙල් නව වෙළඳ නාමයක් යටතේ "කප්රුක පොල් තෙල්" යන නමින් "තම්බපන්නී පිරිසැකසුම් කළ කජු" සමඟ වෙළඳපොළට නිකුත් කරන ලදී.



2013 - 12 -19 වැනි දින පලුගස්වැව වතුයායේ පොල් තෙල් මෝල විවෘත කිරීම ගරු ජගත් පුෂ්පකුමාර, ගරු නියෝමාල පෙරේරා, ගරු ප්‍රියංකර ජයරත්න, ගරු ඇන්තනී වික්ටර් පෙරේරා යන අමාත්‍ය වරුන්ගේ සහභාගිත්වයෙන් සිදුවිය.

# ආයෝජනා වලිය

## කජු ව්‍යාපෘතිය

### තම්බපන්නී වතුයාය තුල කජු පිරිසැකසුම් මධ්‍යස්ථානයක් පිහිටු විම

2013 වර්ෂයේ දී අස්වැන්න නෙළන ලද මුළු කජු ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 66,000ක් විය. සෑම වසරකම ලැබූ කජු මුළු අස්වැන්න අමු කජු ලෙස පුවත්පත්වල දැන්වීම් දමා ප්‍රචාරය කරනු ලැබුව ද එසේ අපේක්ෂා කළ මිල එතරම් හිතකර නොවන බවට පෙනී ගියේය. එබැවින් වටිනාකම එකතු කළ/ පිරිසැකසුම් කළ කජු ඇට විකිණීමට තීරණය කිරීමත් සමඟ ගොඩනැගිල්ල සඳහා රු. 1,342,642ක් ද යන්ත්‍රසූත්‍ර සඳහා රු. 157,700ක් ද වැය කර රු. 1,500,343ක සමස්ත ආයෝජනයකින් පුත්තලම තම්බපන්නී ප්‍රදේශයේ වතුයායේ කජු පිරිසැකසුම් මධ්‍යස්ථානයක් පිහිටු වන ලදී. ගරු නියෝජ්‍ය අමාත්‍ය වික්ටර් ඇන්තනී පෙරේරා මහතා විසින් මෙම ව්‍යාපෘතිය විවෘත කරන ලදී. මෙම පිරිසැකසුම් මධ්‍යස්ථානයේ කජු පිරිසැකසුම පිළිබඳව පුහුණුව ලත් කම්කරුවන් 10 දෙනෙක් සේවය කරන අතර ඉතා ඉහළ ගුණාත්මක තත්ත්වයෙන් යුත් කජු මද මෙහිදී නිෂ්පාදනය කරනු ලැබේ.

ගුණාත්මක හා වැඩි ඵලදාවක් ලබා ගැනීම සඳහා අංකුර කජු පැළ තවානක් තම්බපන්නී ප්‍රදේශයේ වතුයායේ දී පිහිටු වන ලද අතර එයින් රු. මිලියන 1.3ක වටිනාකමක් ඇති පැළ අලෙවිකරණ ලදී.



2013 - 12 -19 වැනි දින තම්බපන්නී වතුයායේ කජු පිරිසැකසුම් මධ්‍යස්ථානය විවෘත කිරීම
නියෝජ්‍ය අමාත්‍ය ගරු ඇන්තනී වික්ටර් පෙරේරා මැතිතුමා

කජු ව්‍යාපෘතියෙන් උත්පාදිත ආදායම රු. මිලියන 21කට ආසන්න වන අතර එහි ලාභය රු. මිලියන 2ක් පමණ වේ.

| වතුයාය | ප්‍රදේශය | වගා කළ දිනය | කජු ගස් සංඛ්‍යාව | කජු අස්වැන්න කිලෝ ග්‍රෑම් | වියදම | ආදායම | ශුද්ධ ලාභය |
|---|---|---|---|---|---|---|---|
| තම්බපන්නී | 726.55 | 1992 | 28779 | 57,834 | 17,539,457 | 18,989,246 | 1,449,789 |
| හලාවත | 45.12 | 1993 | 1886 | 3502 | 497,866 | 980,420 | 482,554 |
| පලුගස්වැව | 8.00 | - | 352 | 1662 | 267,913 | 467,022 | 199,109 |
| බිංගිරිය | 36.20 | 1998 | 1355 | 3084 | 538,214 | 863,380 | 325,166 |
| දිවුලපිටිය | 4.04 | 1998 | 1355 | 3084 | 538,214 | 863,380 | 325,166 |
| මාදම්පේ | 6.07 | 2012 | 1050 | 122 | 11,040 | 34,160 | 23,120 |
| **එකතුව** | **825.98** | **-** | **35,622** | **66,274** | **18,860,847** | **21,354,847** | **2,493,261** |

# ආයෝජනා වලිය

## හලාවත ප්‍රධාන කාර්යාලයේ පිහිටි අලෙවිසැල

මෙය මුදවපු කිරි, කජු, යෝගට්, පොල් කිරි අයිස්ක්‍රීම්, පළතුරු ආදී වෙනත් අපගේ නිෂ්පාදන අලෙවි කිරීම සඳහා සිදු කළ තවත් ආයෝජනයකි.



2013 - 12 -19 වැනි දින හලාවත ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ දී අලෙවිසැල විවෘත කිරීම

## වර්ෂා ජලය එක්රැස් කිරීම

2013 වර්ෂයේ දී අත්විඳි දරුණු නියගයෙන් පසුව වර්ෂා ජලය එක්රැස් කිරීම සඳහා වැඩි ප්‍රමුඛතාවක් ලබා දෙන අතර මේ යටතේ ප්‍රදේශ හයක ජලාශ්‍ර හයක් පිළිසරක කරන ලදී. මෙය ඉතා දුෂ්කර කාර්යයක් වුව ද බිංගිරිය වතුයායේ (අතුරුමන්ද (ක්ෂේත්‍ර අංක 1 සහ 4, කිනියම 4 හා 7, සහ සිරිලන්ද ක්ෂේත්‍රයේ අංක 1) රෝපිත 55,000ක සියලුම බීජ පැළ පෝෂණය කරනු ලබන්නේ මෙම ජලයෙනි. අනෙක් අතට බිංගිරිය ප්‍රදේශ වතුයායේ සිරිලන්ද වත්තෙන්, මාදම්පෙ ප්‍රදේශ වතුයායේ මූකලන්ද වත්තෙන් සහ තම්බපන්නී ප්‍රදේශ වතුයායේ කාසමඩු වත්තෙන් රොන්මඩ, ඉවත් කළ පස් හා වැලිවලින් ආදායමක් ද ලබා ගත්තෙමු.





බිංගිරිය ප්‍රදේශ වතුයායේ ඇති වර්ෂා ජලය එක්රැස් කිරීම

# ආයෝජනා වලිය

## විලෝපිත මයිටාවන් අභිජනනය සහ ඔවුන් හානි වූ පොල් ගස් වෙත මුදා හැරීම

දිවයිනේ දකුණු ප්‍රදේශයේ පොල් පොහොර සහිත ඉඩම් විශාල ප්‍රමාණයක් සහ ඉහළ එලදාවක් දෙන පොල් ගස් විශාල සංඛ්‍යාවක් වැලිගම ගස් මැලවෙන රෝගයෙන් හානියට පත් වූ අතර පොල් ගස් උගුලා දමා පිළිස්සීමට සිදු විය. මයිටාවන්ගෙන් සිදු වූ හානිය ද අනෙක් ප්‍රදේශවල පොල් වගාවට විශාල තර්ජනයක් ඇති කලේය. වසර ගණනාවක දුෂ්කර පර්යේෂණයකින් පසු පොල් පර්යේෂණ ආයතනය මෙම මයිටා උවදුරට විසඳුමක් ලෙස විලෝපිත මයිටාවෙක් සොයා ගැනීමට සමත් විය.

ඒ අනුව, ඇසීරියා මයිටා කළමනාකරණ විලෝපිතයන් අභිජනන රසායනාගාරය දෙකක් පිහිටවූ අතර විලෝපිත මයිටාවන් අභිජනනය කර මුදා හැරීම පිණිස මෙයින් එක් රසායනාගාරයක් පලුගස්වැව වතුයායේත් අනෙක දිවුලපිටිය ප්‍රදේශ වතුයායේ කටුකෙන්ද වත්තේත් පිහිටු වන ලදී.

විලෝපිත මයිටාවන් ක්ෂේත්‍රයට මුදා හැරීමෙන් පසුව මයිටාවන්ගෙන් හානි වන පොල් ගෙඩි සංඛ්‍යාව අඩු වීමත් සමඟ මෙය ඉතා හොඳ ප්‍රතිඵල සහිත ක්‍රමයක් බවට පෙනී ගොස් ඇත.

| | වර්ෂය | විලෝපිත මයිටාවන් බෝ කිරීම (පැකට්) | නිෂ්පාදනය (පැකට්) | විලෝපිත මයිටාවන් මුදා හැරීම | | ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|
| | | | | පැකට් | පොල් ගස් | හෙක් |
| පලුගස්වැව | 2011 | 2,783 | 3,137 | 1,153 | 648 | 16 |
| | 2012 | 9,345 | 4,568 | 6,466 | 5,128 | 130 |
| | 2013 | 9,049 | 892 | 7,618 | 6,232 | 158 |
| | **එකතුව** | **21,177** | **8,597** | **15,237** | **12,008** | **304** |
| | | | | | | |
| කටුකෙන්ද | 2011 | - | - | - | - | - |
| | 2012 | 1,257 | 1,293 | 3,019 | 2,107 | 53 |
| | 2013 | 8,096 | 292 | 9,267 | 8,718 | 221 |
| | **එකතුව** | **9353** | **1585** | **12,286** | **10,825** | **274** |

# අවදානම් කළමනාකරණය

කාලගුණික තත්ත්වයන් මත නිෂ්පාදනය අඩු වීම හා අඩු මිල හා අඩු අලෙවිය හේතුවෙන් විකුණුම් අඩු වීම ආදී අහිතකර බලපෑම් ඇති කරනු ලබන අවදානම් සාධක ක්ෂේත්‍ර හතරක් හඳුනා ගෙන ඇති අතර අනෙකුත් කරුණු ද වරින් වර හානිකර ලෙස බලපෑම් කරනු ලැබේ.

**යෝජිත පාලන ක්‍රමෝපායන්:**

| අවදානම් සාධකය | අවදානම් ඇගයීම | අවදානම් පාලන ක්‍රමෝපාය |
|---|---|---|
| **නිෂ්පාදනය අඩු වීම** | ප්‍රධාන වශයෙන් මාස ගණනක් අඛණ්ඩව පවතින නියගය හේතුවේ.<br><br>අවුරුදු 50කට වැඩි පරිණත පොල් ගස් වැඩි ප්‍රතිශතයක් දිරාපත්වීම තවත් හේතුවක් වේ. | වගාවේ පස් අතර වර්ෂා ජලය රඳවා තබා ගැනීම සඳහා විශාල අගල් කපා පොල් ලෙලි වළලා පසේ තෙතමනය වැඩි කර ගැනීමට කටයුතු කිරීම, ෆෙවන සහිත ගිනිසීරියා වැනි ශාක සහ ආවරණ බෝග වැවීම.<br><br>පසු කාලීනව වාරිමාර්ග සඳහා භාවිතා කිරීමට වන හා පොල් ගස් මුල් පෝෂණය කිරීමට උපකාරී විය හැකි වර්ෂා ජලය එක්රැස්කර ගැනීම සඳහා ජලාශ වැඩි සංඛ්‍යාවක් පිළිසකර කිරීම.<br><br>නව වගාව හා යටි වගාව සඳහා මහා පරිමාණයෙන් ආයෝජනය කිරීම. |
| **භාණ්ඩ වෙළඳ චක්‍රය** | විකුණුම් අස්ථාවර හා අඩුවීම හේතුවෙන් පාරිභෝගික ඉල්ලුම මත පාදකව සිදු වූ මිල හා අලෙවිය අඩුවීම මගින් වතුවල පොල් ගෙඩි විශාල සංඛ්‍යාවක් විනාශවීම හා ඉතිරිය කොප්පරා නිෂ්පාදනයට යොමු කිරීමට සිදු වේ.<br><br>අඩු පිරිවැය හේතුවෙන් පාරිභෝගිකයින් වැඩි වශයෙන් ආකර්ෂණය වන පාම් තෙල් වැනි ආදේශක තිබීම. | ප්‍රධාන කාර්යාලයේ සෑම සති දෙකටම වරක් පවත්වනු ලබන 'පොල් පොළේ' දී පොල් අලෙවි කරනු ලැබේ.<br><br>පොල් ගෙඩි ඉහළ ගුණාත්මක තත්ත්වයේ කොප්පරා බවට පත් කරනු ලබන අතර එයින් කොටසක් වෙන්දේසි කිරීම ද වැඩි කොටස පලුගස්වැව තෙල් මෝලේ දී පොල් තෙල් නිෂ්පාදනයට හා මිල යහපත් කාලයේ දී අලෙවි කිරීමට ගබඩා කරනු ලැබේ. |
| **ණය අවදානම** | ගැනුම්කරුවන් විසින් ඉතිරි මුදල් පියවීමට ප්‍රමාදවීම හෝ රීති හා රෙගුලාසි පිළිපැදීමට අසමත්වීමේ හැකියාවක් ඇත. | ණය පියවීමට හා පියවීමේ ක්‍රියාවලිය සමාලෝචනයට බලයලත් අධිකාරී ආයතන මැදිහත් කරවා ගැනීම. |
| **කළමනාකරණ කාර්ය මණ්ඩලය** | පුහුණුව, අභිප්‍රේරණය නොමැති වීම නිසා අඩු නිමවුම්<br><br>සේවකයින් වඩාත් හොඳ වේතන හා ඉහළ තනතුරු සඳහා වෙනත් කර්මාන්ත හෝ සමාගම් වෙත යාම. | වැඩමුළු හා පුහුණු වැඩසටහන් පැවැත්වීම.<br><br>හැකිතාක් දුරට ආයතන තුළ ඉහළ තනතුරු සඳහා උසස්වීම් ලැබෙන බවට තහවුරු කිරීම. |

# මූල්‍ය සමාලෝචනය

මූල්‍ය සමාලෝචනය මෙම වාර්ෂික වාර්තාවේ කොටසක් වන අතර සමාගමේ මූල්‍ය කාර්යසාධනය සහ මූල්‍ය තත්ත්වය එයින් දක්වාලයි. මූල්‍ය සමාලෝචනය මඟින් සමාගමේ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ දළ විශ්ලේෂණයක් ඉදිරිපත් කරනු ලැබේ.

## සමාගමේ මූල්‍ය කාර්යසාධනය ලුහුඬින්

රු. මිලි

| | 2013 | 2012 | විචලනය | විචලනය % | ප්‍රධාන සාධක |
|---|---|---|---|---|---|
| ආදායම | 287 | 339 | (52) | (15%) | වගා අස්වැන්න 39% කින් පහළ බැස ඇත |
| අලෙවි පිරිවැය | 174 | 215 | (41) | (19%) | වසර තුළ මේරූ වගාව තුළ පොහොර යෙදීමේ පිරිවැය අඩු වීම හේතුවෙන් |
| වෙනත් ආදායම් | 76 | 57 | 19 | 33% | වෙනත් මෙහෙයුම් ආදායම ඉහළ ගොස් ඇත |
| පරිපාලන වියදම් | 93 | 95 | (2) | (2%) | කොළඹ කාර්යාලයේ ගොඩනැගිලි කුලිය පහළයාම |
| වෙනත් මෙහෙයුම් වියදම් | 9 | 12 | (3) | (25%) | |
| මූල්‍ය ආදායම | 21 | 37 | (16) | (43%) | තැන්පතු සඳහා වූ අඩු පොළී අනුපාතික සහ නව වගාව සඳහා ආයෝජනය කිරීම ඉහළයාම හේතුවෙන් ස්ථාවර තැන්පතු ශේෂය පහළ ගියේය. |
| මූල්‍ය පිරිවැය | 27 | 25 | 2 | 8% | වාර්ෂික ද.දේ.නි. අවධමකය ඉහළයාම හේතුවෙන් නෑර් වත්කම්වල කල්බදු පොළිය ඉහළයාම |

## මූල්‍ය කාර්යසාධනය

### ආදායම

සමාලෝචිත 2013 වර්ෂයේ දී සමාගම රුපියල් මිලියන 287 ක අලෙවි පිරිවැටුමක් වාර්තා කරන ලද අතර (2012 වර්ෂයේ දී එය රුපියල් මිලියන 339ක් විය) පසුගිය වර්ෂය හා සැසඳීමේ දී එය 15 %ක පහළයාමකි. වසර තුළ සිදු වූ වගා අස්වැන්න පහළයාම මෙම අහිතකර විචලනය සඳහා බලපෑ ප්‍රධාන හේතුසාධකය විය. 2013 වසරේ දී මුළු අස්වැන්න ගෙඩි 9,595,315ක් වූ අතර 2012 වසරේ දී එය ගෙඩි 15,807,753 ක් විය. පසුගිය වසර හා සැසඳීමේ දී මෙය 39%ක පහළ යෑමක් වූ අතර 2012 වසරේ දී අත් විඳි අධික නියගය මේ සඳහා හේතුවක් විය.

## විකුණුම් පිරිවැය

2013 වසරේ විකුණුම් පිරිවැය රු. මිලියන 174ක් වන අතර එය 2012 වසරේ දී රු. මිලියන 215ක් වීම තුළින් රු. මිලියන 41ක පහළයාමක් නිරූපණය කරයි. මෙම විකුණුම් පිරිවැය පහල යාම සඳහා බලපෑ ප්‍රධාන හේතු පහත දැක්වෙන ලෙස විස්තර කළ හැකිය,

- 2013 වසරේ අවසන් කාර්තුවේ දී පැවති අහිතකර කාලගුණ තත්ත්වය හේතුවෙන් පොහොර යෙදීම ඉතා සීමාකාරී ලෙස සිදු කරන ලද බැවින් පරිණත වගාවට පොහොර යෙදීමේ පිරිවැය 2012 වසරේ දී එම අගය රු. මිලියන 30 ක සිට 2013 වසරේ දී රු. මිලියන 13 දක්වා අඩු වී ඇත.


- වසර තුළ දී සමාගම විශාල පරිමාණයේ නව වගාවන්, යටි වගාවන්, නොමේරූ වගාවන් කළමනාකරණය කිරීම සඳහා වැඩි ආයෝජනයක් කල නිසා ඒ සඳහා පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහනය ඉහල යෑම තුලින් මේරූ වගාවන් සඳහා කල පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහනය රු. මිලියන 116ක සිට රු. මිලියන 97 දක්වා අඩු විය.
  (වැවිලි ක්ෂෙත්‍ර වෙනුවෙන් කරන ලද පොදු කාර්ය පිරිවැය නොමේරූ වගාවන් හා මේරූ වගාවන් වල සෘජු පිරිවැය පදනම් කර ගනිමින් නොමේරූ වගාවන් වෙනුවෙන් දරන ලද පොදු කාර්ය පිරිවැය ප්‍රාග්ධනිත කරන අතර මේරූ වගාවන් වෙනුවෙන් කරන ලද පොදු කාර්ය පිරිවැය විකුණුම් පිරිවැය තුල ඇතුලත්ය )

# මූල්‍ය සමාලෝචනය

## ශුද්ධ මූල්‍ය පිරිවැය

මූල්‍ය පිරිවැය තුල ප්‍රධාන වශයෙන් ජනවසම බදුකර වත්කම් මත රජයට ගෙවූ පොළිය සහ අසම්භාව්‍ය බදු කුලීය නිරූපණය කරයි. කල්බදු සඳහා රජයට ගෙවූ පොළිය පසුගිය වසරේ දී රු. මිලියන 25 ක් පමණක් වූ අතර මෙම වසරේදී එය රු. මිලියන 27 ක් දක්වා 8% කින් ඉහළ ගියේය. දළ දේශීය නිෂ්පාදන අවධමනකය අනුව සිදු වූ කල්බදු කුලී ඉහළයාම මේ සඳහා බලපෑ ප්‍රධාන සාධකය විය.

## කල්බදු මත රජයට ගෙවූ බදුකුලිය




## මූල්‍ය ආදායම

මූල්‍ය ආදායම මගින් කෙටි කාලීන තැන්පතුවලින් ඉපැයූ පොළී ආදායම සහ රාජ්‍ය හිමිකාරත්වය ඇති රජයේ ආයතනවලට ලබා දුන් කෙටි කාලීන මූල්‍ය පහසුකම් මත ඉපැයූ පොළී ආදායම නිරූපණය වේ. 2012 වසර හා සැසඳීමේ දී කෙටි කාලීන තැන්පතු මත ඉපැයූ පොළී ආදායම පොළී අනුපාතික පහළ යාම සහ කෙටි කාලීන තැන්පතු අඩුවීම යන කරුණු හේතුවෙන් රුපියල් මිලියන 31 සිට මිලියන 21 දක්වා පහළ ගොස් ඇත. නව වගාව/ නොමේරූ වගා සඳහා රු. මිලියන 102ක මුදලක් ආයෝජනය කිරීමත් ප්‍රාග්ධන වත්කම් සඳහා කෙටි කාලීන තැන්පතුවලින් රු. මිලියන 63ක් ආයෝජනය කිරීමත් තැන්පතු අඩුවීමට බලපෑ ප්‍රධාන හේතුකාරනා අතර වේ.

රාජ්‍ය හිමිකාරත්වය ඇති ආයතනවලින් කෙටි කාලින මූල්‍ය පහසුකම් මත 2010 වසරේ සිට 2012 වසර තෙක් අය විය යුතු රු. මිලියන 14.7ක පොළී ආදායම මෙතෙක් ආපසු අය කර ගැනීමට නොහැකි විය. මෙම පොලි අදායම් නොලැබිම හේතුවෙන් හලාවත වැවිලි සමාගම 2013 වර්ෂයට අදාල ලැබිය යුතු පොලිය වන රු. මිලියන 6.4 2013 වර්ෂයට අදාල ගිණුම් සකස් කිරිමේදි සැලකිල්ලට නොගැනිමට තීරණය කරන ලදි. එබැවින් කෙටිකාලින මූල්‍ය පහසුකම් මත පොළී ආදායම පසුගිය වසර හා සැසඳීමේ දී රු. මිලියන 6.4කින් පහළ ගොස් ඇත.

## වෙනත් මෙහෙයුම් ආදායම් සහ ලාභ

කජු විකිණීම, වියපත් පොල් ගස් විකිණීම, දැව විකිණීම, කුඹුරු ඉඩම් බද්දට දීම, පැරණි වාහන විකිණීම ආදිය ඇතුලත් වෙනත් මෙහෙයුම් කටයුතු මගින් සමාගම රු. මිලියන 76ක ආදායමක් උපයා ගන්නා ලද අතර එය පසුගිය වසර හා සැසඳීමේ දී 34%ක වර්ධනයකි. අනෙකුත් ආදායම් මූලාශ්‍ර පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනයේ අංක 21 දරන සටහනෙන් පෙන්වා ඇත.

## ශුද්ධ ලාභය

පසුගිය වසරේ ලාභය වූ රු. මිලියන 77.9 අනුව බලන කළ සමාලෝචිත වර්ෂය සඳහා සමාගම රු. මිලියන 72.9ක (බද්දට පසු) ශුද්ධ ලාභයක් වාර්තා කරන ලදී. 2012 වසරේ දී දක්නට ලැබුණු අධික නියඟය හේතුවෙන් 2013 වසර තුළ දී වගා අස්වැන්න 39%කින් අඩු වීමක් සිදු වුවද පසුගිය වසර හා සැසඳීමේ දී ලාභය කැපී පෙනෙන පහළයාමක් නොමැතිව පවත්වා ගැනීමට සමාගම සමත් වී ඇත.

# මූල්‍ය සමාලෝචනය

## ලාභාංශ

2008 වසරේ දී සීමාසහිත හලාවත වැවිලි සමාගමේ කළමනාකරණය ආපසු රජයට පවරා ගැනීමෙන් පසු මේ දක්වා රු. මිලියන 215ක සමස්ත ලාභාංශයක් භාණ්ඩාගාරය වෙත ගෙවා ඇත. 2008 වසරේ සිට 2013 වසර දක්වා සමාගම උපයා ඇති ලාභය හා සැසඳීමේ දී මෙය ඉතා කැපීපෙනෙන ඉහළ අගයකි. ඒ අනුව 2013 වසර අවසානය වනවිට හලාවත වැවිලි සමාගම භාණ්ඩාගාරයට ගෙවා ඇති සමස්ථ ලාභාංශ ප්‍රමාණය රු. මිලියන 376ක් විය.

| වර්ෂය | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| ශුද්ධ ලාභය රු. මිලි. | 10.5 | 98 | 75.2 | 77.6 | 77.9 | 72.9 | 412.1 |
| පොල් නව/යටි වගාව වෙනුවෙන් කළ ආයෝජනය රු. මිලි. | 13 | 35 | 39 | 41 | 61 | 90 | 279 |
| භාණ්ඩාගාරයට ගෙවූ ලාභාංශ රු. මිලි. | 30 | 75 | | 75 | 35 | | 215 |

## මානව සම්පතේ සේවාව අගය කිරිම

මානව සම්පත ආයතනයක ඉතාම වැදගත් වත්කම වන බවට ඇති දැඩි විශ්වාසය හේතුවෙන් සමාගම සිය සේවකයින් දිරිමත් කිරීම සඳහා ගන්නා ලද පියවරක් ලෙස 2013 වසරේ දී රු. මිලියන 12 ක මුදලක් සිය සේවකයින්ගේ කාර්යසාධන දිරිදීමනා ලෙස ගෙවා ඇත. එයට අමතරව හලාවත වැවිලි සමාගම ඇතුලුව 1992 පලාත් වැවිලි සමාගම් පිහිටු වීමේ ගිවිසුමේ එකග වු පරිදි සේවා නියුක්තිකයන්ට ලාභයෙන් 10% කොටසක් බෙදා දිම වෙනුවෙන් 2013 වර්ෂයේදි රු. මිලියන 5.3 ක මුදලක් වෙන් කරන ලදි.

## සමාගමේ මූල්‍ය තත්ත්වය ලුහුඩින්


රු. මිලි


| | 2013 | 2012 | විචලනය | විචලනය % | ප්‍රධාන සාධක |
|---|---|---|---|---|---|
| **වත්කම** | | | | | |
| කල්බදු දේපළ පිරියත හා උපකරණ | 130 | 137 | (7) | (5%) | වත්කම් ක්‍රමක්ෂය |
| ජෛව වත්කම් | 470 | 369 | 101 | 27% | පොල් නව/යටි වගා |
| සින්නක්කර දේපළ පිරියත උපකරණ | 137 | 96 | 41 | 42% | වත්කම් අත්කර ගැනීම |
| ජංගම වත්කම් | 356 | 454 | (98) | (21%) | වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ හා කෙටි කාලීන ආයෝජන අඩුවීම |
| **ස්කන්දය හා වගකීම්** | | | | | |
| කොටස්හිමි අරමුදල | 825 | 788 | 37 | 5% | රැඳවුම් ලාභය ඉහළ යාම |
| විලම්බිත බදු වගකීම | 42 | 33 | 9 | 27% | නව/යටි වගා මත ආයෝජනය හේතුවෙන් සිදු වූ ඉහළයාම |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | 59 | 53 | 6 | 11% | ආයුගණක තක්සේරුව පාදකව |
| කල්බදු වගකීම් | 115 | 117 | (2) | (2%) | රජයේ කල්බදු ආපසු ගෙවීම |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | 45 | 54 | (9) | (17%) | වෙළඳාම හා අනෙකුත් ගෙවිය යුතු දෑ පහළයාම |

# මූල්‍ය සමාලෝචනය

## නව හා යටි වගා සඳහා ප්‍රාග්ධන ආයෝජනය

2013 වර්ෂයේදි පොල් නව වගා, යටි වගා හා නොමේරු වගා විද්‍යාත්මකව කළමනාකරණය කිරීම සඳහා 2012 වර්ෂයේ සිදු කල රු. මිලියන 61 ක ආයෝජනයේ සිට රු. 90 ක් දක්වා ඉහල ගොස් ඇත. එම ආයෝජනය අක්කර 2293 ක් වෙනුවෙන් දරා ඇත. එයට අමතරව සීමාසහිත හලාවත වැවිලි සමාගම 2013 වසරේ දී වෙනත් බහුවාර්ෂික වැවිලි සඳහා රු. මිලියන 12 ක ආයෝජනයක් සිදු කර ඇත.





## ප්‍රාග්ධන ව්‍යුහය

## කොටස්හිමිකරුවන්ගේ අරමුදල

ප්‍රාග්ධන ව්‍යුහය තුළ කොටස්හිමිකරුවන්ගේ අරමුදල 2012 වසරේ දී රු. මිලියන 788 සිට 5% කින් එනම් රු. මිලියන 825 දක්වා වර්ධනය වූ අතර මෙම අරමුදල සමාලෝචිත වර්ෂයේ සමස්ත වත්කම්වලින් 75%කට සමාන වේ.

# මූල්‍ය සමාලෝචනය

සමස්ත වත්කම්, කොටස්හිමිකරුවන්ගේ අරමුදල, කොටස් හිමිකරුවන්ගේ අරමුදල් අනුපාතිකය





## මුදල් ප්‍රවාහය

මෙහෙයුම් කටයුතුවලින් උත්පාදිත ශුද්ධ මුදල රු. මිලියන 24කින් එනම් පසුගිය වසරේ එම අගය වූ රු. මිලියන 93 සිට රු. මිලියන 117 දක්වා ඉහළ ගියේය. සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දෑ රු. මිලියන 134.8ක් වූ අතර ලංකා බැංකුවේ ඇති ස්ථාවර තැන්පතු, භාණ්ඩාගාර බිල්පත් සහ මුදල් හා බැංකු ශේෂ මෙයට ඇතුලත් විය.

2012 වසරේ දී දැරූ ප්‍රාග්ධන වියදම වූ රු. මිලියන 72 හා සැසඳීමේ දී මෙම වසර තුළ එම අගය රු. මිලියන 166ක් විය.


## කොටසක ඉපැයුම (EPS)

2013 වර්ෂය සඳහා කොටසක ඉපැයුම රු. 3.69ක් විය. පසුගිය වසරේදී එම අගය රු.3.90 විය.




## ජංගම අනුපාතිකය

ජංගම වත්කම් සහ ජංගම වගකීම් අතර අනුපාතිකය 2013 වසරේ දී වර්ධනය වන නැඹුරුවක් පෙන්නුම් කරයි. 2013 වසරේ දී අත්කර ගත් 7.8 ක ජංගම අනුපාතිකය සමාගමට කෙටි කාලීන ද්‍රවශීලතා අවශ්‍යතාවන් ඉටු කර ගැනීමට හැකි ප්‍රමාණවත් අර්ථාන්විත මට්ටමක් විය.



# අධ්‍යක්‍ෂ මණ්ඩලයේ සංක්ෂිප්ත වාර්තාව...

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමග වාර්ෂික වාර්ථාව හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කරන්නේ ඉමහත් සතුටිනි.

## සාරාංශගත ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශය:

| | 31.12.2013 වර්ෂ අවසානයේ රු. | 31.12.2012 වර්ෂ අවසානයේ රු. |
|---|---|---|
| **පොල් නිෂ්පාදනය (ගෙඩි)** | **9,595,315** | **15,807,753** |
| අයභාරය | 287,152,154 | 339,050,649 |
| අලෙවි පිරිවැය | (174,262,628) | (215,317,782) |
| **දළ ලාභය** | **112,889,525** | **123,732,868** |
| වෙනත් මෙහෙයුම් ආදායම සහ ඉපයීම් | 76,206,174 | 56,977,730 |
| පරිපාලන වියදම් | (92,660,057) | (94,649,771) |
| වෙනත් මෙහෙයුම් වියදම් | (8,613,780) | (12,315,133) |
| **මෙහෙයුම් වලින් ලාභය** | **87,821,863** | **73,745,695** |
| මූල්‍ය අදායම් | 21,167,854 | 37,463,655 |
| මූල්‍ය වියදම් | (27,169,196) | (24,984,006) |
| **බදුපෙර ලාභය** | **81,820,521** | **86,225,344** |
| බදු වියදම් | (8,072,974) | (8,250,497) |
| වසරේ ලාභය/(ශුද්ධ පාඩුව) | **73,747,547** | **77,974,847** |
| වෙනත් විස්තීර්ණ ආදායම් | (828,622) | 0 |
| **වර්ෂයේ මුළු විස්තීර්ණ ආදායම් බදු පසු** | **72,918,925** | **77,974,847** |
| **මූලික කොටසක ඉපයීම්** | 3.69 | 3.90 |
| **කොටස් ප්‍රාග්ධනය** | **200,000,010** | **200,000,010** |

# අධ්‍යක්ෂ මණ්ඩලයේ සංක්ෂිප්ත වාර්තාව...

## ප්‍රධාන ක්‍රියාකාරකම්

පොල් සහ වෙනත් කෘෂි භෝග වගාකිරීම අගය ඒකතු කල භාණ්ඩ නිශ්පාදනය, පශු සම්පත් හා නිශ්පාදන අලෙවි කිරීම.

## මූල්‍ය වාර්ථා හා විගණන වාර්ථාව

සමාගමේ මූල්‍ය වාර්ථා සහ විගණන වාර්ථාව පිටු අංක 39 සිට 67 දක්වා සඳහන්ව ඇත.

## ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශන පලියල කිරීමේදි යොදා ගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මේ සමග අමුණා ඇති අතර පසුගිය වසර හා සංසන්දනය කිරීමේදී වෙනසක් සිදු කර නොමැත.

## අඛණ්ඩ පැවැත්ම

සමාගමේ ක්‍රියාකාරකම් ඉදිරියට චිරස්චිතව ගෙනයාම සඳහා අවශ්‍ය තරම් සම්පත් සමාගම සතුව ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමට පත්ව ඇත. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශන "අඛණ්ඩ බව" යන සංකල්පය මත සකසා ඇත.

## අධ්‍යක්ෂ මණ්ඩලය

ආයතනයෙහි අධ්‍යක්ෂමණ්ඩලය සංක්ෂිප්ත ව පහත පරිදි වේ. මේ පිළිබඳ පූර්ණ විස්තර අධ්‍යක්ෂ මණ්ඩලය ශීර්ෂය යටතේ මෙයට ඉහත දක්වා ඇත.

## වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලය

**පණ්ඩුක ජයසිංහ මහතා**
සභාපති/ ප්‍ර.වි.නිළධාරී සහ සාමාජික
**ඒ. එම්. චන්ද්‍රපාල මහතා**
විධායක අධ්‍යක්ෂ සහ සාමාජික
**ඖ.පී.පී. පතිරණගේ මහතා**
ක්‍රියාකාරි අධ්‍යක්ෂ සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
**ප්‍රියංගනි ලියනගේ මහත්මිය**
මහා භාණ්ඩාගාර නියෝජිත සහ සාමාජික
**එස්. චන්ද්‍රා එස්. ප්‍රනාන්දු මහතා**
සාමාජික
**අයි. එම්. ආර්. විදානගමගේ මහතා**
සාමාජික
**කේ. බි. රත්නායක මහතා**
සාමාජික
**ආර්. ආර්. එම්. අමරතුංග මහතා**
සාමාජික

2013 සැප්තැම්බර් මස දක්වා අධ්‍යක්ෂ මණ්ඩලය

**ආචාර්ය සුනිල් ජයසේකර**
සභාපති/ප්‍ර.වි.නිළධාරී සහ සාමාජික
**ඒ. එම්. චන්ද්‍රපාල මහතා**
විධායක අධ්‍යක්ෂ සහ සාමාජික
**කේ. ඒ. ශාන්ත ආර්.ඩයස් මහතා**
ක්‍රියාකාරි අධ්‍යක්ෂ සහ සාමාජික

**ප්‍රියංගනි ලියනගේ මහත්මිය**
මහා භාණ්ඩාගාර නියෝජිත සහ සාමාජික
**එස්. චන්ද්‍රා එස්. ප්‍රනාන්දු මහතා**
සාමාජික
**අයි. එම්. ආර්. විදානගමගේ මහතා**
සාමාජික
**ඩී. ඒ. ඩී. රුවන් දනන්සූරිය මහතා**
සාමාජික
**එම්. එස්. එම්. සකුල්ලා මහතා**
සාමාජික

## විගණන කමිටුව

පහත සඳහන් අධ්‍යක්ෂවරුන් විගණන කමිටුව නියෝජනය කල අතර වසර තුල ඇගයීම් 03 ක් සිදු කරන ලදී.

**වත්මන් විගණන කමිටුව**

| | |
|---|---|
| ආර්.ආර්.එම්. අමරතුංග මහතා | සභාපති |
| කේ.බි. රත්නායක මහතා | සාමාජික |
| අයි.එම්.ආර්.විදානගමගේ මහතා | සාමාජික |
| ඒ. එම්. චන්ද්‍රපාල මහතා | නිරීක්ෂක |

**2013 සැප්තැම්බර් මස දක්වා විගණන කමිටුව**

| | |
|---|---|
| ප්‍රියංගනි ලියනගේ මහත්මිය | සභාපති |
| අයි.එම්.ආර්.විදානගමගේ මහතා | සාමාජික |
| ඩී.ඒ.ඩී. රුවන් දනන්සූරිය මහතා | සාමාජික |
| ඒ. එම්. චන්ද්‍රපාල මහතා | නිරීක්ෂක |

## ප්‍රගති සමාලෝචනය

වර්ෂය තුල සමාගමේ ප්‍රගතිය පිළිබඳ වාර්තා සහ වැදගත් කළමනාකරණ සහ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ විස්තර සභාපතිතුමාගේ හා කළමනාකරණ විමර්ශනයන් හි අඩංගුවේ.

## අයභාරය

වසර තුල සමාගමේ අයභාරය රුපියල් මිලියන 287 ක් වු අතර විස්තර විගණන මූල්‍ය ප්‍රකාශන වල දැක්වේ.

## මූල්‍ය ප්‍රතිඵල

සමාගමේ බදු පසු ලාභය රු. මිලියන 72.9 කි. (2012 දී රු. මිලියන 77.9) විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනයන්හි විස්තරාත්මකව දක්වා ඇත.

# අධ්‍යක්ෂ මණ්ඩලයේ සංක්ෂිප්ත වාර්තාව...

## ප්‍රාග්ධනය හා ස්ථාවර වත්කම්

2013 වර්ෂයේදී සමාගම රුපියල් මිලියන 166 ක් (2012 දි රු.මි.72 ක්) ස්ථාවර වත්කම් වෙනුවෙන් ආයෝජනය කරන ලදී. ඉන් රු.මි. 102 ක් නව වගාවන්, යටි වගාවන් හා නොමේරු වගා වෙනුවෙන්ද රු.මි. 64 ක් දේපල පිරියත උපකරන වෙනුවෙන්ද විය. (2012 : රු.මි. 8)
2013 දෙසැම්බර් 31 ශේෂපත්‍රයට අනුව ජංගම නොවන වත්කම් (දේපල, ජෛව වත්කම්, පිරියත) වල පොත් අගය රුපියල් මිලියන 737 කි. විස්තර විගණන මුල්‍ය වාර්තාවේ දක්වා ඇත. (2012 එය රු.මි.602 කි)

## කෙටි කාලීන ආයෝජන

2012 වර්ෂයේ රු. මි. 199 ට සාපේක්ෂව වර්ෂ 2013 සමාගමේ කෙටිකාලීන ආයෝජන, රු. මි. 129ක් විය. එසේ අඩුවීමට හේතු ලෙස නව වගාවලට සහ ජංගම නොවන වත්කම් වලට කළ ප්‍රාග්ධන ආයෝජනල මහා භාණ්ඩාගාරයට ලාභාංශ ලෙස රු.මි. 35 ක් ගෙවිම දැක්විය හැක.

## සංචිත

සමාගමේ ඇති සම්පූර්ණ සංචිත රඳවා ගත් ලාභයෙන් දක්වේ. එය 2013 දෙසැම්බර් 31 වැනි දිනට රු. මිලියන 625 ක් වන අතර ඊට සාපේක්ෂව 2012 දී රු. මිලියන 588 ක් විය. සංචිත වල වෙනස් වීම් සහ සංයුතිය විගණිත මුල්‍ය වාර්ථා වල ස්කන්ධ වෙනස් වීම් ප්‍රකාශණයෙන් දැක්වේ.

## කොටස් ප්‍රාග්ධනය

2013 දෙසැම්බර් මස 31 වැන දිනට සමාගමේ සමස්ත කොටස් ප්‍රාග්ධනය රුපියල් 200,000,010 ක් විය. සමාන්‍ය කොටස් 20,000,000 කින් සහ එක් ස්වර්ණමය කොටසකින් සමන්විතවිය. කිසිදු ආකාරයක කොටස් නිකුත් කිරීමක් 2013 වසර තුළ සිදු කර නැත.

## වගකීම් සහ ප්‍රාග්ධන බැඳීම්

අවිනිශ්චිත වගකීම් සහ ප්‍රාග්ධන බැඳීම් විගණන වාර්තාවේ සටහන් වල අන්තර්ගත කර ඇත.

## මුල්‍ය වාර්තාව ඉදිරිපත් කරන දිනට පසු සිදුවීම්

මුල්‍ය වාර්තා ඉදිරිපත් කරන දිනයේ සිට මෙම වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරන අවස්ථාව දක්වා ගිණුම් ප්‍රකාශන සංශෝධනය කිරීමට හෝ එසේ නැතහොත් ඒ තුල ගැලපීම් හෝ අනාවරණය කිරීමට හෝ අවශ්‍ය තරම් ප්‍රමාණවත් සිද්ධි සිදු වී නොමැත.

## අධ්‍යක්ෂවරුන්ගේ බැඳීම්

සමාගමේ ගිවිසුම් සම්බන්ධව ඍජුව හෝ වක්‍රව අධ්‍යක්ෂවරුන්ගේ බැඳීම් නොමැත.

## අධ්‍යක්ෂවරුන්ගේ කොටස් හිමිකම්

කිසිම අධ්‍යක්ෂවරයෙක් හෝ ඔහුගේ/ඇයගේ කාලත්‍රයෙකු සමාගමේ කොටස් හිමිකම් දරන්නේ නැත.

## සේවානියුක්තිය

සමාගමේ තිරසාර උන්නතිය සඳහා, රජයේ නීති වලට අනුකූලව, සේවා සැපයීම, පුහුණුව, උසස්වීම්, විනයානුකූල තීරණ ආදී කරුණු සම්බන්ධව සියලුම සේවකයින්ට එක හා සමානව සලකනු ලබයි. එසේම, සමාගම සම තත්ව පදනම මූලික කර ගනිමින් සෑම සේවානියුක්තිකයකුට, ලිංග බේදය, ජාති බේදය, ආගම, විවාහක තත්ත්වය, දේශපාලන පසුබිම හෝ කායික දුබලතාවන් නොසලකා සම අවස්ථාවන් ලබා දීමට කටයුතු කරනු ලබයි.

## ව්‍යවස්ථාපිත දීමනා

සමාගම විසින් මුල්‍ය වාර්තා ඉදිරිපත් කරන දිනට ගෙවීමට නියමිත දන්නා සියලුම බදු සහ සමාගමේ සේවා නියුක්තියන් සඳහා ගෙවිය යුතු ගෙවීම් සහ සමාගම විසින් ගෙවිය යුතු අනෙකුත් දන්නා ව්‍යවස්ථාපිත ගෙවීම් ගෙවා අවසන් කර ඇති බවට හෝ ගෙවීම් සිදු කිරීම සඳහා ප්‍රතිපාදන ඇතිකර ඇති බවට හෝ අධ්‍යක්ෂවරුන් සහතික වේ.

## විගණකවරු

2013 වසර සඳහා වූ ගිණුම් අයියර් සහ සමාගම (වරලත් ගණකාධිකාරිවරු) විසින් විගණනය කරන ලදී.

## වාර්ෂික වාර්තාව

මුල්‍ය වාර්තා 2013 මැයි මස 30 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

# අධ්‍යක්‍ෂ මණ්ඩලයේ සංක්‍ෂිප්ත වාර්තාව...

**වාර්ෂික මහා සභා රැස්වීම**

හලාවත වැවිලි සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීම 2014 ජූනි මස 30 වන සඳුදා දින, පස්වරු 1.30 ට, කොළඹ 01 ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හෝටලයේදී පැවැත්වීමට නියමිතය, මහා සභා රැස්වීමේ නිවේදනය සහ පෙරකලාසි පෝරමය මේ සමග අමුණා ඇත. මෙම වාර්තාව හලාවත වැවිලි සමගාමේ අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලදී.

**පණ්ඩුක ජයසිංහ**
සභාපති/ප්‍රධාන විධායක නිලධාරි

**කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (පුද්) සමාගම**
ලේකම්වරු - හලාවත වැවිලි සමාගම
කොළඹ.

# ආයතනික පාලන ප්‍රකාශනය

හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය අවංකත්වය,ආයතනික මධ්‍යස්ථභාවය, විනිවිදභාවය හා වගකීම් සහගත බව යන ප්‍රතිපත්ති තුල ක්‍රියා කරනු ලබයි. මෙය සමාගම සහ සමාගම කෙරෙහි උනන්දුවක් දක්වන පිරිස් සමග ප්‍රබල සම්බන්ධතාවක් ඇති කිරීම සඳහා හේතු වී ඇත. ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන් සහ ආයතනික ස්ථායිතාව මෙන්ම ව්‍යාපාරික වටිනාකම වැඩිවන අයුරින් සකස්කර ඇති ප්‍රතිපත්තීන්, ක්‍රියාපටිපාටීන්, ක්‍රියා පිළිවෙත්, නිවැරදි ව්‍යුහයන් සහ තොරතුරු උක්ත සඳහන් සම්බන්ධතාවයන් වඩාත් සවිමත් කිරීම සඳහා හේතු වී ඇත.

### අධ්‍යක්ෂ මණ්ඩලය

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ කාර්යසාධනය සඳහා වගකිවයුතු වන්නාසේම අවසාන වශයෙන් ඒ සම්බන්ධයෙන් වගකීමට බැඳී සිටින්නේය.

### වගකීම

මූලික ප්‍රතිපත්තීන් හා උපායශිලී අරමුණු සකස් කිරීමටත් ඒවා ක්‍රියාවට නැංවීමටත් අධ්‍යක්ෂ මණ්ඩලය බැඳී සිටි. සමාගමේ මූල්‍ය තොරතුරුවල විශ්වාසනීයත්වය සහ අභ්‍යන්තරික පාලන ක්‍රමවේදයන්ගේ සාර්ථකත්වය සඳහාද අවසාන වගකීම් දරන්නා වන්නේ එහි අධ්‍යක්ෂ මණ්ඩලයයි.

### සංයුතිය

සභාපති සහ විධායක අධ්‍යක්ෂවරයෙකුගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලය 2013 වර්ෂයේ අධ්‍යක්ෂවරුන් අටදෙනෙකුගෙන් යුක්ත වේ.

### අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 2013 වසර මුලදී සම්පාදනය කළ වාර්ෂික සිද්ධි කාලරාමුවට අනුකූලව මාසිකව පවත්වනු ලබයි. සමාගමේ උපායශීලී ක්‍රමෝපායන්, වාර්ෂික අයවැය, සියලු කාර්යයන් වල ප්‍රගතිය, ප්‍රාග්ධන හා මූලධන වියදම් විමසීමට ලක් කිරීම මෙම රැස්වීමේදී සිදු වේ. සෑම රැස්වීමක් පැවැත්වීමටම සාධාරණ කාලයකට පෙර ඒ හා සම්බන්ධ ලිපි ලේඛන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් හට ලබා දීමට කටයුතු කරනු ලැබේ.

### විගණන කමිටුව

සමාගමේ විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු ඇතුලු අධ්‍යක්ෂවරු හතර දෙනෙකුගෙන් යුක්තය. විධායක නොවන අධ්‍යක්ෂවරයකු වන ආර් ආර් එම් අමරතුංග මහතා විගණන කමිටුවේ සභාපතිත්වය උසුලන අතර වර්ෂය තුල ඇගයීම් 03 ක් සිදු කර ඇත. කාර්තු පදනම මත රැස්වීම් සැලසුම් කර ඇත. සමාගමේ සභාපති/ප්‍රධාන විධායක නිලධාරි, අභ්‍යන්තර විගණක, ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරි ආරාධිත අවස්ථා වලදි මෙම කමිටු රැස්වීම් වලට සහභාගී වේ.

### නීතිමය අවශ්‍යතාවලට අනුකූලවීම

සාංගමික සංස්ථාපත්‍රය, සාංගමික ව්‍යවස්ථාවලිය හා රාජ්‍ය ව්‍යාපාර සඳහා බලපවත්වන අනෙකුත් නීති රීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය හැකි සෑම උත්සාහයක්ම ගනු ලබයි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි සමාග මේ මූල්‍ය ප්‍රකාශන සැකසීමට අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කර ඇත.

# අධ්‍යක්ෂ මණ්ඩල වගකීම පිළිබඳ ප්‍රකාශය

2007 අංක 07 දරන පනත යටතේ සමාගමේ මූල්‍ය වාර්තාකරනය පිළිබඳව හලාවත වැවිලි සමාග මේ අධ්‍යක්ෂ මණ්ඩලය තම වගකීම තහවුරු කරයි. සමාගමේ විගණකවරුන් වන අයියර් සහ සමාගම ඔවුන්ගේ වගකීම් පිළිබඳව සිය වර්තාවේ සංක්ෂිප්තව දක්වා ඇත. මෙම වාර්තාවේ ඇතුලත් කර ඇති 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වන ගිණුම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සකස් කර ඇති අතර 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාර තොරතුරු එමගින් දක්වා ඇත. සමාගම සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගෙන ඇති බවටත්, එම ක්‍රමවේදයන් සහ ගිණුම් ප්‍රමිතිකරණයන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමේදී නිරතුරුවම භාවිතා කළබවටත් අධ්‍යක්ෂ මණ්ඩලය සහතික වේ. මෙම ප්‍රමිතීන්ට වෙනස් වන අවස්ථා ඇතොත්, ඒවා නිසියාකාරව පෙන්වා දී ඇති අතර ඊට හේතු දක්වා ඇත. යථාර්ථවාදී අන්දමින් හා සාධාරණ ලෙස සියලුම විනිශ්චයන් සහ ඇස්තමේන්තු කටයුතු කර ඇති බවත් සනාථ කෙරේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී ගත් තීරණ හා ඇස්තමේන්තු නිවැරදි හා සත්‍ය ඒවා බවටද වන වගකීම අධ්‍යක්ෂවරු පිළිගනී. සමාගම තම මූල්‍ය තත්ත්වය හා නිරවද්‍යතාව පෙන්නුම් කරවන ගිණුම් වාර්තා නිසි ලෙස පවත්වාගෙන යාමටද අධ්‍යක්ෂවරු සහතික වේ. වාර්ෂික වාර්තාවේ දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන මගින් සමාගමේ එදිනෙදා කර්යයන් සත්‍ය හා සාධාරණ මතයක් අන්තර්ගත වන බවට ද අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රකාශ කර සිටී. සමාගමේ අභ්‍යන්තර පාලන පද්ධති පිළිබඳව සම්පූර්ණ වගකීම අධ්‍යක්ෂවරු වෙත පැවරේ. ද්‍රව්‍යාත්මක අවප්‍රකාශ හා වංචා වළක්වාලන අභ්‍යන්තර ක්‍රමවේද පවතින බව අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරමින් ඔවුන් විසින් ක්‍රියාත්මක අභ්‍යන්තර පිරික්සුම්, අභ්‍යන්තර විගණන, මූල්‍ය හා වෙනත් පාලන ක්‍රමවේදයන් මගින් වියහැකි ද්‍රව්‍යාත්මක අවප්‍රකාශ හා වංචා වළක්වා හෝ සාධාරණ කාලයක් තුළ දැන ගැනීමට හැකි වන පරිදි සියලුම වත්කම් ආරක්ෂා කරලීමටත් ගනුදෙනු නිසිලෙස සිදුකර දක්වීමට හැකිවන පරිදි සකසා ඇති බව සනාථ කරයි. ඉදිරි වසර ගණනාවක් පුරා අඛණ්ඩව පවත්වාගෙන යාමට අවශ්‍ය සම්පත් ප්‍රමාණාත්මකව ඇති බව අධ්‍යක්ෂවරුන්ගේ මතය වන අතර මූල්‍ය ප්‍රකාශන සැකසීමේදි අඛණ්ඩ පදනම නොවෙනස්ව අනුගමනය කරනු ඇත. සමාගමේ විගණකවරුන් වන වරලත් ගණකාධිකරුවන් වන අය්යර් සහ සමාගමට ඔවුන්ගේ වගකීම් ඉෂ්ට කිරීමට අවශ්‍ය සියලුම තොරතුරු සහ සහය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දී ඇත. විගණකරුවන් විසින් සියලුම මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය වාර්තා හා අදාළ දත්ත පරීක්ෂාකර ඔවුන්ගේ නිදහස් අදහස් පල කර ඇති අතර, එම වාර්තාවද මෙහි අඩංගු කර ඇත. සමාගම විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරන දිනට ගෙවීමට නියමිත දන්නා සියලුම බදු හා සමාග මේ සේවකයින් වෙනුවෙන් ගෙවිය යුතු ගෙවීම් සහ සමාගම විසින් ගෙවිය යුතු අනෙකුත් ව්‍යවස්ථාපිත ගෙවීම් ගෙවා අවසන් කර ඇති හෝ ගෙවීම් සිදු කිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කර ඇති බවට හෝ අධ්‍යක්ෂවරුන් සහතික වේ.

අධ්‍යක්ෂමණ්ඩලයේ නියෝගය පරිදි,



සීමාසහිත කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස්(පුද්) සමාගම

ලේකම්වරු . හලාවත වැවිලි සමාගම

# විගණන හා කළමනාකරණ කමිටුව

සීමාසහිත හලාවත වැවිලි සමාගමේ විගණන හා කළමනාකරණ කමිටුව 2013 ජූනි මස 2වැනි දින දරන යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශකය සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2010 දෙසැම්බර් මස 14වැනි දින දරන අංක පීඊඩී/ 55 චක්‍රලේඛය අනුව පිහිටුවන ලදී.

## 2013 වසර තුළ පහත දැක්වෙන දිනවල දී විගණන කමිටු රැස්වීම් පවත්වන ලදී:

- 2013 අප්‍රේල් මස 3
- 2013 ජූනි මස 28
- 2013 දෙසැම්බර් මස 27

## 2013 සැත්තැම්බර් දක්වා විගණන කමිටුවේ සාමාජිකයින් පහත පරිදි වෙති.

| නිලධාරියාගේ නම | තනතුර |
|---|---|
| 1. ප්‍රියංගනී ලියනගේ මහත්මිය | සභාපති- විගණන කමිටුව - හලාවත වැවිලි සමාගම |
| 2. ඩී. ඒ. ඩී. ආර්. දනන්සූරිය මහතා | සාමාජික - විගණන කමිටුව - හලාවත වැවිලි සමාගම |
| 3. අයි. එම්. ආර්. විද්‍යානගමගේ මහතා | සාමාජික - විගණන කමිටුව - හලාවත වැවිලි සමාගම |
| 4. ඒ. එම්. චන්ද්‍රපාල මහතා | විගණන කමිටුවේ අධීක්ෂක හා<br>සීමාසහිත හලාවත වැවිලි සමාගමේ විධායක අධ්‍යක්ෂ |

2013 සැප්තැම්බර් මස නව අධ්‍යක්ෂක මණ්ඩලයක් පත් කළ පසුව විගණන කමිටුවේ සංයුතිය පහත දැක්වෙන පරිදි වෙනස්විය:

| නිලධාරියාගේ නම | තනතුර |
|---|---|
| 1. ආර්. එම්. අමරතුංග මහතා | සභාපති- විගණන කමිටුව - හලාවත වැවිලි සමාගම |
| 2. ප්‍රියංගනී ලියනගේ මහත්මිය | සාමාජික - විගණන කමිටුව - හලාවත වැවිලි සමාගම<br>(භාණ්ඩාගාර නියෝජිත) |
| 3. කේ. බී. රත්නායක මහතා | සාමාජික - විගණන කමිටුව - හලාවත වැවිලි සමාගම |
| 4. අයි. එම්. ආර්. විද්‍යානගමගේ මහතා | සාමාජික - විගණන කමිටුව - හලාවත වැවිලි සමාගම |
| 5. ඒ. එම්. චන්ද්‍රපාල මහතා | විගණන කමිටුවේ අධීක්ෂක හා<br>සීමාසහිත හලාවත වැවිලි සමාගමේ විධායක අධ්‍යක්ෂ |

| විගණන කමිටු රැස්වීම් දිනය | සාකච්ඡාව සඳහා ගන්නා ලද විගණන හා පරීක්ෂණ වාර්තා ගණන |
|---|---|
| 2013 අප්‍රේල් මස 3 | 13 |
| 2013 ජූනි මස 28 | 12 |
| 2013 දෙසැම්බර් මස 27 | 15 |

නිත්‍ය හා හදිසි විමර්ශනයන්ට අමතරව, අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලය විසින් වතුවලින් ලැබුනු පාරිතෝෂිත වුවවර පනස් අටක් (58) පරීක්ෂා කර නිර්දේශය ලබා දී ඇතග

විගණන හා පරීක්ෂණ වාර්තා සුපරීක්ෂා කළ හලාවත වැවිලි සමාගමේ කළමනාකාරීත්වය අවශ්‍ය අවස්ථාවල තවදුරටත් පරීක්ෂණ පවත්වමින් අඩුපාඩු වැළැක්වීම සඳහා පිළියම් පියවර ගෙන ඇත.

AIYAR & CO.
Chartered Accountants.

"Havelock Central"
No. 104-4/1, Havelock Road,
Colombo 05,
Sri Lanka.
P.O.Box : 1029
Telephone : +94-11-2505516 - 17
Telefax : +94-11-2505518
Email : aiyar@slt.lk

## ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව

**සීමාසහිත හලාවත වැවිලි සමාගමේ** කොටස්කරුවන් වෙත,

මේ සමග ඇති සීමාසහිත හලාවත වැවිලි සමාගමේ මූල්‍ය ප්‍රකාශන අප විසින් විගණනය කරන ලද අතර, 2013 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය තත්ත්ව විස්තරය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශන, ස්කන්ධ වෙනස් වීමේ ප්‍රකාශන, මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශයක් සහ විස්තරාත්මක සටහන් වලින්ද මූල්‍ය ප්‍රකාශය සමන්විත වේ.

**මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකාරිත්වයේ වගකීම**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කොට ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් සමාගමේ කළමනාකාරිත්වය වගකීම දරුනු ලැබේ. එසේම ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් වලින් නිදහස්ව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හා ඉදිරිපත් කිරීමට අදාල අභ්‍යන්තර පාලනයන් නිර්මාණය කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම, නිසි ගිණුම්කරණ ප්‍රමිතීන් තෝරාගෙන ඒවා ක්‍රියාවට නැංවීමත් වාතාවරණයට සුදුසු වගකිව යුතු ගිණුම් තක්සේරු සිදු කිරීම කෙරෙහිද කළමනාකාරිත්වය වගකීම දරයි.

**විගණනකරුවන්ගේ වගකීම**

අපගේ වගකීම වනුයේ අපගේ විගණන කටයුතු පාදක කරගෙන මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මතයක් ප්‍රකාශ කිරීමයි. අපගේ විගණන කාර්යන් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව පවත්වන ලදී. මෙම ප්‍රමිතීන්වල අවශ්‍යතාවය වනුයේ විගණනය නිසි පරිදි සැලසුම් හා ක්‍රියාත්මක කර මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක වැරදි දැක්වීම්වලින් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා ගැනීමය.

මූල්‍ය ප්‍රකාශනයේ දත්ත සහ අනාවරණය කිරීම් සාධක සමග නියැදි පදනම මත පරීක්ෂා කර බැලීම අපගේ විගණන ක්‍රියාවලියට ඇතුලත් වේ. සමස්ථ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සඳහා කළමනාකාරිත්වය සකස් ලද වැදගත් ඇස්තමේන්තු සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති තක්සේරු කිරීම සහ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ඇගයීම විගණනයට ඇතුලත් වේ. අපගේ විගණනය සඳහා අපගේ ප්‍රශස්ථ දැනුම සහ විශ්වාසය පරිදි අවශ්‍ය වූ තොරතුරු සහ විස්තාවරණයන් අප ලබා ගෙන තිබේ. එම නිසා අපගේ නිගමනයන්ට අනුව විගණනය කිරීම් තුළින් සාධාරණ මතයක් ප්‍රකාශ වන බව අපගේ විශ්වසයයි.

**නිගමනය**

අපගේ නිරීක්ෂණය වලින් අනාවරණය වන පරිදි 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මෙම සමාගම නිසි ගිණුම් වාර්තා පවත්වාගෙන ඇති බව අපගේ මතයයි. 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළදී සමාගමේ ක්‍රියාකාරී කටයුතු පිළිබඳව සත්‍ය හා සාධාරණ දර්ශනයක් මූල්‍ය ප්‍රකාශයන් තුළින් පෙන්නුම් කරන අතර එකී කටයුතු ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සිදුකර ඇත.

**අනෙකුත් නිත්‍යානුකූල සහ පාලන අවශ්‍යතා ගැන වාර්තාව**

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතේ 151(2) වගන්තියට අනුකූල බව ප්‍රකාශ කරමු.

වරලත් ගණකාධිකාරීවරු කොළඹ

2014 මැයි මස 30 වන දින

AIYAR & CO. COLOMBO Chartered Accountants

Partners : E. Ruwan J. Perera ACA,ACMA,ACPM,MFE (Colombo) Joseph Jayaseelan BBMgt, ACA, ATTII (SL)
Consultant : Lal Nanayakkara BA (CEY), FCA

*" An independent Firm, in association with Moore Stephens International Limited, Members in Principal cities throughout the World"*

AIYAR

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

| 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා | සටහන් | 2013 රු. | 2012 රු. |
|---|---|---|---|
| අයභාරය | 20 | 287,152,154 | 339,050,649 |
| විකුණුම් පිරිවැය | | (174,262,628) | (215,317,782) |
| දළ ලාභය | | 112,889,525 | 123,732,868 |
| වෙනත් මෙහෙයුම් ආදායම් සහ ලැබීම් | 21 | 76,206,174 | 56,977,730 |
| පරිපාලන වියදම් | | (92,660,057) | (94,649,771) |
| වෙනත් මෙහෙයුම් වියදම් | | (8,613,780) | (12,315,133) |
| මෙහෙයුම් තුලින් ජනනය වූ ලාභය | | 87,821,863 | 73,745,695 |
| මූල්‍ය ආදායම | | 21,167,854 | 37,463,655 |
| මූල්‍ය පිරිවැය | 22 | (27,169,196) | (24,984,006) |
| බදු පෙර ලාභය | 23 | **81,820,521** | 86,225,344 |
| බදු වියදම් | 24 | (8,072,974) | (8,250,497) |
| වර්ෂයේ ලාභය | | 73,747,547 | 77,974,847 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | (828,622,) | - |
| වර්ෂයට මුළු විස්තීර්ණ ආදායම් බදු පසු | | 72,918,925 | 77,974,847 |
| කොටසක ඉපැයුම | 25 | 3.69 | 3.90 |

වරහන් තුල ඇත්තේ අඩුකිරීමය
පිටු අංක 45 සිට 67 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශණවලම කොටසක් වේ.

හලාවත
2014 මැයි මස 30 දින

AIYAR & CO. COLOMBO Chartered Accountants

# මූල්‍ය තත්ව ප්‍රකාශනය

| 2013 දෙසැම්බර් 31 දිනට | සටහන් | 2013 | 2012 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| ජනවසම / ශ්‍රීලංරාවැස වතුවල හිස් භූමි වල කල්බදු හිමිකම් | 04 | 84,554,871 | 87,243,593 |
| ජනවසම / ශ්‍රීලංරාවැස වතුවල කල්බදු දේපල පිරයත හා උපකරණ හිමිකම් (භාවිතයට ගැනීමට අයිතියක් ඇති ඉඩම් කල් බදු ජෛව හිමිකම් හැර) | 05 | 4,584,953 | 5,635,000 |
| ජනවසම / ශ්‍රීලංරාවැස වතු යායන් වල කල්බදු ජෛව වත්කම් | 06 | 40,919,718 | 44,357,591 |
| ජෛව වත්කම් (කල්බදු ජෛව වත්කම් හැර) | 07 | 470,345,817 | 369,375,094 |
| සින්නක්කර දේපල පිරයත හා උපකරණ හිමිකම් | 08 | 137,091,894 | 95,998,453 |
| | | 737,497,255 | 602,609,732 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 09 | 71,397,657 | 82,605,641 |
| අලෙවියට තබා ඇති වත්කම් | 10 | - | 4 |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | 11 | 28,790,674 | 43,256,800 |
| රාජ්‍ය ආයතන වලට සපයන ලද මූල්‍ය පහසුකම් | 12 | 119,757,808 | 119,757,808 |
| වෙනත් ජංගම වත්කම් | | 1,430,790 | 4,678,016 |
| කෙටි කාලින ආයෝජන | 13 | 128,995,973 | 199,377,169 |
| මුදල් හා බැංකු ශේෂයන් | | 5,857,391 | 4,556,010 |
| | | **356,230,292** | **454,231,447** |
| **මුළු වත්කම්** | | **1,093,727,547** | **1,056,841,179** |
| **ස්කන්ධය හා වගකීම්** | | | |
| **ප්‍රාග්ධනය හා සංචිත** | | | |
| කොටස් ප්‍රාග්ධනය | 14 | 200,000,010 | 200,000,010 |
| රඳවා ගත් ඉපයීම් | | 625,541,816 | 587,622,891 |
| **මුළු ස්කන්ධය** | | 825,541,826 | 787,622,901 |
| **ජංගම නොවන වගකීම් සහ විලම්බිත ආදායම්** | | | |
| විලම්භිත බදු බැරකම | 15 | 42,524,772 | 32,669,159 |
| විලම්භිත ආදායම්,- ප්‍රදාන හා ආධාර | 16 | 8,048,742 | 8,477,900 |
| විශ්‍රාමික ප්‍රතිලාභ පාරිතෝෂිත බැඳීම් | 17 | 58,780,004 | 52,645,432 |
| කල්බදු ගිවිසුම යටතේ ඇති බැඳියාවන් -. ජනවසම | 18 | 113,380,484 | 115,277,115 |
| | | 222,734,003 | 209,069,607 |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ හා අනෙකුත් ගෙවීමට ඇති දෑ | 19 | 45,559,744 | 54,477,057 |
| ආදායම් බදු බැරකම් | | (2,004,657) | 3,847,930 |
| කල්බදු ගිවිසුම යටතේ ඇති බැඳියාවන් ජනවසම | 18 | 1,896,631 | 1,823,684 |
| | | 45,451,718 | 60,148,671 |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | | **1,093,727,547** | **1,056,841,179** |

වරහන් තුල ඇත්තේ අඩුකිරීමිය

පිටු අංද 45 සිට 67 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශණවලම කොටසක් වේ

**සහතික කිරීම**

2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධාන වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශය පිලියෙල කර ඇති බව සහතික කරමි.

AIYAR & CO. COLOMBO Chartered Accountants

ආර්. එම්. ආර්. බි. රත්නායක

ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී

මූල්‍ය වාර්තා සැකසීම හා ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර අත්සන් තබනු ලැබේ.

පණ්ඩුක ජයසිංහ මහතා
සභාපති හලාවත

ප්‍රියංගනි ලියනගේ මිය
අධ්‍යක්ෂිකා

හලාවත
2014 මැයි මස 30 දින

# ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා

| | කොටස් ප්‍රාග්ධනය | සමුච්චිත ලාභය | එකතුව |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| 2012 ජනවාරි 01 දිනට ශේෂය | 200,000,010 | 584,648,044 | 784,648,054 |
| වර්ෂයේ ශුද්ධ ලාභය | - | 77,974,847 | 77,974,847 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | - | - | - |
| මුළු විස්තීර්ණ ආදායම් | - | 77,974,847 | 77,974,847 |
| ලාභාංශ ගෙවීම් | - | (75,000,000) | (75,000,000) |
| **2012 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **200,000,010** | **587,622,891** | **787,622,901** |
| වර්ෂයේ ශුද්ධ ලාභය | | 73,747,547 | 73,747,547 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | (828,622) | (828,622) |
| මුළු විස්තීර්ණ ආදායම් | 200,000,010 | 660,541,816 | 860,541,826 |
| ලාභාංශ ගෙවීම් | | (35,000,000) | (35,000,000) |
| **2013 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **200,000,010** | **625,541,816** | **825,541,826** |

වරහන් තුල ඇත්තේ අඩුකිරීමය

පිටු අංක 45 සිට 67 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශණවලම කොටසක් වේ

හලාවත
2014 මැයි මස 30 දින

AIYAR & CO.
COLOMBO
Chartered Accountants

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා | 2013 රු. | 2012 රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ / සඳහා (යෙදවූ) මුදල් ප්‍රවාහය** | | |
| බදු පෙර ලාභය | 81,820,521 | 86,225,344 |
| **ගැලපීම්** | | |
| - ක්ෂයවීම්/ක්‍රමක්ෂයවීම් | 35,298,925 | 29,737,646 |
| - සේවක ලාභ කොටස් සඳහා වෙන් කිරීම් | 5,386,761 | 4,659,781 |
| - ප්‍රදාන සඳහා වූ ක්‍රමක්ෂයවීම් | (429,158) | (399,738) |
| - රාජ්‍ය කල්බදු සඳහා ගාස්තු | 27,169,196 | 24,984,006 |
| - පෙර වර්ෂයේ ගැලපීම් (පාරිතොෂික ගැලපීම්) | 863,379 | - |
| - මූල්‍ය ආදායම් | (21,167,854) | (37,463,655) |
| - විශේෂිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය | 11,756,041 | 5,035,583 |
| - දේපල පිරියත හා උපකරණ අපහරණය කිරීමෙන් ලත් ලාභය | (15,795,773) | (9,984,481) |
| - සම්බන්ධිත අදාල පාර්ශවයන්ගෙන් අයවිය යුතු ලියා හැරි ශේෂය | - | 2,157,952 |
| - ලියා හරින ලද දේපල පිරියත හා උපකරණ | - | 263,196 |
| | 124,902,038 | 105,215,633 |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීම්** | | |
| - තොගවල (වැඩිවීම්)/අඩුවීම් | 11,207,984 | 11,689,618 |
| - කිරි පශු සම්පත් | (4,739,500) | 203,000 |
| - වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ වල (වැඩිවීම්)/අඩුවීම් | 6,774,194 | 4,406,261 |
| - වෙනත් ජංගම වත්කම් | 3,247,226 | 7,917,729 |
| - බීජ ගෙඩි ව්‍යාපෘති සඳහා ලත් අත්තිකාරම් | - | (27,203,347) |
| - වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | (2,871,833) | (2,030,626) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | 138,520,108 | 100,198,268 |
| - විශේෂිත ප්‍රතිලාභ සැලසුම් ගෙවීම් | (5,621,469) | (3,121,051) |
| - සේවක ලාභ කොටස් සඳහා ගෙවීම් | (4,672,272) | (7,576,006) |
| - කල්බදු ගෙවීම් | (33,929,164) | (17,961,532) |
| - මූල්‍ය ආදායම් ලැබීම් | 28,859,786 | 30,123,342 |
| - අය බදු ගෙවීම් | (5,852,587) | (8,362,878) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | 117,304,402 | 93,300,144 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | |
| - දේපල පිරියත හා උපකරණ එකතු කිරිමෙන් | (63,775,030) | (8,087,807) |
| - ක්ෂේත්‍ර සංවර්ධන වියදම් | (102,320,954) | (64,399,924) |
| - දේපල පිරියත හා උපකරණ අලෙවියෙන් ලැබීම් | 16,535,450 | 10,119,184 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | (149,560,533) | (62,368,547) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මූල්‍ය ප්‍රවාහය** | | |
| - ලාභාංශ ගෙවීම් | (35,000,000) | (75,000,000) |
| - රාජ්‍ය කල්බදු සඳහා ප්‍රාග්ධන පියවීම් | (1,823,684) | (1,753,542) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | (36,823,684) | (76,753,542) |
| **මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | (69,079,815) | (45,821,945) |
| වසර ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ වල වටිනාකම (සටහන අ) | 203,933,178 | 249,755,123 |
| වසරාවසානයේ මුදල් හා මුදල් සමාන දෑ වල වටිනාකම (සටහන ආ) | **134,853,363** | **203,933,178** |
| සටහන අ | | |
| මුදල් හා මුදල් වලට සමාන දෑ වසරාම්භයේ | | |
| කෙටි කාලීන ආයෝජන | 199,377,169 | 244,813,796 |
| මුදල් හා බැංකු ශේෂය | 4,556,010 | 4,941,327 |
| | 203,933,178 | 249,755,123 |
| සටහන ආ | | |
| මුදල් හා මුදල් වලට සමාන දෑ වසරාවසානයේ | | |
| කෙටි කාලීන ආයෝජන | 128,995,973 | 199,377,169 |
| මුදල් හා බැංකු ශේෂය | 5,857,391 | 4,556,010 |
| | **134,853,363** | **203,933,178** |

වරහන් තුල ඇත්තේ අඩුකිරීමය
පිටු අංක 45 සිට 67 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශණවලම කොටසක් වේ

හලාවත
2014 මැයි මස 30 දින

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

2013 දෙසැම්බර් 31 අවසන් වර්ෂය

## 1 සංස්ථාපිත තොරතුරු

### 1.1 වාර්තාකරන ස්ථිතිය

#### 1.1.1 පදිංචි හා නෛතික ආකෘතිය

සීමාසහිත හලාවත වැවිලි සමාගම (සමාගම) 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ (සමාගම 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ යළි ලියාපදිංචි කරන ලදී) සහ 1987 අංක 23 දරන ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත අනුව ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති සහ පිහිටුවා ඇති සීමාසහිත පොදු වගකීම් සමාගමක් වේ.

සමාගමේ ලියාපදිංචි කාර්යාලය හලාවත, පුත්තලම පාර, අංක 165 යන ලිපිනයේ පිහිටා ඇති අතර කොළඹ කාර්යාලය කොළඹ 01, ඩියුක් වීදිය, අංක 11, සීඩීජ් ගොඩනැගිල්ල, බිම් මහළ යන ලිපිනයේ පිහිටා ඇත. වතුයායවල් හලාවත, පුත්තලම, කුරුණෑගල. සහ ගම්පහ යන වැවිලි දිස්ත්‍රික්කවල පිහිටා ඇත.

#### 1.1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

පොල් වගා කිරීම, කොප්පරා නිෂ්පාදනය හා අමු පොල් හා කොප්පරා අලෙවිය වසර තුළ සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් විය.

#### 1.1.3 මව් ආයතනය සහ අවසන් මුල් ව්‍යාපාරය

සමාගමේ මව් ආයතනය වනුයේ ශ්‍රී ලංකා රජය යි.

### 1.2 නිකුත් කිරීම සඳහා බලය දීමේ දිනය

2014 මැයි මස 30 වැනි දින දරන අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනාවක් අනුව 2013 දෙසැම්බර් මස 31වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා හලාවත වැවිලි සමාගමේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා බලය ලබා දෙන ලදී.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

2013 දෙසැම්බර් 31 අවසන් වර්ෂය

## 2 සකස් කිරීමේ පදනම

### 2.1 අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශනය

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිතීන් පිළිබඳ 1995 අංක 15 දරණ පනත යටතේ, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය (CASL), විසින් ප්‍රසිද්ධ කරන ලද (SLFRS/LKAS) සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධාන වලට අනුකූලව සකසා ඇත.

### 2.2 ඇගයීම් පදනම

මූල්‍ය ප්‍රකාශනවල අංක 05, 06 සහ 07 දරන සටහන්වල විස්තර කර ඇති පරිදි ප්‍රත්‍යාගණනය කර ඇති JEDB/SLSPC වතුවල බද්දට දී ඇති වත්කම් හැරුණු කොට ඓතිහාසික පිරිවැය පදනම මත මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. යෝග්‍ය අවස්ථාවල දී විශේෂ ප්‍රතිපත්ති පසුව එළැඹෙන සටහන්වල විස්තර කර ඇති අතර මූල්‍ය ප්‍රකාශනවල ඇති උද්ධමනීය සාධක සඳහා කිසිදු ගැලපීමක් සිදු කර නැත.

### 2.3 භාවිතා කරන සහ ඉදිරිපත් කරන මුදල් ඒකකය

සමාගමේ භාවිතා කරන හා ඉදිරිපත් කරන මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් මගින් මෙම මූල්‍ය ප්‍රකාශන ඉදරිරිපත් කර ඇත. ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිරිපත් කර ඇති සියලු මූල්‍ය තොරතුරු ආසන්න රුපියලේ අගයට දක්වා ඇත.

### 2.4 ඇස්තමේන්තු හා තීන්දු භාවිතා කිරීම

ශ්‍රී ලංකා ගිණුම්මකරන ප්‍රමිතීන්වලට අනුකූලවන පරිදි මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා අදාළ කර ගනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තා කර ඇති වත්කම්, බැරකම්, ආදායම සහ වියදම් යනාදියට බලපාන්නා වූ තීරණ, ඇස්තමේන්තු සහ උපකල්පිතයන් තීරණය කිරීමට කළමනාකරණයට සිදු වේ. තීරණ හා ඇස්තමේන්තු වාතාවරණ යටතේ සාධාරණ වන බවට විශ්වාස කරන අපේක්ෂාවන් ඇතුළු ඓතිහාසික අත්දැකීම් හා අනෙක් සාධක මත පදනම් වේ. එබැවින් සත්‍ය අත්දැකීම් සහ ප්‍රතිඵල මෙම තීරණ හා ඇස්තමේන්තුවලට වඩා වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු හා පාදක වූ උපකල්පන කෙරීගෙන යන පදනම මත විශ්ලේෂණය කරනු ලැබේ. ඇස්තමේන්තු සංශෝධනය කරන ඇති කාලපරිච්ඡේදයට පමණක් එම සංශෝධන බලපාන්නේ නම් එම කාලපරිච්ඡේදය තුළ ගිණම්කරණ ඇස්තමේන්තු සංශෝධනය ද සිදු කරනු ලැබේ.

### 2.5 අඛණ්ඩබව

ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව කර ගෙන යාම සඳහා සමාගමේ හැකියාව සමාගමේ කළමනාකරීත්වය විසින් ඇගයීමට ලක් කර ඇති අතර දැනගත හැකි අනාගත කාලයක් දක්වා ව්‍යාපාර කටයුතු අඛණ්ඩව කර ගෙන යාමට අවශ්‍ය සම්පත් සමාගමට තිබෙන බවට සෑහීමකට පත් විය. තව ද ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව කර ගෙන යාමේ සමාගමේ හැකියාව කෙරෙහි සැලකිය යුතු තරමේ සැකයක් ඇති කළ හැකි කිසියම් වැදගත් අවිනිශ්චිතතාවන් පිළිබඳව කළමනාකාරීත්වය නොදනී. අඛණ්ඩබව පදනම මත පාදකව මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩව සකස් කරනු ලැබේ.

### 2.6 සංසන්දනාත්මක තොරතුරු

සමාගම ගිණුම්කරණ ප්‍රතිපත්ති නිරන්තරයෙන් යොදා ගෙන ඇති අතර වෙනත් ආකාරයකින් දක්වා ඇත්තේ මිස පෙර වසරේ දී යොදා ගත් ඒවාට අනුකූලව වන අතර ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කිරීමට ගැලපෙන පරිදි පෙර වර්ෂයේ සංඛ්‍යා හා ලේඛණ නැවත සකස් කර ඇත.

### 2.7 වාර්තාකරන දිනයෙන් පසු හටගත් සිද්ධීන්

වාර්තාකරන දිනයෙන් පසු හටගත් සියලුම වැදගත් සිද්ධීන් සැලකිල්ලට ගෙන ඇති අතර සුදුසු අවස්ථාවල දී මූල්‍ය ප්‍රකාශවල ගැලපීම හෝ අනාවරණය කිරීම සිදු කර ඇත.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

2013 දෙසැම්බර් 31 අවසන් වර්ෂය

## 3 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

### 3.1 වත්කම් හා ඒවායේ අගය කිරීම් සඳහා පදනම්

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කළ වත්කම් මුදල් හා සමාගමේ සාමාන්‍ය ව්‍යාපාර කටයුතු අතරතුර දී හෝ වාර්තා කරන දිනයේ සිට වසරක කාලපරිච්ඡේදයක් ඇතුලත යන දෙකෙන් අඩු කාලය තුළ මුදල් බවට පත් කරනු ලබන දේ වේ. වර්තා කරන දිනයේ සිට වසරක් කාලයකට වඩා වැඩි කාල පරිච්ඡේදයක් සඳහා සමාගම රදවා ගැනීමට අපේක්ෂා කරන වත්කම් ජංගම වත්කම් හැරුණු අනෙක් වත්කම් වේ.

### 3.1.1 දේපල, පිරියත හා උපකරණ

#### 3.1.1.1 හඳුනා ගැනීම සහ ඇගයීම

දේපළ, පිරියත හා උපකරණ ඒවායේ පිරිවැය මත (හෝ කල්බදු හිස් ඉඩම් නම් ඒවායේ තක්සේරු වටිනාකමට) සමුච්චිත ක්ෂය වෙන් කිරීම් හා අපහානයන් සිදුවී ඇත්නම් එහි අලාභය අඩු කිරීමෙන් පසු දක්වයි.

**(අ) සන්තක දේපල**

දේපළ,පිරියත හා උපකරණ එය සන්තක කර ගැනීමේදී දැරූ සෘජු පිරිවැයයි. ස්වයං නිෂ්පාදිත වත්කමක් නම් එම භාණ්ඩය අදාළ කාර්යට සුදුසු තත්ත්වයට ගෙන ඒමට දැරූ සියලු පිරිවැය එනම් ද්‍රව්‍ය,සෘජු ශ්‍රමය යනාදියද ඇතුළත් වේ. උපකරණ ක්‍රියාකාරිත්වයට මිලදී ගත් මෘදුකාංග අදාළ උපකරණයේ අඛණ්ඩ ක්‍රියාවලියේ කොටසක් ලෙස ප්‍රාග්ධනිත කර ඇත.

දේපල, පිරියත හා උපකරණ වල යම් කිසි සුවිශේෂ කොටස් යම් කාලසීමා වලදී මාරු කිරීම් සිදුකරන අවස්ථාවලදී පිළිවෙලින් එම කොටස් ඵලදායි ආයු කාලයක් හා ක්ෂය කල හැකි තනි ඒකක වශයෙන් සලකා කටයුතු කරයි. එසේම ප්‍රධාන පරීක්ෂණයක් පවත්වනු ලබන අවස්ථාවලදී සියලු නිර්නායකයන් සපුරා ඇත්නම් එහි පිරිවැය හඳුනාගනු ලබන්නේ පිරියත හා උපකරණ පවත්වාගෙන යන ප්‍රමාණයට ප්‍රතිස්ථාපනයක් සේ සළකනු ලැබීමෙන්ය. අනිකුත් සියලුම අලුත්වැඩියා හා නඩත්තු විස්තීර්ණ ප්‍රකාශනයේ වියදම් ලෙස දක්වේ. නොනිමි ප්‍රාග්ධන, ඊට අදාළ වත්කම් වලට මාරු කරනු ලබන්නේ එහි ප්‍රථම භාවිතයේදී හෝ වත්කම් ක්‍රියාත්මක කරන අවස්ථාවේදීමය.

ප්‍රාග්ධන කෙරී ගෙන යන වැඩ පළමු උපයෝජනයේ දී හෝ වත්කම ආරම්භ කරන වේලාවේ දී එක් එක් වත්කම් ගිණුම්වලට මාරු කරනු ලැබේ.

**(ආ) කල්බදු වත්කම්**

මූල්‍ය කල්බදු යටතේ ලබාගත් දේපල, පිරියත හා උපකරණ (බදු ගත් භාණ්ඩ යහිමි කරගැනීමෙන්සමාගමට අවදානමක් හෝ වාසියක් සෘජුවම ලැබෙන්නේ නම්) ඒවායේ සාධාරණ වටිනාකම හා අවම වර්ථමාන කල්බදු වටිනාකමින් අඩු අගය මත ප්‍රග්ධනිතකරණය කර සමාගම විසින් එම වත්කම් භාවිතා කිරීමට අපේක්ෂා කරන කාලපරිච්ඡේදය පුරා ක්‍රමක්ෂය කර දක්වයි.බදුකරුට ගෙවීමට ඇති ප්‍රාග්ධන වටිනාකමට සමාන ප්‍රමාණය වගකීම් ලෙස පෙන්වා ඇත. එක් එක් මූල්‍ය වර්ෂයේදී ගෙවන බදු වාරිකය තුළ අන්තර්ගත පොලී ප්‍රමාණය එම වර්ෂයේ වියදමක් ලෙස විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට හර කරනු ඇත. මෙයින් එකම අනුපාතයක් යටතේ සෑම වර්ෂයක් අවසානයේම පවතින බදු වගකීම් ශේෂයට පොලී ගණනය වීම සිදුවේ.බදු දේපල වැඩි දියුණු කිරීම සඳහා දරනු ලබන වියදම් ප්‍රාග්ධනීකරණය කර ඉතිරි බදු කාලය හෝ ඇස්තමේන්තු කරන ලද ඵලදායී ජීවිත කාලය හෝ යන දෙකෙන් අඩු කාලපරිච්ඡේදය තුළ ක්ෂය කරනු ලබයි.

#### 3.1.1.2 පසුකාලීන පිරිවැය

දේපල, පිරියත හෝ උපකරණයක කොටස් ප්‍රතිස්ථාපනය කිරීමේදි දරණ පිරිවැය එම කොටස පවත්වාගෙනයන ප්‍රමාණය, එම කොටසෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලා එනු ඇති බව සහ එය නිශ්චිතව මැනීමට හැකි නම් එය වත්කමක් ලෙස හඳුනා ගනු ඇත. පවත්වාගෙන යන ප්‍රතිස්ථාපන කොටස් පහත දක්වා ඇති ප්‍රතිපත්තියට අනුව නොහැඳිනීම් ලෙස හඳුන්වයි. දේපල, පිරියත සහ උපකරණ වලට දෛනිකව කරන නඩත්තු වර්ෂයේ ලාභ හෝ පාඩු ලෙස හඳුනා ගැනේ.

#### 3.1.1.3 හඳුනා නොගැනීම

දේපල, පිරියත හා උපකරණ වල යම් කිසි කොටසක් බැහැර කිරීමේදී හෝ කොටස මත අනාගත ආර්ථිකප්‍රතිලාභ නැතැයි හැගෙන අවස්ථාවලදී එය වත්කමක් ලෙස හඳුනා නොගනී. නොහැඳිනීම් තුළින් ලැබන ලැබීම් හා පාඩු, ලාභ හෝ පාඩු වශයෙන් සළකන අතර ප්‍රතිලාභ අයහාරය ලෙස වර්ගීකරණය නොකරයි.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

2013 දෙසැම්බර් 31 අවසන් වර්ෂය

### 3.1.1.4 ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය

**(අ) ක්ෂයවීම්**

දේපල, පිරියත හා උපකරණ භාණ්ඩවල සරල මාර්ග ක්‍රමය මත පදනම්ව ඒ එක් එක් දේපල, පිරියත හා උපකරණ භාණ්ඩවල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා ක්ෂය ගණනය කරනු ලැබේ. වර්තමාන හා තුලනාත්මක කාලයන් සඳහා ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිත කාලය පහත පරිදි වේ:

| | වසර ගණන | අනුපාතිකය (%) |
|---|---|---|
| ගොඩනැගිලි | 40 | 2.50 |
| පිරියත හා යන්ත්‍රසූත්‍ර | 15 | 6.67 |
| ගෘහ භාණ්ඩ හා මෙවලම් | 10 | 10.00 |
| මෝටර් රථ | 05 | 20.00 |
| උපකරණ | 08 | 12.50 |
| ස්ථිර ඉඩම් සංවර්ධනය | 30 | 3.33 |
| වැට සැකසීම | 03 | 33.33 |
| ජල සැපයුම | 20 | 5.00 |

වත්කම් ක්ෂයවීම එය භාවිතය සඳහා ලද හැකි අවස්ථාවේ ආරම්භ වී එය අලෙවිය සඳහා තබා ඇති බවට හෝ හදුනා නොගන්නා බවට වර්ගීකරණය කර ඇති දිනයේ දී අවසන් වේ. ක්ෂය ක්‍රම ප්‍රයොජනවත් ජීවිතය හා අවශේෂ වටිනාකම් වර්තා කරන දිනයේ දී නැවත ඇගයීම සිදු කරනු ලබන අතර යෝග්‍ය වන්නේ නම් අනාගතයේ දී ගලපනු ලැබේ.

**(ආ) ක්‍රමක්ෂය**

මූල්‍ය කල්බදු යටතේ රඳවා ගත් වත්කම් බදු කාලය අවසානයේ දී සමාගම ඒවායේ හිමිකාරත්වය ලබා ගන්නා බවට සහතික නම් සමාන අයිතිය ඇති වත්කම්වල ප්‍රයෝජනවත් ජීවිත කාලයන් යන දෙකෙන් අඩු කාලයේ දී ක්‍රමක්ෂය කරනු ලැබේ. JEDB/SLSPC මඟින් අත්කර ගත් ඉඩම පිළිබඳ බදු කාල පරිච්ඡේදය 2045 දී අවසන් වේ.

JEDB/SLSPC මඟින් අත්කර ගත් වත්කම්වල බදු අයිතිය ඉතිරි බදු කාලය සහ ප්‍රයෝජනවත් ජීවිතය යන දෙකෙන් අඩු කාලය තුළ සමාන කොටස්වලින් ක්‍රමක්ෂය කරනු ලබන අතර වර්තමාන හා තුලනාත්මක කාලච්ඡේද සඳහා ඇස්තමේන්තු කළ ඵලදායී ජීවිත කාලය පහත දැක්වෙන පරිදි වේ:

| | වසර ගණන | අනුපාතිකය (%) |
|---|---|---|
| හිස් ඉඩමට ඇති බදු අයිතිය | 53 | 1.89 |
| ඉඩමේ වැඩි දියුණු කිරීම් | 30 | 3.33 |
| පැවරූ වත්කම් | 30 | 3.33 |
| ගොඩනැගිලි | 25 | 4.00 |
| යන්ත්‍රසූත්‍ර | 15 | 6.67 |
| ජල සැපයුම | 20 | 5.00 |

### 3.1.2 ජෛව විද්‍යාත්මක වත්කම්

### 3.1.2.1 නොමේරූ හා මේරූ වගා

**(අ) නිශ්චල කල්බදු හිමිකම ඇති ජෛව විද්‍යාත්මක වත්කම් ( නොමේරූ හා මේරූ වගා )**

වැවිලි වතු පෞද්ගලීකරනය අවස්ථාවේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරීන්ගේ ආයතනයේ UITF රීතිය අනුව JEDB/SLSPC වතුයායවල මූල්‍ය කල්බදු යටතේ තිබූ නිශ්චල කල්බදු හිමිකම ඇති ජෛවවිද්‍යාත්මක වත්කම් (අපරිණත හා පරිණත වැවිලි) 1992 ජුනි 22වැනි දින සිට අතීතයට බලපාන පරිදි සමාගමේ ගිණුම් යටතට ගෙන ඇත.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

2013 දෙසැම්බර් 31 අවසන් වර්ෂය

කල්බදු හිමිකම ඇති ජෛවවිද්‍යාත්මක වත්කම් (අපරිණත හා පරිණත වැවිලි) ක්‍රමක්ෂය සරල මාර්ග ක්‍රමය පදනම මත ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිත කාලය මත විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගෙන ඇති අතර වර්තමාන හා තුලනාත්මක කාලච්ඡේද සඳහා ඇස්තමේන්තු කළ ප්‍රයෝජනවත් ජීවිත කාලය පහත දැක්වෙන පරිදි වේ:

| | වසර ගණන | අනුපාතිකය (%) |
|---|---|---|
| මේරු වැවිලි | 30 | 3.33 |

### (ආ) කල්බදු දේපල සංවර්ධනය (නොමේරු සහ මේරු වගා)

වගා කරන කාලය තුළ එනම්, භූමිය සකස් කිරීම, පුණරුත්ථාපනය, අලුත් වගා කිරීම. නැවත වගා කිරීම,අන්තර වගා කිරීම්, සහ නව වගා සඳහා පොහොර යෙදීම ආදියේ සිට අස්වැන්න නෙලීමදක්වා (වගාව මේරු තත්වයට පත් වන තුරු) වූ පිරිවැය නොමේරු වගා යටතට ගැනේ. ඵල දැරීමආරම්භ වන වර්ෂයේදී මේරු වගා යටතට මාරු කරනු ඇත.මෙම නොමේරු වගා ඍජු පිරිවැය සහඅන්තර්ග්‍රහනය කරන ලද පොදු කාර්යය පිරිවැය වලින් සමන්විත වේ.කල්බදු ඉඩම් සංවර්ධනය ක්ෂයවීම් විස්තීර්ණ ආදායම් වල සරල මාර්ග පදනමට අනුකූලව බදු කාලයඅවසන් වීමට ඇති කාලය හෝ සංවර්ධනයේ ඵලදායි ආයු කාල සීමාව හෝ, දෙකෙන් අඩු එක ලෙසහඳුනා ගනු ඇත.ඇස්තමේන්තු ගත වර්තමාන සහ සංසන්දනාත්මක ඵලදායි ආයු කාලය පහත දක්වා ඇත.

| | වසර ගණන | අනුපාතිකය (%) |
|---|---|---|
| පොල් | 50 | 2.00 |
| කජු | 25 | 4.00 |
| වෙනත් | 20 | 5.00 |

### 3.1.2.2 කිරි ගව සම්පත

ගව පශු සම්පත් මනිනු ලබන්නේ ඒවායේ සාධාරණ අගයයෙන් විකුණුම් පිරිවැය අඩු කිරීමෙනි. ජාතික පශු සම්පත් මණ්ඩලය විසින් නිකුත් කරන ලද චක්‍ර ලේඛයට අනුව පශු සම්පත් සාධාරණ අගය තීරණය කරනු ලැබේ.

.

### 3.1.3 අලෙවිය සඳහා ඇති ජංගම නොවන වත්කම්

අඛණ්ඩ භාවිතයට වඩා මූලිකව විකිණීම තුළින් අයකර ගැනීමට බලාපොරොත්තු වන ජංගම නොවන වත්කම් විකිණීම සඳහා වෙන්කර ඇති දෑ ලෙස වර්ගීකරණය කෙරේ. විකිණීමට තබා ඇති වත්කම් එසේ කිරීමට ආසන්නතම අවස්ථාවේ ඒවායේ ධාරණ අගය හෝ සාධාරණ වටිනාකමින් විකුණුම් පිරිවැය අඩු කර ලැබෙන අගය යන දෙකෙන් අඩු අගය සේ සැලකේ. පවතින තත්ත්වයෙන්ම විකිණීමේ ඉහළ සම්භාව්‍යතාවයක් ඇති ජංගම නොවන වත්කම් විකිණීමට ඇති දෑ ලෙස වර්ගීකරණය කරනු ඇත."විකිණීමට වෙන්කර ඇතිදෑ" ලෙස වර්ගීකරණය කළ දේපල, පිරියත හෝ උපකරණ ක්ෂය කිරීමට හෝ ක්‍රමක්ෂය කිරීමකට භාජනය නොවේ.

### 3.1.4 තොග

තොග පිරිවැය හා ඇස්තමේන්තු ගත ශුද්ධ උපලබ්ධි වටිනාකම මත අභාවිත හා මන්දගාමීව අලෙවි වන ද්‍රව්‍ය සඳහා අවශ්‍ය වෙන් කිරීම් සිදු කිරීමෙන් පසුව අගයන්ගෙන් අඩු අගය මත ගණනය කර දක්වා ඇත. ශුද්ධ උපලබ්ධි අගය යනු උපලබ්ධි පිරිවැය ප්‍රතිපාදන සලසා හා/හෝ දැනට පවත්නා තත්වයෙන් විකිණිය හැකි තලයට පරිවර්තන පිරිවැයට සිදු කර සාමාන්‍ය ව්‍යාපාරික ක්‍රමවේදය අනුව තොග විකිණිය හැකි මිල ගණන්ය.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

2013 දෙසැම්බර් 31 අවසන් වර්ෂය

බඩු ලේඛණ ඒවායේ වර්තමාන ස්ථානයට හා තත්ත්වයට රැගෙන ඒම සඳහා දැරූ පිරිවැය පහත දැක්වෙන සූත්‍රය භාවිතා කර ගණනය කරනු ලැබේ.

| යෙදවුම් ද්‍රව්‍ය පරිභෝගික භාණ්ඩ හා අමතර දෑ | පෙර පිවිසි පෙර නිකුත් පදනම මත සැබෑ පිරිවැය |
|---|---|
| බෝග වැවීම - තවාන් | සෘජු ද්‍රව්‍ය, සෘජු ශ්‍රමය පිරිවැය හා සෘජුව ආරෝපණය කළ හැකි පොදු කාර්යය පිළිබඳ යෝග්‍ය සමානුපාතික පිරිවැය |
| අස්වැනු බෝග | ජෛව විද්‍යාත්මක වත්කම්වලින් නෙලා ගත් කෘෂිකාර්මික නිෂ්පාදන නෙලූ අවස්ථාවේ දී අලෙවි කිරීම සඳහා ඒවායේ පිරිවැය අඩු කර සාධාරණ වෙළඳපල වටිනාකම අනුව ගණනය කරනු ලැබේ.<br><br>කෘෂිකාර්මික නිෂ්පාදනවලින් ලැබෙන අවසන් හෝ අර්ධ-අවසන් බඩු ලේඛණ කෘෂි නිෂ්පාදනයේ සාධාරණ වටිනාකමට පරිවර්තනය කිරීමේ පිරිවැය එකතු කරමින් අගය කරනු ලැබේ. |
| පශු සම්පත | කිරි පශු සම්පත අලෙවිය සඳහා පිරිවැය රහිත සාධාරණ වටිනාකම අනුව අගය කරනු ලැබේ. පශු සම්පතේ සාධාරණ වටිනාකම ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය නිකුත් කරනු ලබන චක්‍රලේඛ අනුව තීරණය කරනු ලැබේ. |

### 3.1.5 මූල්‍ය වත්කම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 39 (LKAS 39) යටතට ගැනෙන මූල්‍ය වත්කම්, ලාභ හෝ අලාභ මත වෙළඳපල වටිනාකම් ඇති මූල්‍ය වත්කම්, ණය හෝ ලැබිය යුතු දෑ හෝ, කල්පිරෙන තෙක් තබා ගෙන ඇති ආයෝජන හෝ විකිණීම් සඳහා ඇති මූල්‍ය වත්කම් ලෙස දැක්විය හැක. සමාගම එහි මූල්‍ය වත්කම් වර්ගීකරණය මුල් හඳුන්ගැනීමේ දී තීරණය කරනු ලැබේ. සියලුම මූල්‍ය වත්කම් මූලිකවම සාධාරණ වටිනාකම එකතුව මත ද ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකම අනුව නොමැති වත්කම් සම්බන්ධව වන විට සෘජුවම ආරෝපණය වන ගණුදෙනු පිරිවැය හරහා හඳුනා ගනු ලැබේ.

මුදල්, කෙටි කාලීන තැන්පතු, වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ, රාජ්‍ය ආයතනවලට ලබා දුන් ණය සමාගමේ මූල්‍ය වත්කම්වලට ඇතුලත් වේ.

#### 3.1.5.1 ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකම සහිත මූල්‍ය වත්කම්

වෙළඳාම සඳහා ඇති මූල්‍ය වත්කම් හා ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමට මූලිකව හඳුනාගත් මූල්‍ය වත්කම් ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිටිනාකම සහිත මූල්‍ය වත්කම් වලට ඇතුලත් වේ. මූල්‍ය වත්කම් අලෙවි කාර්යය සඳහා අත්කර ගත්තේ නම් හෝ ආසන්න කාලයකින් නැවත මිලදී ගත්තේ නම් ඒවා වෙළඳාම සඳහා රඳවා ගත් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකම සහිත මූල්‍ය වත්කම් විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය ආදායම හෝ මූල්‍ය වියදම යටතේ සාධාරණ වටිනාකමට කළ වෙනස්කම් ඇතිව සාධාරණ වටිනාකම අනුව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දැක්වේ.

සමාගම ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකම අනුව මූලික අදියරේ දී කිසිදු මූල්‍ය වත්කම් නම් කර නැත.

#### 3.1.5.2 ණය හා ලැබිය යුතු දෑ

ණය හා ලැබිය යුතු දෑ යනු ස්ථාවර හෝ සක්‍රීය වෙළඳපොළක් තුළ දක්වා නොමැති තීරණය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. මූලිකවම සාධාරණ වටිනාකම සහ ගනුදෙනු පිරිවැය සමඟ හඳුනා ගන්නා අතර සඵල පොළී අනුපාතික ක්‍රමය භාවිතා කර ක්‍රමක්ෂ පිරිවැය අනුව පසුව කරගෙන යනු ලැබේ.

අත්කර ගැනීමක් මත කිසියම් වට්ටමක් හෝ වාරිකයක් හා සඵල පොළී අනුපාතිකයේ කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගෙන ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලැබේ.

සඵල පොළී අනුපාතික ක්‍රමක්ෂය විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ ඇති මූල්‍ය ආදායම්වල ඇතුලත් වේ. අපවයවීමෙන් මතුවන අලාභ විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ ඇති මූල්‍ය පිරිවැයවල හඳුනා ගෙන ඇත.

වෙළඳ ලැබිය යුතු දෑ, ආශ්‍රිත පාර්ශ්ව වලින් ලැබිය යුතු මුදල්, තැන්පතු, අත්තිකාරම් හා වෙනත් ලැබිය යුතු දෑ සහ මුදල් හා මුදල් සමාන දෑ ණය හා ලැබිය යුතු දෑ වලට ඇතුලත් වේ.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

2013 දෙසැම්බර් 31 අවසන් වර්ෂය

**වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ**

වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ යනු පහත සඳහන් අවස්ථාවන් හැර, එහි සාධාරණ අගය මත ප්‍රථමයෙන් හඳුනා ගැනීමෙන් පසු ක්‍රමක්ෂය වටිනාකමෙන් ඉවත් කිරීම මත පිරිවැය සැළකිල්ලට ගැනීමෙන් පසු ලැබිය යුතු දෑ වේ.

සම්බන්ධිත පාර්ශවයන්ට නැවත ගෙවීමේ නිශ්චිත ක්‍රමයක් රහිතව ලබා දෙන පොලී රහිත ණය ඇස්මේන්තු ගත උපලබ්ධි වටිනාකම මත බොල් හා අඩමාන ණය සඳහා වූ ප්‍රතිපාදනයන්ට යටත්ව වෙළඳ ලැබිය යුතු දෑ, ඇත්නම්,

ප්‍රකාශිත පොලි පදනමක් රහිත සහ වට්ටම බලපෑමකින් තොරව කෙටි කාලීන ලැබිය යුතු දෑ උපලබ්ධි වටිනාකම මත බොල් හා අඩමාන ණය සඳහා වූ ප්‍රතිපාදනයන්ට යටත්ව වෙළඳ ලැබිය යුතු දෑ, ඇත්නම්

**මුදල් හා මුදල් සමාන දෑ**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය කාර්යය සඳහා මුදල් හා මුදල් සමාන දෑ යන්නට අතැති මුදල් හා බැංකුවේ ඇති මුදල්, ස්ථාවර තැන්පතු හා ඉතුරුම් තැන්පතු ද ඇතුලත් වේ.

### 3.1.5.3 කල්පිරීමට තිබෙන ආයෝජන

සමාගමට ස්ථාවර හෝ තීරණය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් හා ස්ථාවර කල්පිරීම් කල්පිරීම් වන තෙක් තබා ගැනීමට ධනාත්මක අදහසක් හා හැකියාවක් තිබෙන්නේ නම් ඒවා කල්පිරීමට තබා ගත් ලෙස වර්ග කරනු ලැබේ. මූලික ඇගයීමෙන් පසු කල්පිරීමට තබා ගත් ආයෝජන අපචය රහිත සඵල පොළී ක්‍රමය යොදා ගෙන ක්‍රමක්ෂ පිරිවැය අනුව ඇගයීම් කරනු ලැබේ. සඵල පොළී අනුපාතික ක්‍රමක්ෂය ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය ආදායමේ දක්වා ඇත. අපචය තුළින් ඇති වන අලාභ මූලිය පිරිවැයේ විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගෙන ඇත. 2013 වසර තුළ සමාගමේ කල්පිරීමට තබා ගත් ආයෝජන නොමැත (2011 - ශුන්‍ය).

### 3.1.5.4 අලෙවියට ඇති මූල්‍ය ආයෝජන

අලෙවියට ඇති මූල්‍ය වත්කම් යනු අලෙවියට ඇති ලෙස නම් කර ඇති හා ඉහත වර්ගීකරණය කළ මූල්‍ය වත්කම් එකක් හෝ නොවන ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. මූලික හඳුනා ගැනීමෙන් පසුව ඒවා සාධාරණ වටිනාකම මත අගයනු ලබන අතර අපචයවීම් හැරුණු කොටස වෙනත් වෙනස්කම් විස්තීරණ ආදායම තුළ හඳුනා ගෙන සම කොටස්වල සාධාරණ වටිනාකම සංචිතයේ ඉදිරිපත් කරනු ලැබේ. සඵල පොළී අනුපාතික ක්‍රමය යොදා ගෙන අලෙවියට ඇති ණය සුරැකුම්පත්වල පොළී ආදායම ගණනය කරනු ලබන අතර ලාභ හෝ අලාභවල හඳුනාගනු ලැබේ. ආයෝජන හඳුනා නොගන්නා විට සම කොටස්වල උපචිත ලාභ හෝ අලාභ ලාභ හෝ අලාභවලට නැවත වර්ගීකරණය කරනු ලැබේ. 2013 වසර තුළ සමාගමේ අලෙවියට ඇති මූල්‍ය ආයෝජන නොමැත (2011 - ශුන්‍ය).

### 3.1.5.5 මූල්‍ය වත්කම් අපචයවීම

මූල්‍ය වත්කමක් අපචය වී තිබේ ද යන්න පිළිබඳ කිසියම් විෂය මූලික සාක්ෂි සමාගම විසින් සෑම වාර්තාකරණ දිනයකදීම ඇගයීම් කරනු ලබන අතර එය සිදු වී ඇත්තේ නම් වත්කම රැගෙන යන අගය සහ අනාගත ඇස්තමේන්තු කළ මුදල් ප්‍රවාහ වටිනාකම අතර වර්තමාන අගය අතර වෙනස ලෙස අලාභයේ වටිනාකම ගණනය කරයි.

## 3.2 වගකීම් හා වෙන් කිරීම්

මූල්‍ය තත්ව ප්‍රකාශන ඉදිරිපත් කරන දිනයේ සිට වසරක කාලයක් ඇතුළතදී ගෙවිය යුතු හෝ ඉල්ලූ විටදී ගෙවිය යුතු හෝ බැරකම්, ශේෂ පත්‍රයේ ජංගම වගකීම් යටතේ දක්වා ඇත. ශේෂපත්‍ර දින සිට වසරකට පසුව ගෙවිය යුතු බැරකම් ජංගම නොවන වගකීම් යටතේ දක්වා ඇත.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හඳුනා ගත් සියලුම දන්නා වගකීම් සහ බැරකම් ගිණුම් ගත කර ඇත. අතීත හේතූන් මත සමාගම වෙත පැවරී ඇති නෛතික හා සාධනීය බැඳීම් හඳුනා ගෙන ඒවා පියවීම සඳහා මූල්‍ය කැප කිරීමක් අවශ්‍ය වන නීතිමය බැඳීම් සඳහා මූල්‍ය ප්‍රකාශන තුළ අවශ්‍ය වෙන් කිරීම් සිදු කර ඇත.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

2013 දෙසැම්බර් 31 අවසන් වර්ෂය

## 3.2.1 මූල්‍ය වගකීම්

### මූලික හඳුනා ගැනීම හා ඇගයීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් 39 විෂයපථය යටතේ වූ මූල්‍ය වගකීම් යනු යෝග්‍ය පරිදි, ලාභය හෝ අලාභය, ණය හා ණයට ගැනීම් ලෙස වර්ගීකරණය කර ඇත. සමාගම එහි මූල්‍ය වගකීම් මුල් හඳුනා ගැනීමේ දී වර්ගීකරණය කරනු ලැබේ. සියලුම මූල්‍ය වගකීම් මුල් අවස්ථාවේ දී සාධාරණ වටිනාකමට හඳුනාගන්නා අතර ණය හා ණයගැනීම් සම්බන්ධව වන විට ක්‍රමක්ෂය පිරිවැය අනුව සිදු කරනු ලැබේ. ඍජුව ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැය මෙයට ඇතුලත් වේ.

වෙළඳාම හා වෙනත් ගෙවිය යුතු දෑ සමාගමේ මූල්‍ය වගකීම්වලට ඇතුලත් වේ.

### 3.2.1.1 ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකම සහිත මූල්‍ය වගකීම්

වෙළඳාම සඳහා ඇති මූල්‍ය වගකීම් හා ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමට මූලිකව හඳුනාගත් මූල්‍ය වගකීම් ලාභ හෝ අලාභ හරහා සාධාරණ වට්ටිනාකම සහිත මූල්‍ය වගකීම්වලට ඇතුලත් වේ. මූල්‍ය වගකීම් ආසන්න කාලයකින් අලෙවි කාර්යය සඳහා රඳවා ගත්තේ නම් ඒවා වෙළඳාම සඳහා රඳවා ගත් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. වෙළඳාම සඳහා රඳවා ගත් ලාභ හෝ අලාභ වගකීම් ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනී. ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකම සහිත මූල්‍ය වගකීම් සමාගම විසින් මූලික හඳුනා ගැනීමේ දී නම් කර ඇත.

### 3.2.1.2 ණය හා ණයට ගැනීම්

මූලික හඳුනා ගැනීමෙන් පසුව පොළී සහිත ණය හා ණයට ගැනීම් සඵල පොළී අනුපාතික ක්‍රමය යොදා ගෙන ක්‍රමක්ෂය පිරිවැයට අගයනු ලැබේ. වගකීම් හඳුනා නොගන්නා විට මෙන්ම සඵල පොළී අනුපාතික ක්‍රම ක්‍රමක්ෂය ක්‍රියාවලිය හරහා ලැබීම් හා අලාභ ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගනී. වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ හා ගෙවිය යුතු ආදායම් බදු අනෙකුත් මූල්‍ය වගකීම්වලට ඇතුලත් වේ.

## 3.2.2 මූල්‍ය අවදානම් කළමනාකරණ පරමාර්ථ හා ප්‍රතිපත්ති

වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ හා ගෙවිය යුතු ආදායම් බදු සමාගමේ ප්‍රධාන මූල්‍ය වගකීම්වලට ඇතුලත් වේ. මෙම මූල්‍ය වගකීම්වල ප්‍රධාන අරමුණ වන්නේ සමාගමේ මෙහෙයුම් සඳහා මුදල් යෙදවීමයි. සමාගම විසින් රජයේ ව්‍යාපාර සඳහා ණය ලබා දී ඇති අතර වෙළඳාම හා අනෙකුත් ලැබිය යුතු දෑ හා සමාගමේ ක්‍රියාකාරීත්වයෙන් ඍජුවම එන මුදල් හා කෙටි කාලීන තැන්පතු මෙයට ඇතුලත් වේ.

එබැවින් සමාගම මූල්‍ය මෙවලම් භාවිතයේදී ණය අවදානම්, ද්‍රවශීලී අවදානම්, මුදල් අවදානම් සහ පොළී අනුපාත අවදානම් ආදියට මුහුණ පානු ඇත.මෙම සටහන සමාගම මුහුණපාන එම අවදානම් ගැන තොරතුරු සපයන අතර ඒවා කළමනාකරණය පිණිස සමාගමේ අරමුණු සහ ප්‍රතිපත්ති මගින් පැහැදිලි කරයි.

### 3.2.2.1 ණය අවදානම

ණය අවදානම යනු සමාගම විසින් ණය සපයා ඇති පාරිභෝගිකයෙක් හෝ සම්බන්ධිත පාර්ශවයක් තම ගිවිසුම්, බැඳීම් ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වූ විට සමාගමට ලැබිය යුතු දෑ නොලැබීමෙන් ඇතිවන මූල්‍ය අලාභය යි.

### 3.2.2.2 ද්‍රවශීලතා අවදානම

සමාගමට මුදල් හෝ අනෙකුත් මූල්‍ය වත්කම් මගින් පියවීමට ඇති එහි මූල්‍ය වගකීම් ආශ්‍රිත බැඳීම් ඉටු කිරීමේ දී මතු වන දුෂ්කරතා ද්‍රවශීලතා අවදානම් වේ.

සමාගමට සාමාන්‍ය හා පීඩාකාරී තත්ත්වයන් තුල, පිළිගත නොහැකි අලාභ හෝ සමාගමේ කීර්ති නාමයට හානියක් නොමැතිව, හැකි තාක් දුරට සෑම විටම සිය වගකීම් පියවිය හැකි ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් සතුව තිබීම මෙම අවදානම කළමනාකරණය කිරීමේ ප්‍රවේශයක් වේ.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

2013 දෙසැම්බර් 31 අවසන් වර්ෂය

### 3.2.3 සේවක ප්‍රතිලාභ

**(a) නිශ්චිත දායක සැලසුම් - අර්ථසාධක අරමුදල හා භාරකාර අරමුදල**

නිශ්චිත දායක සැලසුමක් යනු සමාගමක් විසින් වෙනත් සමාගමකට ස්ථාවර දායක මුදලක් ගෙවීම තුළින් පශ්චාත් - සේවානියුක්ති ප්‍රතිලාභ සැලසුමක් වන අතර තවදුරටත් මුදල් ගෙවීම් කිරීම සඳහා කිසිදු නෛතික හෝ සම්ප්‍රයුක්ත බැඳීමක් නැත. සියලුම සේවකයින් ආවරණය කරමින් සේවක අර්ථසාධක හා සේවක භාරකාර අරමුදල්වලට දායක මුදල් ගෙවීමේ බැඳීම සේවකයින් විසින් සිය සේවය ලබා දෙන්නා වූ කාලපරිච්ඡේදය සම්බන්ධව ගත් කළ සේවකයින් සඳහා කරන ගෙවීම් වියදමක් සේ ලාභ අලාභ ප්‍රකාශනයේදී සැලකේ. සමාගම විසින් සේවක අර්ථසාදක අරමුදල සහ සේවක භාරකාර අරමුදල වෙත පිළිවෙලින් 12%ක් සහ 3% බැගින් දළ සේවක පාරිශ්‍රමිකයක් මඟින් දායක වේ.

**(b) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම**

නිශ්චිත ප්‍රතිලාභ සැලැසුමක් යනු නිශ්චිත දායක සැලසුමක් හැර පශ්චාත් සේවානියුක්ති ප්‍රතිලාභ සැලසුමක් වේ. නිශ්චිත ප්‍රතිලාභ සැලැසුමේ පිරිවැය ආයුගණක තක්සේරුවක් භාවිතා කර තීරණය කරනු ලැබේ. වට්ටම් අනුපාතික, අනාගත වැටුප් වර්ධක හා කාර්ය මණ්ඩල පිරිවැටුම පිළිබඳ උපකල්පන කිරීම ආයුගණක තක්සේරුවට ඇතුලත් වේ. බැඳීම්වල දීර්ඝ කාලීන ස්වභාවය අනුව එවැනි ඇස්තමේන්තු වැදගත් වෙනස්කම්වලට භාජනය වේ. ඇස්තමේන්තු සඳහා භාවිතා කරන ප්‍රධාන උපකල්පන පිළිබඳ විස්තර සටහන 6 මඟින් දක්වා ඇත.

වගකීම ලංකා බැංකුවේ ඇති ස්ථාවර තැන්පතුවලට බාහිර වශයෙන් අරමුදල් යොදවනු ලැබේ.

### 3.3 විලම්බිත ආදායම

**ප්‍රදාන හා සහනාධාර**

රජයේ ප්‍රදාන ලැබෙන බවට සහතිකයක් මත හා සියලු කොන්දේසි පිළිපැදීම මත රජයේ ප්‍රදාන හඳුනා ගන්නා ගනී. ප්‍රදානයක් වියදම් අයිතමයකට සම්බන්ධ වන්නේ නම් එයින් ආවරණය කිරීරීමට අපේක්ෂිත පිරිවැයට ක්‍රමානුකූල පදනමක් මත අවශ්‍ය කාලසීමාව සඳහා එය හඳුනා ගනී. ප්‍රදානය වත්කමක් සම්බන්ධව වන්නේ නම් එය විලම්බිත ආදායමක් ලෙස හඳුනා ගන්නා අතර එය වත්කමේ ආයු කාලය තුළ සමාන වාරික විලම්බිත අදායමක් සේ වෙන් කෙරෙනු ඇත.

දේපළ, පිරියත හා උපකරණ සම්බන්ධ ප්‍රදාන මූලිකව විලම්බිත කරනු ලබන අතර අදාළ දේපළ, පිරියත හා උපකරණවල ප්‍රයෝජන ජීවිත කාලය සඳහා ක්‍රමානුකූල පදනමක් මත පහත දැක්වෙන ආකාරයට ආදායමට වෙන් කරනු ලැබේ.
වත්කම් ඒවායේ ප්‍රයෝජන ජීවිත කාලය හෝ කල් ඉකුත් නොවූ කල්බදු කාලරිච්ඡේදය යන දෙකෙන් අඩු කාලය සඳහා ක්‍රමක්ෂය කරනු ලැබේ.

| | |
|---|---|
| ගොඩනැගිලි | වසර 40 |
| ජල සැපයුම් | වසර 20 |
| මොටර් රථ | වසර 05 |
| ගෘහ භාණ්ඩ හා මෙවලම් | වසර 10 |
| උපකරණ | වසර 08 |

### 3.4 ආදායම හා වියදම්

ආදායම් ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා වියදම් කාර්යය මඟින් සමාගමේ කාර්යසාධනය පිළිබඳ සාධාරණ ලක්ෂණ නියෝජනය කරනු ලබන බැවින් එම ක්‍රමය යොදා ගනු ලැබීය.

### 3.4.1 ආදායම

ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලා එන ප්‍රමාණයට ආදායම හඳුනා ගන්නා අතර ගෙවීම සිදු කළ වේලාව නොසලකා ආදායම විශ්වාසනීය ලෙස මැනිය හැකිය. ලැබූ ප්‍රතිෂ්ඨාවේ හෝ ලැබිය යුතු දෑවල සාධාරණ වටිනාකම මත බදු හැර ගිවිසුම්ගත ගෙවීම් නියම සැලකිල්ලට ගෙන ආදායම මැනිය හැකිය.

(අ) සාමාන්‍යයෙන් භාණ්ඩය භාර දීමේ දී භාණ්ඩයේ වැදගත් අවදානම් හා හිමිකම් ගැනුම්කරුට මාරු වූ විට භාණ්ඩ විකිණීමෙන් ලද ආදායම හඳුනා ගනී. බදු ලේබණ වටිටිනාකම, තැරැව් ගාස්තුව, අලෙවි වියදම් හා ආදායමට සම්බන්ධ වෙනත් ගාස්තුවල ආදායම සටහන් වේ.

(ආ) දේපළ, පිරියත හා උපකරණ අයිතමයක් ඉවත් කිරීරීම මත ලැබීම් හා අලාභ දේපළ, පිරියත හා උපකරණවල රැගෙන යන අගය හා ශුද්ධ අලෙවි උත්පාදන මුදල් සැසඳීමෙන් තීරනය කරනු ලබන අතර ආදායම් ප්‍රකාශනවල 'වෙනත් මෙහෙයුම් ආදායම්'වල හඳුනා ගනී.

(ඇ) පොළී ආදායම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්තිවල 39 දක්වා ඇති පරිදි සඵල පොළී ක්‍රමය යොදා ගෙන හඳුනා ගනී.

(ඈ) වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගනී.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

2013 දෙසැම්බර් 31 අවසන් වර්ෂය

### 3.4.2 වියදම්

ව්‍යාපාර කරගෙනයාමේ දී හා දේපළ, පිරියත හා උපකරණ කාර්යක්ෂම මට්ටමේ තැබීම සඳහා නඩත්තුවේ දී දැරූ සියලු වියදම් වසර සඳහා ලාභ/ (අලාභ) ලැබීමේ දී අයකර ගනු ලැබේ.

### 3.5 ආදායම් බදු

වර්තමාන හා විලම්බිත බදු ආදායම් බදු වියදම්වලට ඇතුලත් වේ. ආදායම් බදු, සම කොටස්වල ඍජුව හඳුනා ගෙන ඇති අයිතමවලට සම්බන්ධවන තාක්දුරට හැර ඒවා ලාභ හෝ අලාභවල හඳුනා ගනී.

#### (අ) වර්තමාන බදු

වර්තමාන බදු යනු වාර්තාකරණ දිනයේ දී බදු අනුපාතික යොදා ගෙන වසර සඳහා බදු අය විය යුතු ආදායම මත ගෙවිය යුතු බද්ද හා පසුගිය වසර සම්බන්ධව ගැනීමේ දී ගෙවිය යුතු බද්දට කළ කිසියම් ගැලපුම් වේ.
මූල්‍ය වාර්තාවල සඳහන් කළ හා දේශීය ආදායම් පනතේ හා එහි සංශෝධනවල විවිධාන අනුව ගණනය කළ ආදායම හා වියදම මත ආදායම් බදු විධාවිධාන පාදක වේ.

#### (ආ) විලම්බිත බදු

ශේෂ පත්‍ර ක්‍රමය යොදා ගෙන මූල්‍ය වාර්තාකරණ කාර්යයන් සඳහා වත්කම් සහ වගකීම්වල රැගෙනයාමේ මුදල සහ බදුකරණ කාර්යය සඳහා යොදා ගත් මුදල අතර තාවකාලික වෙනස සැලකිල්ලට ගෙන විලම්බිත බදු හඳුනා ගන්නා ගනී. පහත දැක්වෙන තාවකාලික වෙනස්කම් සඳහා විලම්බිබිත බදු හඳුනා නොගනී: ව්‍යාපාර ඒකාබද්ධවීවීමක් නොවන හා ගිණුම්කරණ හෝ බදුඅයකරන ලාභයට බලපෑමක් නොකරන ගනුදෙනුවක වත්කම් හා වගකීම් මූලික හඳුනා ගැනීම සහ පරිපාලිතවල කරනු ලබන ආයෝජන අනාගතයේ දී අවලංගු නොකරනතාක්දුරට ඒවායේ වෙනස්කම්. මෙයට අමතරව කීර්ති නාමය මූලික හඳුනා ගැනීම මත පැන නගින බදු අය කළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා විලම්බිත බදු හඳුනා නොගනී. පනවා ඇති නීති හෝ වාර්තාකරණ දිනය මඟින් හරවත්ව පනවනු ලබන නීති පාදකව තාවකාලික වෙනස්කම් අවලංගු වන විට ඒවාට අදාළ වන බවට අපේක්ෂිත බදු අනුපාතික මත විලම්බිත බදු මනිනු ලැබේ. වර්තමාන බදු වගකීම් හිලව් කිරීමට නෛතික බලාත්මක අයිතියක් ඇත්තේ නම් හා එම බදු අය කළ හැකි ආදායම මත බදු අය කරනු ලබන අධිකරිය විසින්ම පැන වූ ආදායම් බදුවලට ඒවා සම්බන්ධ වන්නේ නම් විලම්බිත බදු වත්කම් හා වගකීම් හිලව් කරනු ලැබේ. තාවකාලික වෙනස උපයෝජනය කළ හැකි ඒවා සම්බන්ධව අනාගත බදු අය කළ හැකි ලාභ ලබා ගත හැකි වන ප්‍රමාණයට පමණක් විලම්බිත බදු වත්කමක් හඳුනා ගනී. සෑම වාර්තාකරණ දිනයකදීම විලම්බිත බදු වත්කම් සමාලෝචනය කරනු ලබන අතර අදාළ බදු ප්‍රතිලාභය හඳුනා ගත නොහැකි වන තාක් දුරට අඩු කරනු ලැබේ.

පරිපාලිත සමාගම්වල හා ආශ්‍රිත සමාගම්වල ලාභාංශ ආදායම මත රඳවා ගත් බදු අදාළ ලාභාංශය වේමට ඇති වගකීම හඳුනා ගන්නා වේලාවේ දීම ඒකාබද්ධ ආදායම් ප්‍රකාශනයෙන් වියදමක් ලෙස හඳුනා ගනී.

### 3.6 ඛණ්ඩ වාර්තාකරණය

සමාගමේ විවිධ ව්‍යාපාරික ඛණ්ඩ සඳහා ඛණ්ඩ වාර්තාකරණයකට ඉඩ ඇත. වතුයාය වල භූගෝලීය පිහිටීම අනුවඛණ්ඩ ගත කරනු ඇත. මූල්‍ය ප්‍රකාශනයේ සටහන් 20 හි ඛණ්ඩ ක්‍රියාකාරිත්වය විස්තර කර ඇත.

### 3.6 වාර්තා කරන දිනවනවිට නිකුත් කරන ලද නමුත් බලාත්මක නොවන ප්‍රමිතීන්

වාර්තා කරන දිනවනවිට නිකුත් කරන ලද නමුත් බලාත්මක නොවන ප්‍රමිතීන් පහත දක්වා ඇත. ඒවා බලාත්මක වූ විට සමාගම ඒවා අනුගමනය කරනු ඇත.

#### (i) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් 9- මූල්‍ය ලේඛණ:

වර්ගීකරණය හා මැනීම ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් 9, මඟින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වල 39 වැන්න ප්‍රතිස්ථාපනය කිරීමේ පළමු අදියර නිරූපනය කරන අතර මූල්‍ය වත්කම් හා වගකීම් වර්ගීකරණයට හා මැනීමට අදාළ වේ.

#### (ii) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් 13 - සාධාරණ වටිනාකම් මැනීම

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් 13 මඟින් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් යටතේ සියලු වටිනාකම් මැනීම් සඳහා තනි මූලාශ්‍ර මාර්ගෝපදේශයක් ඇති කරයි. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් 13 මඟින් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් යටතේ සියලු සාධාරණ මැනීම් සඳහා මාර්ගෝපදේශ සපයයි.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් 9 2015 ජනවාරි 1 හෝ ඉන්පසු ආරම්භ වන මූල්‍ය කාලපරිච්ඡේදය සඳහා බලාත්මක වන අතර ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් 13 2014 ජනවාරි 1 හෝ ඉන්පසු ආරම්භ වන මූල්‍ය කාල පරිච්ඡේද සඳහා බලාත්මක වේ.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

2013 දෙසැම්බර් 31 අවසන් වර්ෂය

## 04. ජනවසම/ශ්‍රීලංරාවැස ට අයත් ඉඩම් වල කල්බදු අයිතිය

සියලු වතු වලට අදාළ වසර 53 කාලයක් සඳහා කල්බදු සිදු කර ඇත. මෙම සියලු කල්බදු 1992 ජුනි 22 දින එනම්, සමාගම ආරම්භක දිනයේ සිට බලපැවැත්වෙන ලෙස ක්‍රියාත්මක වේ.මෙම සියලු වතු වලට අදාළ කල්බදු අයිතිය 1992 ජුනි 22 දින සමාගම පිහිටුවන ලද වහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරාවරන්ගේ ආයතනයේ හදිසි කරුණු කාර්ය බලකායේ නියෝගය පරිදි සමාගමේ පොත්වලට ගෙන ඇත. මේ සඳහා, 1995 මාර්තු 08 වන දින පැවති අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීමේදී මෙම හිස් ඉඩම් සමාගම පිහිටුවීමට පෙර වටිනාකම විශේෂඥ ඩී.ආර්.වික්‍රමසිංහ සැකසු වටිනාකම මත ප්‍රතිඇගයීමට තීරණයක් ගන්නා ලදී.

1992 ජුනි 22 දින මෙම වත්කම් ශේෂ පත්‍රයට ගෙන වසර 53 ක් පුරා සමාන වටිනා කමින් ක්‍රමක්‍ෂය කරනු ලැබේ. වර්‍ාතා කරන දිනට ඉතිරි කල්බදු කාලය වසර 31.5 ක් වේ.

| | දළ පවත්වාගෙන යෑමේ අගය | |
|---|---|---|
| | 31.12.2013 දිනට රු. | 31.12.2012 දිනට රු. |
| හිස් ඉඩම් වල කල්බදු අයිතිය | 142,502,287 | 142,502,287 |

| | ක්‍රමක්‍ෂය වීම | | |
|---|---|---|---|
| | 31.12.2013 දිනට රු. | වසර සඳහා රු. | 31.12.2012 දිනට රු. |
| හිස් ඉඩම් වල කල්බදු අයිතිය | 57,947,416 | 2,688,722 | 55,258,694 |

| | පවත්වාගෙන යෑමේ අගය | |
|---|---|---|
| | 31.12.2013 දිනට රු. | 31.12.2012 දිනට රු. |
| හිස් ඉඩම් වල කල්බදු අයිතිය | 84,554,871 | 87,243,593 |

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

2013 දෙසැම්බර් 31 අවසන් වර්ෂය

## 05. ජනවසම නිශ්චල කල්බදු වත්කම් (භාවිතයට අයිතිය ඇති ඉඩම් සහ කල්බදු ජෛව වත්කම් හැර)

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ හදිසි කරුණු කාර්ය සාධක බලකායේ නියමයට අනුව මෙම වතුවල ඇති මූල්‍ය කල්බදු යටතේ ඇති සියලුම නිශ්චල දේපල අතීතයේ සිට බලපවත්වන පරිදි 1992 ජූනි 22 වන දින සිට ක්‍රියාත්මක වනසේ සමාගමේ පොත් වලට ගෙන ඇත. වත්කම් ජනවසම/ශ්‍රීලංරාවැස පොත්වල සටහන් වටිනාකම් මත සමාගම ආරම්භ කළ දිනට පෙත් වලට ගැනිමට 1995 මාර්තු 08 පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තිරණය කර ඇත. මෙම වත්කම් 1992 ජූනි 22 දින ශේෂ පත්‍රයට ගෙන ඇති අතර නිශ්චල වත්කම් හා ක්‍රමක්ෂය වන පරිදි 2013 දෙසැම්බර් 31 වන දිනට පහත දක්වා ඇත.

| තක්සේරුවේදී | ඉඩම් සංවර්ධනය රු. | වෙනත් වත්කම් රු. | ගොඩනැගිලි රු. | යන්ත්‍ර රු. | ජල සැපයුම රු. | 2013 රු. | 2012 රු. |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රාග්ධනිත වටිනාකම | 841,193 | 1,002,944 | 25,356,498 | 530 | 4,026,236 | 31,227,401 | 31,227,401 |
| **ක්‍රමක්ෂයවීම** | | | | | | | |
| ජනවාරි 01 ට | 49,142 | 686,622 | 20,829,871 | 530 | 4,026,236 | 25,592,400 | 24,461,989 |
| වර්ෂයට ක්‍රමක්ෂය වීම | 2,390 | 33,397 | 1,014,260 | - | - | 1,050,047 | 1,130,411 |
| දෙසැම්බර් 31 ට | 51,532 | 720,019 | 21,844,131 | 530 | 4,026,236 | 26,642,447 | 25,592,400 |
| **පවත්වාගෙන යන වටිනාකම** | **789,661** | **282,925** | **3,512,367** | **-** | **-** | **4,584,953** | **5,635,000** |

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

2013 දෙසැම්බර් 31 අවසන් වර්ෂය

## 06. නිශ්චල කල්බදු ජෛව වත්කම්

| Revaluation | 2013 | 2012 |
|---|---|---|
| | රු. | රු. |
| මේරූ වගාවන් | 103,239,426 | 103,239,426 |
| | **103,239,426** | **103,239,426** |
| ජනවාරි 01 දාට | 58,881,835 | 55,443,962 |
| වර්ෂයට ක්‍රමක්ෂ්‍යවීම | 3,437,873 | 3,437,873 |
| දෙසැම්බර් 31 වෙනි දිනට | **62,319,708** | **58,881,835** |
| **පවත්වාගෙන යන වටිනාකම** | **40,919,718.3** | **44,357,591** |

වතු කල්බදු දීම් ලෙස සමාගමට භාර දෙන අවස්ථාවේ නොමේරූ වගාවන් සඳහා කළ ආයෝජනය (1992-06-22 දිනට ප්‍රත්‍යාගනිත) නොමේරූ වගා ලෙස දක්වා ඇති අතර වාර්තා කරන දින වනවිට ඒවා සියල්ල මේරූ වගාවන්ට මාරු කර ඇත. තවද, සමාගම මේරූ සහ නොමේරූ වගාවන්ට සිදුකල ආයෝජනයන් වෙනම(කල්බදු නොමේරූ සහ මේරූ වාගවන් සංවර්ධන සටහන් අංක 7.2 යටතේ දක්වා ඇත. මෙම මේරූ/නොමේරූ වගාවන් LKAS 41 කෘෂිකර්ම නියමයන් යටතේ ජෛව වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත.

2013 දෙසැම්බර් 31 අවසන් වර්ෂය

## 07 ජෛව වත්කම් (කල්බදු ජෛව වත්කම් හැර)

| | | 2013 | 2012 |
|---|---|---|---|
| | | රු. | රු. |
| කිරි පශු සම්පත් | **07.1** | 8,439,500 | 3,700,000 |
| කල්බදු දේපල සංවර්ධනය (මේරූ සහ නොමේරූ වගා) | **07.2** | 461,906,317 | 365,675,094 |
| | | **470,345,817** | **369,375,094** |

## 07.1 කිරි පශු සම්පත්

| | නොමේරූ වසු පැටව් සහ වැස්සියන් රු. | මේරූ කිරිදෙනුන් සහ කිරි නොදෙන ගවයින් රු. | 2013 රු. | 2012 රු. |
|---|---|---|---|---|
| ජනවාරි 01 දාට | 255,000 | 3,445,000 | 3,700,000 | 3,903,000 |
| වර්ෂය තුළ එකතු වූ | 196,000 | - | 196,000 | 158,000 |
| වර්ෂය වෙළඳ අගයට ලද ලාභය/පාඩු | 110,000 | 4,234,000 | 4,344,000 | - |
| මාරූ කිරීම් ඇතුලට/පිටතට | (135,500) | 418,000 | 282,500 | 374,500 |
| මරණ | (24,500) | (58,500) | (83,000) | (735,500) |
| දෙසැම්බර් 31 දාට | 401,000 | 8,038,500 | 8,439,500 | 3,700,000 |

පශු සම්පත් මනිනු ලබන්නේ ඒවායේ සධාරන වෙළඳ අගයෙන් විකිණීම් වියදම අඩුකිරිමෙනි පශු සම්පත් වෙළඳ අගය ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් නිකුත් කළ චක්‍රලේඛයට අනුව තීරණය කරනු ලබයි

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

2013 දෙසැම්බර් 31 අවසන් වර්ෂය

## 07. ජෛව වත්කම් (කල්බදු ජෛව වත්කම් හැර)

### 07.2 කල්බදු දේපල සංවර්ධනය (මේරූ සහ නොමේරූ වගා)

| පිරිවැය | නොමේරූ වගා | මේරූ වගා පොල් | කජු | වෙනත් | 2013 | 2012 |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වර්ෂය ආරම්භයේදී | 176,117,804 | 128,300,453 | 87,056,397 | 967,096 | 392,441,749 | 328,108,021 |
| එකතු කිරීම් | 102,320,954 | | - | - | 102,320,954 | 64,399,924 |
| නොමේරූ වලින් මාරු කිරීම් | | 15,752,795 | - | - | 15,752,795 | (34,596,819) |
| මේරූ වලට මාරු කිරීම් | (15,752,795) | | - | | (15,752,795) | 34,596,819 |
| ලියා හැරි ශේෂය | | | - | - | - | (66,196) |
| වර්ෂය අවසානයේදී | **262,685,963** | **144,053,248** | **87,056,397** | **967,096** | **494,762,703** | **392,441,749** |
| **ක්ෂය වීම්** | | | | | | |
| වර්ෂය ආරම්භයේදී | | 14,088,554 | 12,629,747 | 48,355 | 26,766,656 | 21,191,147 |
| වර්ෂය සඳහා ක්ෂය | | 2,566,009 | 3,475,367 | 48,355 | 6,089,730 | 5,575,509 |
| වර්ෂය අවසානයේදී | | **16,654,563** | **16,105,113** | **96,710** | **32,856,386** | **26,766,656** |
| පවත්වා ගෙන යන අගය | 262,685,963 | 127,398,685 | 70,951,284 | 870,386 | 461,906,317 | 365,675,094 |

### සටහන

මේවා සමාගම ස්ථාපිත කළ දින සිට මේරූ සහ නොමේරූ වගා සඳහා කළ ආයෝජනයි. කල් බදු යටතේ අත්පත්කරගත් වත්කම් (වැවිලි වත්කම් ඇතුලත්ව) හටහන් අංක 4 ල 5 සහ 6 යටතේ විදහා පෙන්වයි තවදුරටත් කල්බදු පදනම යටතේ පවරාගන්නා ලද වත්කම් වල නොමේරූ වගාවන් වෙනුවෙන් කල ආයෝජනයන් මෙම සටහන තුල ඇතුලත් වේ. එවැනි වගා මේරූ තත්වයට පැමිණි විට, මේරූ තත්වයට ගෙන ඒමට යෙදූ අමතර ආයෝජනය මෙම සටහන අනුව නොමේරූ සිට මේරූ කොටසට මාරු කර ඇත. එ ආකාරයෙන්ම, ජනවසම/ශ්‍රීලංරාවැස කල්බදු පෙර කරන ලද ආයෝජනය වෙනුවෙන්ද නොමේරූ සිට මේරූ දක්වා මාරු වීම් වලට අදාල වෙනස්වීම සටහන් අංක 06 මගින් පෙන්වයි.

වත්කම් LKAS 41 හි දක්වා තිබු පරිදි වෙළඳපල අගය අඩු කිරීම විකුණුම් පිරිවැය අභිබවමින් 2012 මාර්තු 02 දින වරලත් ගණකාධිකාර ආයතනයෙන් නිකුත් කළ නියෝගයෙන් වෙනස් වේ. ඒ අනුව සමාගම ජෛව වත්කම් මැනීම පිණිස LKAS 16 - දේපල, පිරියත හා උපකරණ ප්‍රමිතියට අනුව පිරිවැය මත සිදු කරනු ලබයි

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

2013 දෙසැම්බර් 31 අවසන් වර්ෂය

## 08. සින්නක්කර දේපල, පිරියත හා උපකරණ

| | ගොඩනැගිලි | පිරියත සහ යන්ත්‍ර | මෝටර් රථ | උපකරණ | ගෘහ භාණ්ඩ සහ මෙවලම් වැටවල් | වැටවල් | ජල සැපයුම් | 2013 | 2012 |
|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| පිරිවැය/තක්සේරුව | | | | | | | | | |
| ජනවාරි 01 දාට | 33,180,264 | 1,388,805 | 109,101,877 | 31,605,750 | 7,709,779 | 2,168,873 | 6,204,331 | 191,359,680 | 185,405,962 |
| එකතු කිරීම් | 5,187,471 | 6,450,956 | 48,594,640 | 2,703,804 | 401,089 | | 159,249 | 63,497,210 | 5,317,542 |
| මාරු කිරීම් | | | 18,182,760 | | | | | 18,182,760 | 636,175 |
| දෙසැම්බර් 31 දාට | 38,367,735 | 7,839,761 | 139,513,756 | 34,309,555 | 8,110,868 | 2,168,873 | 6,363,580 | **236,674,129** | **191,359,680** |
| **ක්ෂයවීම්** | | | | | | | | | |
| ජනවාරි 01 දාට | 3,638,451 | 539,846 | 66,046,724 | 20,097,534 | 4,481,932 | 1,513,620 | 2,274,841 | 98,592,948 | 81,687,817 |
| වසරට අදාල වියදම් | 827,546 | 59,388 | 17,842,755 | 2,291,285 | 481,177 | 218,418 | 311,985 | 22,032,553 | 16,905,131 |
| මාරු කිරීම් | - | - | 17,533,725 | - | - | - | - | 17,533,725 | |
| දෙසැම්බර් 31 දාට | 4,465,997 | 599,234 | 66,355,753 | 22,388,819 | 4,963,109 | 1,732,038 | 2,586,826 | **103,091,776** | **98,592,948** |
| **ශුද්ධ අගය** | | | | | | | | **133,582,353** | **92,766,731** |
| <u>ප්‍රාග්ධන කෙරීගෙන යන වැඩ</u> | | | | | | | | | |
| ජනවාරි 01 දාට | | | | | | | | 3,231,722 | 1,294,632 |
| වසර තුල එකතු කිරීම් | | | | | | | | 3,012,724 | 2,770,264 |
| වසර තුල ප්‍රාග්ධනිත | | | | | | | | (2,734,904) | (636,175) |
| පිරිවැය වියදම් වලට මාරු කිරීම් | | | | | | | | | (197,000) |
| දෙසැම්බර් 31 දාට | | | | | | | | **3,509,541** | **3,231,722** |
| **පවත්වාගෙන යන වටිනාකම** | | | | | | | | **137,091,894** | **95,998,453** |

**සටහන්**

ඉහත දක්වා ඇති වත්කම් යනු 1992 ජූනි 22 දින සමාගම ආරම්භන විට ගැසට් නිවේදනය මගින් සමාගමට පවරන ලද වංවල දේපල හා ස්පර්ශ වත්කම් වලට සමාගම එහි ආරම්භයේ සිට කරන ලද සියලු ආයෝජන වේ.

තවද, මූල්‍ය කල්බදු වල (කල්බදු දේපල හැර) සහ ජනවසම/ශ්‍රීලංරාවැස නිශ්චල වතු වත්කම සහ 1992 ජූනි 22 දින පවරා ගත් නොමේරූ/මේරූ වැවිලි හැර අනෙකුත් නිශ්චල වත්කම් ප්‍රත්‍යාගණනය එම දිනට අදාළව ජනවසම හා ශ්‍රීලංරාවැස වෙත් ලබා ගන්නා ලද ශුද්ධ පොත් වටිනාකම මත පදනම් වේ. මෙම වටිනාකම තනි තනි වත්කම් වලින් ලබා ගත නොහැක.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

2013 දෙසැම්බර් 31 අවසන් වර්ෂය

| | 2013 | 2012 |
|---|---|---|
| | රු. | රු. |
| **09. තොග** | | |
| යෙදවුම් ද්‍රව්‍ය | 2,647,627 | 11,642,416 |
| වැඩෙන වගා -තවාන් | 3,433,571 | 4,221,789 |
| නෙලාගත් අස්වැන්න | 52,882,141 | 56,508,644 |
| පරිභෝජන හා අමතර කොටස් | 8,296,358 | 6,803,282 |
| පශු සම්පත් | 4,153,460 | 3,445,010 |
| | 71,413,157 | 82,621,141 |
| යල් පැනගිය තොග සඳහා වෙන් කිරීම් | (15,500) | (15,500) |
| | **71,397,657** | **82,605,641** |

| | | 2013 | 2012 |
|---|---|---|---|
| **10. විකිණීමට වෙන් කළ වත්කම්** | | | |
| **මෝටර් රථ** | | | |
| දළ පවත්වාගෙන යන වටිනාකම | | 4,455,532 | 4,455,532 |
| අඩුකළා සමුච්චිත ක්ෂය | | (4,455,528) | (4,455,528) |
| වර්ෂය තුල අලෙවි කල | | (4) | |
| පවත්වාගෙන යන අගය | 10.1 | - | 4 |

### 10.1 විකිණීමට ඇති වත්කම් වල පවත්වාගෙන යන වටිනාකම

| විස්තරය | වාහන අංක | පිරිවැය | සමුච්චිත ක්ෂයවීම් | පවත්වගෙන යන වටිනාකම |
|---|---|---|---|---|
| ISUZU - Trooper | 32-4291 | 663,342 | 663,341 | 1 |
| TOYOTA - Liteace | 53-9202 | 524,400 | 524,399 | 1 |
| HYUNDAI - Elantra | 18-5182 | 1,100,000 | 1,099,999 | 1 |
| BENZ - Motor Coach | 63-4210 | 2,167,790 | 2,167,789 | 1 |
| | | **4,455,532** | **4,455,528** | **4** |

| | 2013 | 2012 |
|---|---|---|
| | රු. | රු. |
| **11. වෙළඳ හා වෙනත් ලැබීමට ඇති දෑ** | | |
| වෙළඳ ණයගැතියන් | 12,341,718 | 11,332,834 |
| සේවක ණයගැතියෝ | 9,713,419 | 10,202,628 |
| වෙනත් ණයගැතියෝ | 7,175,915 | 22,161,715 |
| වේ කොයාර් ව්‍යාපෘතිය | 13,325,233 | 13,325,233 |
| | 42,556,284 | 57,022,411 |
| වේ කොයා ව්‍යාපෘතිය සඳහා වෙන් කිරීම් | (13,325,233) | (13,325,233) |
| බොල් ණය සඳහා වෙන් කිරීම් | (440,378) | (440,378) |
| | **28,790,674** | **43,256,800** |

| **12. රාජ්‍ය ආයතන වෙත දී ඇති මූල්‍ය පහසුකම්** | Amount Granted | 2013 | 2012 |
|---|---|---|---|
| **ලැබිය යුතු ණය** | රු. | රු. | රු. |
| සීමා: ඇල්කඩුව වැවිලි සමාගම | 20,000,000 | 23,519,452 | 23,519,452 |
| සීමා: ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව | 10,000,000 | 10,000,000 | 10,000,000 |
| ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව | 20,000,000 | 23,610,959 | 23,610,959 |
| රාජ්‍ය සම්පත් සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය | 15,000,000 | 15,000,000 | 15,000,000 |
| ජනතා වතු සංවර්ධන මණ්ඩලය | 40,000,000 | 47,627,397 | 47,627,397 |
| | **105,000,000** | **119,757,808** | **119,757,808** |

රාජ්‍ය ආයතන වෙනුවෙන් සපයන ලද කෙටි කාලින ණය වෙනුවෙන් අයවිය යුතු පොලිය 2010 සිට 2012 වර්ෂය දක්වා අයවී නොමැත. මෙම කරුණු සලකා බලා හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය 2013 වර්ෂයට අදාල පොලි අදායම පොලි අදායමක් ලෙස ගිණුම් වාර්ථාවලට නොගැනිමට තීරණය කරන ලදි.

හලාවත වැවිලි සමාගම රාජ්‍ය ආයතන සඳහා 2010 වර්ෂයේදි රු. මිලියන 105 ක මුදලක් කොටිකාලින ණය වශයෙන් ලබාදි ඇති අතර එම ණය මුදල හා 2012 වර්ෂය දක්වා පොලි අදායම වන රු. 14,757,808.21 ලැබිය යුතුව පවති.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

2013 දෙසැම්බර් 31 අවසන් වර්ෂය

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| **13. කෙටි කාලීන ආයෝජන** | | |
| ස්ථාවර තැන්පතු - ලංකා බැංකුව | 88,225,881 | 88,551,276 |
| අරමුදල් - කළමනාකාරිත්වය - ලංකා බැංකුව | 7,770,092 | 2,030,372 |
| ස්ථාවර තැන්පතු - මහජන බැංකුව | - | 108,795,522 |
| භාණ්ඩාරගාර බිල්පත් | 33,000,000 | - |
| | **128,995,973** | **199,377,169** |

කෙටි කාලීන ආයෝජන මූල්‍ය අවශ්‍යතාවය මත මාස 6 ත් 12 ත් අතර කාලසීමා වලට තැන්පත් කර ඒ කාලසීමාවට අදාල පොලී ආදායම් උපයා ගැනේ.

ලංකා බැංකුවේ ඇති ඉහත සඳහන් ස්ථාවර තැන්පත් මගින් රු. 58,780,004 ක පාරිතෝෂිත දීමනා බැරකමට අදාළ සැළසුම් වත්කම් දක්වයි.

## 14. ප්‍රකාශිත ප්‍රාග්ධනය

| | | |
|---|---|---|
| **නිකුත් කළ ගෙවා නිම කළ කොටස් ප්‍රමාණය** | | |
| භාණ්ඩාගාරයට විශේෂ හිමිකම් ඇති එක් ස්වර්ණමය කොටසක් ඇතුලුව නිකුත් කළ සාමාන්‍ය කොටස් ප්‍රමාණය | 20,000,001 | 20,000,001 |
| **නිකුත් කළ ගෙවා නිම කළ කොටස් වටිනාකම** | | |
| භාණ්ඩාගාරයට විශේෂ හිමිකම් ඇති එක් ස්වර්ණමය කොටසක් ඇතුලුව නිකුත් කළ සාමාන්‍ය කොටස් වටිනාකම | **200,000,010** | **200,000,010** |

ප්‍රකාශිත ප්‍රාග්ධනය මගින් විශේෂ හිමිකම් ඇති එක් ස්වර්ණමය කොටසක් ඇතුළුව සාමාන්‍ය කොටස් 20,000,001 සමන්විත වේ 2007 අංක 07 දරණ සමාගම් පනත 2007 මැයි මස 03 දින සිට බලාත්මක වීමත් සමගම බලයලත් කොටස් ප්‍රාග්ධනය හා සම වටිනාකම තවදුරටත් අදාළ නොවේ.

| | | |
|---|---|---|
| **15. විලම්බිත බදු** | | |
| වසර ආරම්භයේ | 32,669,159 | 27,382,429 |
| වසරේ වෙන් කිරීම් | 9,855,613 | 5,286,730 |
| වසරාවසානයේ | **42,524,772** | **32,669,159** |

| | | |
|---|---|---|
| **17. විලම්බිත ප්‍රදාන සහ සහනාධාර** | | |
| වසර ආරම්භයේ | 8,477,900 | 8,877,638 |
| අඩුකළා: වසරේ ක්‍රමක්ෂය | (429,158) | (399,738) |
| වසරාවසානයේ | **8,048,742** | **8,477,900** |

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

2013 දෙසැම්බර් 31 අවසන් වර්ෂය

| | 2013<br>Rs. | 2012<br>Rs. |
|---|---|---|
| **17. විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්** | | |
| වසරට වෙන් කිරීම් | 52,645,432 | 50,730,900 |
| පොළී වියදම | 5,527,770 | - |
| සේවා පිරිවැය | 5,399,649 | 5,035,583 |
| වර්ෂය තුළ පාරිතොෂිත ගෙවීම් | (5,621,469) | (3,121,051) |
| ඇක්චූරියල් (ලාභ/ අලාභ) | 828,622 | - |
| වසරාවසානයේ | **58,780,004** | **52,645,432** |

සේවකයෙකු තම සේවා කාලය තුළ උපයා ඇති විශ්‍රාම ප්‍රතිලාභ නිශ්චිතව ඇස්තමේන්තු කිරීමට LKAS 19 ට අනුව ආයුගණක ශිල්ප-ක්‍රම තුළ ප්‍රක්ෂේප්ත ඒකක ණය ක්‍රමය භාවිතා කරමින් විශ්‍රාම පාරිතෝෂිත ප්‍රතිලාභයේ වර්තමාන වටිනාකම සහ වර්තමාන සේවා පිරිවැය ගණනය කළ යුතුවේ. මෙහිදි යම් ස්ථිතියක් කොතරම් ප්‍රතිලාභ දූනට සහ ඉදිරි කාලයේදී ආරෝපණය කර ගන්නවාද, ජනවිකාශය විචල්‍යයන් හා මූල්‍ය විචල්‍යයන් ප්‍රතිලාභ පිරිවැයට බලපානවාදැයි උපකල්පනය කිරීමට සිදුවනවා ඇත. එම සංඛ්‍යා සොයා ගැනීම සඳහා පහත සඳහන් කල්පිතයන් යොදාගන්නා ලදී.

ආයුගණක තක්සේරුවරයා විසින් සපයන ලද ආයුගණක තක්සේරු වාර්තාව අනුව පාරිතෝෂිත විශ්‍රාම ප්‍රතිලාභ වල 2013 දෙසැම්බර් 31 වැනි දිනට වටිනාකමෙහි ආයුගණක වර්ථමාන අගය වන්නේ රුපියල් 58,780,004/- ක් ය. සමාගම පාරිතෝෂිතය දින 14 ක වැටුප් සහ අර්ධ මාසයක වේතනයක් නම් ගෙවීමට ඇති වගකීම රුපියල් 62,234,830/-. ක් වනු ඇත.එවිට රුපියල් 9,589,398/-. ක අවිනිශ්චිත වගකීමක් ඇති වේ. එය විද්‍යමාන වන්නේ සමාගම තවදුරටත් අඛණ්ඩ පැවැත්මකින් තොර වුවහොත් පමණි.

**ඇක්චූරියල් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් (පුද්ගලික) සමාගම භාවිතා කළ ප්‍රධාන කල්පිතයන් පහත දැක්වේ.**

| | |
|---|---|
| (i) පොළී අනුපාතය | 10.5% වසරකට. |
| (ii) වැටුප් වැඩි වීමේ අනුපාතය | |
| මාසික වේතන ලබන | 8.0% වසරකට. |
| දෛනික වේතන් ලබන | 9.0% වසරකට. |
| (iii) විශ්‍රාම යන වයස | |
| මාසික වේතන ලබන | අවුරුදු 60 |
| දෛනික වේතන් ලබන | අවුරුදු 60 |
| (iv) දෛනික වේතන ප්‍රමාණය | රු. 400/- |

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

2013 දෙසැම්බර් 31 අවසන් වර්ෂය

## 18. ජනවසම/ශ්‍රීලංරාවැස සඳහා කල්බදු බැඳීම්

| | වසරක් තුල ගෙවීම් | වසරකට පසු ගෙවිය යුතු - වසර 01 සිට වසර 05 දක්වා ගෙවිය යුතු | වසර 05 පසු ගෙවිය යුතු | අනු එකතුව | එකතුව |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| දල මුල්‍ය කල්බදු වගකීම් | 6,508,000 | 26,032,000 | 172,078,651 | 198,110,651 | 204,618,651 |
| අඩුකලා: අනාගත මුල්‍ය ගාස්තු | (4,611,369) | (17,655,865) | (67,074,302) | (84,730,167) | (89,341,536) |
| ශුද්ධ කල්බදු වගකීම් - 2013 | 1,896,631 | 8,376,135 | 105,004,349 | 113,380,484 | 115,277,115 |
| ශුද්ධ මුල්‍ය කල්බදු වගකීම් - 2012 | 1,823,684 | 8,053,976 | 107,223,139 | 115,277,115 | 117,100,799 |

වතු කල්බදු 1996 මස 22 වන දින සිට වසරකට එක් එක් වත්තකට අදාළ පෙර කල්බදු කුලිය වූ රුපියල් 500/. කට වැඩි සාපේ-ක්ෂිත මුදලකට සංශෝධනය කරන ලදී. සංශෝධිත පදනම යටතේ ගෙවන කුලිය වනුයේ රුපියල් මිලියන 6.5 කි. මෙම ප්‍රමාණය දල දේශීය නිෂ්පාදනය මගින් වාර්ෂිකව වැඩිවන අතර අසම්භාව්‍ය කුලී ආකාරයෙන් සැලකේ.

## 19. වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ

| | 2013 | 2012 |
|---|---|---|
| | රු. | රු. |
| වෙළඳ ණයහිමියෝ (ආපසු ගෙවීම්, CDA අලෙවි තොග ගාස්තු | 2,474,123 | 1,651,599 |
| වෙනත් (පොහොර, කොන්ත්‍රාත්කරුවන්) | 25,531,479 | 36,893,704 |
| නිවාඩු පඩි | 2,571,281 | 2,619,341 |
| උපචිත වියදම් | 5,893,364 | 5,193,200 |
| විගණන ගාස්තු | 875,796 | 620,000 |
| 10% ලාභ පංගු කාර්යමණ්ඩලය (RPC ගිවිසුම) | 8,213,701 | 7,499,213 |
| | 45,559,744 | 54,477,057 |

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

2013 දෙසැම්බර් 31 අවසන් වර්ෂය

| | 2013 රු. | 2012 රු. |
|---|---|---|
| **20. අයභාරය** | | |
| **20.1 සාරාංශය** | | |
| පොල් | 242,835,374.10 | 306,785,082 |
| කොප්පරා | 44,316,779.71 | 32,265,567 |
| | 287,152,153.81 | 339,050,649 |

| **20.2 ආංශික තොරතුරු** | 01 කාණ්ඩය | | 02 කාණ්ඩය | | වෙන් නොකළ | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|
| **භූගෝලීය ආංශික ප්‍රතිඵල** | 2013 රු. | 2012 රු. | 2013 රු. | 2012 රු. | 2013 රු. | 2012 රු. | 2013 රු. | 2012 රු. |
| අයභාරය | 112,325,589 | 176,187,490 | 174,826,564 | 162,863,159 | - | - | 287,152,153 | 339,050,649 |
| අයභාර වියදම් | (70,377,556) | (116,791,127) | (90,797,756) | (85,329,573) | - | - | (161,175,312) | (202,120,700) |
| ක්ෂයවීම | (7,052,316) | (7,504,202) | (6,035,000) | (5,692,880) | - | - | (13,087,316) | (13,197,081) |
| ආංශික ප්‍රතිඵල | 34,895,717 | 51,892,161 | 77,993,808 | 71,840,706 | - | - | 112,889,525 | 123,732,868 |
| වෙනත් ආදායම් සහ ලැබීම් | | | | | | | 76,206,174 | 56,977,730 |
| වෙන් නොකළ වියදම් | | | | | | | (102,102,459) | (106,964,903) |
| මූල්‍ය පිරිවැය | | | | | | | (27,169,196) | (24,984,006) |
| මූල්‍ය ආදායම් | | | | | | | 21,167,854 | 37,463,655 |
| බදු පෙර ලාභය | | | | | | | 80,991,898 | 86,225,344 |
| ආදායම් බදු වියදම් | | | | | | | (10,072,974) | (8,250,497) |
| **වර්ෂයට ශුද්ධ ලාභය 2013 දෙසැම්බර් 31 දිනට** | | | | | | | 70,918,924 | 77,974,847 |
| **ආංශික වත්කම්** | | | | | | | | |
| ජංගම නොවන වත්කම් | 363,585,490 | 305,475,120 | 312,969,388 | 275,107,875 | 60,942,378 | 22,026,737 | 737,497,255 | 602,609,732 |
| ජංගම වත්කම් | 57,584,141 | 52,393,918 | 33,732,389 | 48,049,438 | 264,913,762 | 353,788,090 | 356,230,292 | 454,231,447 |
| **මුළු වත්කම්** | 421,169,631 | 357,869,038 | 346,701,777 | 323,157,313 | 325,856,139 | 375,814,827 | 1,093,727,547 | 1,056,841,179 |
| **ආංශික වගකීම්** | | | | | | | | |
| ජංගම නොවන වගකීම් | 28,938,670 | 25,898,841 | 29,248,870 | 28,521,256 | 164,546,462 | 154,649,510 | 222,734,003 | 209,069,606 |
| ජංගම වගකීම් | 16,290,427 | 17,957,735 | 10,764,997 | 13,484,773 | 18,396,294 | 33,258,895 | 45,451,718 | 60,148,671 |
| **මුළු වගකීම්** | 45,229,097 | 43,856,576 | 40,013,867 | 42,006,029 | 182,942,756 | 187,908,405 | 268,185,721 | 269,218,277 |

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

2013 දෙසැම්බර් 31 අවසන් වර්ෂය

| | 2013 රු. | 2012 රු. |
|---|---|---|
| **21. වෙනත් ආදායම් සහ ලැබීම්** | | |
| ප්‍රදාන ක්‍රමක්ෂය | 429,158 | 399,738 |
| පශු සම්පත් ව්‍යාපෘතියේ ලාභ | 5,223,294 | 40,754 |
| පැරණි වාහන සහ අබලි ද්‍රව්‍ය අලෙවියෙන් | 15,640,607 | 11,153,074 |
| දැව | 18,594,834 | 15,443,147 |
| පොල් ගස් | 11,115,937 | 9,763,696 |
| පොල් ලෙලි සහ කටු | 10,793,221 | 5,914,069 |
| දඩ | 4,436,322 | 5,524,200 |
| පැල සහ තවාන් | 373,271 | 5,020,424 |
| කුඹුරු | 1,595,574 | 2,194,221 |
| දර | 1,887,223 | 1,950,360 |
| කජු | 2,493,261 | (1,678,652) |
| වෙනත් | 3,623,471 | 1,252,700 |
| | **76,206,174** | **56,977,730** |
| **22. මූල්‍ය පිරිවැය** | | |
| ඉඩම් සහ ගොඩනැගිලි (ජනවසම) මහ භාණ්ඩගාරයේ PMD (MPI) ගෙවූ විවල්‍ය බදු කුලී | 22,484,880 | 20,229,548 |
| ඉඩම් සහ ගොඩනැගිලි (ජනවසම) මහ භාණ්ඩගාරයේ PMD (MPI) ගෙවූ බදු කුලී පොලි | 4,684,316 | 4,754,458 |
| | **27,169,196** | **24,984,006** |
| **23. බදු පෙර ලාභය පහත වෙන්කිරීම් පසුව දක්වා ඇත ක්ෂයවීම්** | | |
| - මුඩු ඉඩම් වල කල්බදු අයිතිය | 2,688,722 | 2,688,722 |
| - නිශ්චල කල්බදු වත්කම් | 1,050,047 | 1,130,411 |
| - ස්ථාවර වත්කම් (දේපල පිරියත උපකරණ) | 22,032,553 | 16,905,131 |
| - ජෛව වත්කම් | 9,527,603 | 9,013,382 |
| අධ්‍යක්ෂ පාරිශ්‍රමික | 3,267,900 | 4,358,400 |
| විගණක පාරිශ්‍රමික | 875,796 | 620,000 |
| විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් පිරිවැය | 11,756,041 | 5,035,583 |
| විශ්‍රාම දායක සැලසුම් පිරිවැය සේ. අ. අ. සහ සේ. භා. අ. | 19,252,920 | 20,760,815 |
| වැටුප් හා වේතන | 139,443,188 | 147,540,684 |
| ලියා හැරි සම්බන්ධ පාර්ශවයන්ගෙන් ලැබිය යුතු | - | 2,157,952 |
| සේවක 10% ලාභ පංගුව | 5,386,761 | 4,659,781 |
| පරිත්‍යාග | | - |
| | **215,281,531** | **214,870,861** |

24. ආදායම් බදු වියදම්

24.1 2013 දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය සඳහා ආදායම් බදු වල ප්‍රධාන අංග පහත දක්වා ඇත.

| | 2013 | 2012 |
|---|---|---|
| **තථ්‍ය බදු වියදම්** | | |
| තථ්‍ය ආදායම් බදු (27.2) | - | 5,198,434 |
| පසුගිය වසරේ ආදායම් බදු අධි වෙන්කරන ලද | (1,782,639) | (2,234,667) |
| විලම්බිත බදු අය කිරීම/ වෙන් කිරීම | 9,855,613 | 5,286,730 |
| ආදායම් ප්‍රකාශනයේ සටහන් ආදායම් බදු වියදම | **8,072,974** | **8,250,497** |

24.2 බදු වියදම් සහ ගිණුම්ගත ලාභ නිෂ්පාදන සසැඳීම

| | 2013 රු. | 2012 රු. |
|---|---|---|
| බදු පෙර ලාභය | 81,820,521 | 86,225,344 |
| සමුච්චිත අනුමත නැති අයිතම | 65,235,899 | 40,683,929 |
| සමුච්චිත අනුමත අයිතම | (187,477,953) | (170,209,745) |
| ගැලපූ ව්‍යාවහාරික ලාභය | (40,421,533) | (43,300,472) |
| පොලී ආදායම් | 21,167,854 | 54,140,930 |
| ව්‍යවස්ථාපිත ආදායම් | 21,167,854 | 54,140,930 |
| අඩුකලාඃ සුදුසුකම් ලත් ගෙවීම් | (13,759,105) | (35,575,095) |
| අඩුකිරීම් U.S 32 | (7,408,749) | - |
| බදු ගෙවිය යුතු ආදායම | - | 18,565,835 |
| සම්මත අනුපාතය - 28% (2010 35%) | - | 5,198,434 |
| සහනශීලී අනුපාතය 10 % | - | - |
| තථ්‍ය ආදායම් බදු වියදම් | - | 5,198,434 |
| | **-** | **5,198,434** |

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

2013 දෙසැම්බර් 31 අවසන් වර්ෂය

## 25. කොටසක ඉපයීම

25.1 කොටසක මූලික ඉපයීම් ගණනය කිරීම වසරේ පශ්චාත් ලාභය අදාළ කාලය තුළ ඇති බරතැබූ සාමාන්‍ය කොටස් ප්‍රමාණයෙන් බෙදූ විට ලැබෙන මුදලට සමාන වේ.

25.2 කොටසක මූලික ඉපයීම් ගණනය කිරීමට යොදා ගත් ආදායම හා පංගු විස්තර පහතින් දක්වා ඇත.

| ලවය ලෙස භාවිතා කළ සංඛ්‍යාවන් | 2013 | 2012 |
|---|---|---|
| කොටසක මූලික ඉපයීමට අදාළව සමාන්‍ය කොටස්කරුවන්ට අදාළවන ශුද්ධ ලාභය | 73,747,547 | 77,974,847 |
| | 73,747,547 | 77,974,847 |
| **හරය ලෙස භාවිතා කළ සංඛ්‍යාවන්** | **ගණන** | **ගණන** |
| නිකුත් කරන ලද බරතැබූ සාමාන්‍ය කොටස් ගණන | 20,000,001 | 20,000,001 |
| කොටසකට ඉපයීම් මූලික පදනමට අදාළව | 20,000,001 | 20,000,001 |
| **කොටසකට මූලික ඉපයීම්** | **3.69** | **3.90** |

## 26. බැඳීම් සහ අවිනිශ්චිතයන්

### 26.1 ප්‍රාග්ධන බැඳීම්

වාර්තා කරන දිනට සමාගමේ කිසිදු සැළකිය යුතු ප්‍රාග්ධන බැඳීමක් නැත.

### 26.2 අවිනිශ්චිත බැඳීම්

වාර්තා කරන දිනට සටහන් අංක 17 ඇති දෑ හැර සමාගමේ වෙනත් අවිනිශ්චිත බැඳීම් කිසිවක් නැත.

## 27. ශේෂ පත්‍ර දිනට පසුව ඇතිවූ සිදුවීම්

අංක 10 සටහනේ දක්වා ඇති දෑ හැර මූල්‍ය ප්‍රකාශවල ගැලපීම් හෝ හෙළදරව් කිරීම් කිරීමට අවශ්‍යවන කිසිදු ප්‍රමාණාත්මක සිදුවීමක් ශේෂපත්‍ර දිනට පසුව සිදු වී නැත.

## 28. සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරවු කිරීම්

අදාළ සම්බන්ධිත පාර්ශව විස්තර පහත දක්වා ඇත.

### 28.1 සමාගමේ හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සමග ඇති ගනුදෙනු

මෙම මූල්‍ය ප්‍රකාශනවල 23 වන සටහනේ දක්වා ඇති කරුණු හැර සමාගමේ ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරින් සමග වෙනත් කිසිදු ප්‍රමාණාත්මක ගනුදෙනුවක් සිදු වී නැත. තවද, වසර තුල ප්‍රධාන කළමනාකාරිත්ව වන්දි ගෙවීම් කිසිවක් සිදු කර නැත.

# පසුගිය වසර 05 තුළ සාරාංශගත ප්‍රතිඵල

| | 2013 | 2012 | 2011 | 2010 | 2009 |
|---|---|---|---|---|---|
| **වෙළඳ ප්‍රතිඵල** | රු' 000 | රු' 000 | රු' 000 | රු' 000 | රු' 000 |
| අයභාරය | 287,152 | 339,051 | 322,909 | 422,668 | 312,687 |
| දළ ලාභය | 112,890 | 123,733 | 163,228 | 172,166 | 115,805 |
| පොලී හා බදු පෙර ලාභය | 108,989 | 111,209 | 118,969 | 136,608 | 141,201 |
| බදු පෙර ලාභය | 81,820 | 86,225 | 95,771 | 114,163 | 120,693 |
| බදු පසු ලාභය | 72,919 | 77,975 | 77,670 | 75,256 | 98,097 |
| රඳවාගත් ලාභ | 625,542 | 587,623 | 584,648 | 585,895 | 510,639 |
| ලාභාංශ ගෙවීම් | 35,000 | 75,000 | 75,000 | - | 30,000 |
| ලාභාංශ එකතුව (දිනට) | 376,650 | 341,650 | - | | |
| **මූල්‍ය තත්ත්වය** | | | | | |
| ස්ථාවර වත්කම් | 737,497 | 602,610 | 560,326 | 483,117 | 436,721 |
| මේරූ හා නොමේරූ වගාවන් | 502,826 | 410,033 | 354,712 | 326,048 | 287,333 |
| ජංගම වත්කම් | 356,230 | 454,231 | 519,019 | 627,829 | 496,056 |
| තොග | 71,398 | 82,606 | 94,295 | 28,526 | 44,770 |
| ජංගම වගකීම් | 45,452 | 60,149 | 90,605 | 127,215 | 60,125 |
| දිගුකාලීන වගකීම් | 222,734 | 209,070 | 204,092 | 197,836 | 162,012 |
| කොටස් ප්‍රාග්ධනය | 200,000 | 200,000 | 200,000 | 200,000 | 200,000 |
| කොටස්කරුවන්ගේ අරමුදල් | 825,542 | 787,623 | 784,648 | 785,895 | 710,639 |
| **මූල්‍ය දර්ශක** | | | | | |
| ජංගම අනුපාතය (වාර) | 7.83 | 7.55 | 5.77 | 4.94 | 8.25 |
| ක්ෂණික අනුපාතය (වාර) | 6.26 | 6.18 | 4.69 | 4.71 | 7.51 |
| දළ ලාභ අනුපාතය | 39.31 | 36.49 | 44.71 | 40.73 | 37.04 |
| කොටසක ඉපයුම (රු.) | 3.69 | 3.90 | 3.88 | 3.76 | 4.90 |
| ස්කන්ධයට ආපසු ලැබීම් (ROE) - % | 8.8 | 9.92 | 9.86 | 10.06 | 14.50 |
| ප්‍රාග්ධන යෙදවුමට ආපසු ලැබීම් (ROCE) - % | 10.31 | 11.16 | 11.97 | 13.89 | 16.18 |
| ජ. වත්කම් වලට ජ. වගකීම් | 0.04 | 0.06 | 0.08 | 0.11 | 0.06 |
| පොලී ආවරණය (වාර) | 3.98 | 4.45 | 5.13 | 6.09 | 6.89 |

# වාර්ෂික මහා සභා රැස්වීම දැනුම් දීම

පහත සඳහන් කරුණු අරමුණු කරගෙන සීමාසහිත හලාවත වැවිලි සමාගමේ වාර්ෂික මහ සභාව 2014 ජූනි 30 වෙනි සඳුදා ප.ව. 1.30 ට කොළඹ 01, යෝක් වීදියේ අංක 02 හි ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හෝටලයේදී පැවැත්වෙන බව මෙසේ දන්වා සිටිනු ලැබේ.

**න්‍යාය පත්‍රය**

1. **2013 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ගිණුම් ප්‍රකාශන හා ඒ පිළිබඳ අධ්‍යක්ෂ හා විගණන වාර්තා ලබාගෙන සළකා බැලීම,**

2. **වරලත් විගණකවරු ලෙස අයියර් සහ සමාගම පත් කිරීම සහ ඔවුන්ගේ පාරිශ්‍රමික තීරණය කිරීමේ බලය අධ්‍යක්ෂවරුන් වෙත පැවරීමල**

3. **වෙනත් කරුණු**

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,
සීමාසහිත හලාවත වැවිලි සමාගම



කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (පුද්) සමාගම
ලේකම්වරු - හලාවත වැවිලි සමාගම

---

සටහන්

1. උක්ත රැස්වීමට සහභාගිවීමට හිමිකම් ඇති කොටස්කරුවකු/සාමාජිකයෙකු හට තමා වෙනුවෙන් ඊට සහභාගිවී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා පෙරකලාසිකරුවෙකු පත් කිරීමේ අයිතිය ඇතග
2. පෙරකලාසිකරු සමාගමේ සමාජිකයෙකු වීම අවශ්‍ය නොවේ.
3. මේ සඳහා වූ පෙරකලාසි පත්‍රය අමුණා ඇත.

# පෙරකලාසි අයදුම්පත

පහත අත්සන් කරන සීමාසහිත හලාවත වැවිලි සමගමේ සාමාජිකයකු /සාමාජිකයන් වන ______________________

______________________________________________________________________

හි පදිංචි මම/ අප :

| | |
|---|---|
| 01. පණ්ඩුක ජයසිංහ මහතා | හෝ ඔහු නොමැති නම් |
| 02. ඒ.එම්. චන්ද්‍රපාල මහතා | හෝ ඔහු නොමැති නම් |
| 03. ඔ.පි.පි. පතිරණගේ මහතා | හෝ ඔහු නොමැති නම් |
| 04. ප්‍රියංගනී ලියනගේ මහත්මිය | හෝ ඇය නොමැති නම් |
| 05. එස්. චන්ද්‍රා එස්. ප්‍රනාන්දු මහතා | හෝ ඔහු නොමැති නම් |
| 06. කේ.බි. රත්නායකමහතා | හෝ ඔහු නොමැති නම් |
| 07. ආර්.ආර්.එම්. අමරතුංග මහතා | හෝ ඔහු නොමැති නම් |
| 08. අයි.එම්.ආර්. විදානගමගේ මහතා | හෝ ඔහු නොමැති නම් |

______________________________________________________________________

2014 ජුනි 30 වෙනි සඳුදා ප.ව. 1.30 ට පැවැත් වෙන මෙම සමාගමේ මහ සභා රැස්වීමේදි මා/අප වෙනුවෙන්, මාව / අපව නියෝජනය කරමින්, මා/අප වෙනුවෙන් ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා මා නම් කරම්/මු.

දී ඇති කොටුව තුල “X” සළකුණු කිරිමෙන් ඔබගේ කැමැත්ත පල කරන්න

| | එකඟ වෙමි/මු | එකඟ නොවෙමි/මු |
|---|---|---|
| **1.** 2013 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වසර සඳහා සකස්කල ගිණුම් ප්‍රකාශන, අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව හා විගණන වාර්තාව ලබාගැනීම හා සමාලෝචනය කිරිම. | ☐ | ☐ |
| **2.** 2013 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා සමාගමේ විගණකවරු ලෙස අයියර් සහ සමාගම (වරලත් ගණකාධිවරු) නැවත පත් කිරිම ඔවුන්ගේ පරිශ්‍රමික තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයට පැවරීම. | ☐ | ☐ |

______________________

අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකගේ අත්සන

2014 ____________ මස __________ දින අත්සන් තබන ලදී.
කොටස්කරුගේ ජා. හැ. අ. /වි. බ. අ. /සමාගමේ ලියා පදිංචි අංකය ______________________

**පෙරකලාසි අයදුම්පත සම්පූර්ණ කිරීමේ උපදෙස්**

1. පෙරකලාසි අයදුම්පතෙහි ඇති හිස් තැන් පුරවා නියමිත ස්ථානයේ අත්සන සහ දිනය කරුණාකර සඳහන් කරන්න.
2. පෙරකලාසි අයදුම්පත ඇටෝර්නි බලයලත් පුද්ගලයෙකු විසින් අත්සන් කර ඇත්නම් සහ එද ඇටෝර්නි බල පත්‍රය මේ වන විටත් සමාගමේ ලියාපදිංචි කර නැත්නම් එම ඇටෝර්නි බලපත්‍රයද සම්පූර්ණ කරන ලද පෙරකලාසි අයදුම් පත සමග අමුණා එවිය යුතුයි.
3. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම පැවැත්වීමට නියමිත වේලාවට අඩුම වශයෙන් පැය 48 කට පෙර සම්පූර්ණ කරන ලද පෙරකලාසි අයදුම්පත කොළඹ -07 ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, නො 47, යන ස්ථානයේ තැන්පත් කිරීමට කටයුතු කළයුතු වේ.